සැ. යු. - 2016.09.15 දින පළ වූ අංක 1985 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,986 - 2016 සැප්තැම්බර් මස 23 වැනි සිකුරාදා - 2016.09.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1626 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | 1687 |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1635 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1652 | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 1689 |


සැ. යු. - රජිත කොඩිතුවක්කු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජූනි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.*

*ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්,* 2016 ඔක්තෝබර් මස 14 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ දැන්වීම්* 2016 සැප්තැම්බර් මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## මිනිපේ ප්‍රාදේශීය සභාව

මිනිපේ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා ජල කම්කරු තනතුර සඳහා බඳවා ගැනීමට පහත සුදුසුකම් සපුරා ඇති මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. (i) ජල කම්කරු III (ප්‍රාථමික ශිල්පීය නොවන) - පුරප්පාඩු 02

| *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| ජල කම්කරු III | PL-1-2016<br>රු. 24,250 -10x250-10x270<br>10x300 - 12x330<br>රු. 36,410 (මාසික) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර සමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් - විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් හයක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එක් වරකදී සමත් වී තිබිය යුතු ය. |

(ii) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙක්ම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

02. *පොදු සුදුසුකම් :-*

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයකු විය යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට මිනිපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.

(ආ) තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය. පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඉ) පත්වීම ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

(ඊ) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

(උ) රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.

(ඌ) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.

(ii) වැන්දඹු අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.

iv. ඉහත සඳහන් තනතුරුවලට අදාළ ක්ෂෙත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පිළිවෙල :-*

(i) අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය 100* | *සමත්වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 40 | උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු |
| පළපුරුද්ද | 55 | අනුව තෝරාගනු ලැබේ. |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 05 | |
| මුළු ලකුණුවල එකතුව | 100 | |

(ii) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2016.10.21 වැනි දිනට පෙර "ලේකම්, මිනිපේ ප්‍රාදේශීය සභාව, හසලක" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(iii) අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

(iv) සභාවේ දැනටමත් සේවයේ නියුක්ත සේවකයින් සඳහා බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

05. *සහතික පිටපත් :-*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතු ය. (ඡායා පිටපත් වඩාත් සුදුසු වේ)

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ)
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක් (එකක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරි ගෙන් විය යුතු ය.)

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියළු බලතල මිනිපේ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

07. යම් අයදුම්කරුවෙකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

ඩබ්. පී. ඩී. කේ. වික්‍රමසිංහ,
ලේකම්,
මිනිපේ ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 23 වැනි දින,
හසලක,
මිනිපේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී,

ආදර්ශ අයදුම් පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**මිනිපේ ප්‍රාදේශීය සභාව**
***.........................................තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :————————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
02. ස්ථිර පදිංචි ලිපිනය :————————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
05. උපන් දිනය : වර්ෂය :————. මාසය :————. දිනය :————.
06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු:————. මාස:————. දින:————.
07. ස්ත්‍රී/ පුරුෂ භාවය :————————.
08. විවාහක / අවිවාහක බව :————————.
09. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :————————.
10. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල පිටපත් ඇමිණිය යුතුයි)

අ.පො.ස. (සා.පෙ.) විභාගය
සමත් වර්ෂය : .................. විභාග අංකය : ..................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. ........................ | ................ | 05. ........................ | ................ |
| 02. ........................ | ................ | 06. ........................ | ................ |
| 03. ........................ | ................ | 07. ........................ | ................ |
| 04. ........................ | ................ | 08. ........................ | ................ |

11. (i) වෙනත් සුදුසුකම් :————————.
(ii) වෘත්තීය සුදුසුකම් :————————.
(iii) සේවා පළපුරුද්ද :————————.

12. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර:————————.
ස්ථිර/ අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත්/ ආදේශක ද යන වග :-
එම තනතුරට පත්වූ දිනය :-

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:————————.

මෙම අයදුම්පතේ මා විසින් සඳහන් කර ඇති තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම භාර ගනු ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු / ඉල්ලුම්කාරිය වන ............................................................................. මහතා/ මිය/ මෙනවිය මෙම ආයතනයේ .................................... කු වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ ඇය සේවයෙන් නිදහස් කළ හැක/ නොහැකි. ඔහු/ ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :————————.
තනතුර :————————.
ආයතනය :————————.
දිනය :————————.

09-737

---

## පානදුර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

පානදුර ප්‍රාදේශීය සභාව තුල පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිය ඇති අයදුම්කරුවන් හා පානදුර ප්‍රාදේශීය සභාවේ කවර හෝ අභ්‍යන්තර සේවා නියුක්තියක යෙදී සිටින අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

සෞඛ්‍ය පරිපාලක (සීමිත බඳවා ගැනීම) :

1. III ශ්‍රේණිය

2014.02.25 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන වල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ පරිපාලක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය.

පුරප්පාඩු ගණන : 02

වැටුප් පරිමාණය : 27,140 - 10x300 - 11x350 - 10x495 - 10x660 - 45,540
රාජ්‍ය පරිපාලක චක්‍රලේඛ 3/2016 හි උපලේඛන අංක II අනුව ආරම්භක වැටුප් 15,924 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කඩඉම)

2. බඳවා ගැනීමේ සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම් :*

(අ) අ.පො.ස. (සා.පෙළ.) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට හා ගණිතයට සම්මාන දෙකක් සහිතව විෂයයන් 06 කින් සමාර්ථ ලබා තිබීම. (මින් විෂයයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතු ය.)

(ආ) *පළපුරුද්ද :*
පළාත් පාලන ආයතනයක PL - 1 හා PL -2 වැටුප් කේත අංක යටතේ වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා ස්ථිර සේවා කාලය වසර පහක් (05) සපුරා ඇති සේවකයින් විය යුතු අතර, සේවා කාලය ආයතන ප්‍රධානියා ලිඛිතව සනාථ කළ යුතු ය.

(ඇ) *කායික සුදුසුකම් :*
තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඈ) *වෙනත් සුදුසුකම් :*
මෙහි දැන්වීමෙහි "බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි" යටතේ දක්වා ඇති I සිට IV දක්වා සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

(ඉ) ලිඛිත හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

3. ලිඛිත පරීක්ෂණය :

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් විය යුතු ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| සමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීමේ පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

*විෂය නිර්දේශය*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| සමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | * මහජන සෞඛ්‍ය සුහසාධනය පිළිබඳ ඒ ඒ පළාත් පාලන ආයතන මඟින් පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීමේදී කසළ අපහරණය කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කිරීම, කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීම පිළිබඳ මූලික දැනුම මැන බැලීම.<br>* සුළු සේවක කටයුතු අධීක්ෂණය හා පරිපාලනය, පැමිණීම සටහන් කිරීම නිවාඩු ලබා ගැනීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන්.<br>* මැසි මදුරු උවදුර වළක්වා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |

4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමේ දී සලකා බලන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| සපුරාලිය යුතු ස්ථිර සේවා කාලයට අමතර සේවා කාලය | 15 | ලකුණු 25 |
| වැඩ බැලීම හෝ රාජකාරි ඉටුකිරීම | 10 | |
| ක්ෂේත්‍රයට අදාළව දැනුම පරීක්ෂා කිරීම | 20 | |
| පෞරුෂත්වය | 05 | |

සටහන :- ලිඛිත විභාගයෙන් ඉහළ ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක ප්‍රමාණයකට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර මෙම පරීක්ෂණ දෙකෙන්ම ඉහළ ලකුණු ලබාගන්නා අය පුරප්පාඩු සඳහා බඳවාගනු ලැබේ.

5. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසර 03ක කාලයක් අඛණ්ඩව බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිය ඇති තැනැත්තෙකු විය යුතු ය. (පානදුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.).

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක යෙදී සිටින අයට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(iv) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.

(v) ඉහත පළමු ඡේදයේ දක්වා ඇති එක් එක් තනතුරට අදාළව ඊට පහලින් දක්වා ඇති අවම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

(vi) 2013.01.01 දිනට පෙර අනුමත වී ඇති බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් ඇතැම් කරුණු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද 2013.01.01 දිනට පානදුර ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් තොරතුරු හා අංක 1859/32, 2014.04.24 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බලතල පැවරීම් උපලේඛනයෙහි සඳහන් තොරතුරු සමඟ නොගැලපෙන අවස්ථාවන්හි දී බඳවා ගැනීමේ පටිපාටිවල සඳහන් අදාළ කොන්දේසි වෙනුවට ඉහත අවස්ථා දෙකෙහි කොන්දේසි අදාළ පරිදි ආදේශ වනු ලැබේ.

(vii) අදාළ බඳවා ගැනීම් පටිපාටිවල විධිවිධාන අනුව එක් එක් තනතුරට අදාළව විධිමත් ලිඛිත පරීකෂණ/වාචික පරීක්ෂණ/ප්‍රායෝගික පරීක්ෂණ/ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ/සම්මුඛ පරීක්ෂණ වලින් එකකට හෝ කිහිපයකට හෝ සියල්ලටම අයදුම්කරුවන් යොමුකරනු ලබන අතර එහිදී ලබාගන්නා ඉහළම ලකුණු අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ. කිසියම් අයදුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු සමාන ලකුණු සංඛ්‍යාවක් ලබා ඇති විට ඒ අතරින් ගනු ලබන තැනැත්තා කවුරුන් ද යන්න පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතු ය.

(viii) කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ/ප්‍රායෝගික/ලිඛිත පරීක්ෂණවලට භාජනය කළ පමණින් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ.

6. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. රජය විසින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්ති තීරණ අනුව වෙනස්වීම්වලට යටත්වනු ලැබේ.

(ii) අදාළ පරිදි වැන්දඹු/අනත්දරු වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට දායක විය යුතු ය.

(iii) බඳවා ගනු ලබන තැනැත්තන් වසර තුනක(03ක) පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද සේවකයින් වසරක (01ක) වැඩ බැලීමේ කාලයකට යටත් කරනු ලැබේ.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතු ය.

(v) මෙයට අමතරව ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන නියමයන් සහ පානදුර ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් කලින් කල පනවනු ලබන නියමයන්ට යටත් විය යුතු ය.

7. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තේ පිළියෙල කර ඉදිරිපත් කළ යුතු ය.

(ii) අයදුම්පත සමඟ පහත සඳහන් ලියවිලිවල ඡායා පිටපත් අමුණා එවිය යුතු ය. කිසියම් අයදුම්කරුවෙකු සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන විට මුල් පිටපතක් හා ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතු ය.

(iii) අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති අය ඉල්ලුම් කිරීමෙන් වැලකී සිටිය යුතු ය.

(අ) ඔබගේ නම හා ලිපිනය ලියන ලද 9"x4" ලියුම් කවරයක්,
(ආ) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත්,
(ඇ) අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්,
(ඈ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පිටපත්,
(ඉ) පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්,
(ඊ) ජාතික හැඳුනුම්පතේ/ සහතික කරන ලද පිටපතක්,
(උ) ග්‍රාම නිලධාරි සහතිකයේ පිටපතක් (වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ හැකි),
(ඌ) අයදුම්පත් සමඟ ඉහත (අ) සිට (උ) දක්වා ලියවිලි අමුණා එවීමට කටයුතු කළ යුතු ය. එසේ නොකළහොත් අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බව ද සැලකිය යුතු වේ.

(iv) අයදුම්පත බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර 2016.10.07 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, පානදුර ප්‍රාදේශීය සභාව, වාද්දුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(v) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව හෝ අයදුම්පත් කැඳවන අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ තනතුරු ප්‍රමාණය වෙනස් කිරීම හෝ බඳවා ගන්නා ප්‍රමාණය තීරණය කිරීමේ බලය ප්‍රාදේශීය සභා ලේකම් සතු වේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන සලකා නොමැති සියළු කාරණා පිළිබඳ අවසාන තීරණය ප්‍රාදේශීය සභා ලේකම් සතු වේ.

යම් තනතුරකට තේරී පත්වීමෙන් පසු අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් සේවයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ලේකම් හා සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

**.................................................................................. තනතුර සඳහා අයදුම්පත්‍රය**

| | |
|---|---|
| සම්පූර්ණ නම | :——————————. |
| ලිපිනය | :——————————. |
| උපන් දිනය | :——————————. |
| වයස | :——————————. |
| විවාහක/අවිවාහක බව | :——————————. |
| ආගම | :——————————. |
| ජාතික හැඳුනුම්පත් අංකය | :——————————. |
| ඉගෙනුම ලැබූ පාසල | :——————————. |
| අධ්‍යාපන සුදුසුකම් | :——————————. |
| වෘත්තීය සුදුසුකම් | :——————————. |

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි ඒවා වන අතර වැරදි හෝ අසත්‍ය තොරතුරක් සැපයුවහොත් මා එම තනතුරට නුසුදුසු අයෙකු වන බව ද මෙයින් සහතික කරමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*ආයතන ප්‍රධානියාගේ නිර්දේශය*

.......................................................................... යන අය පානදුර ප්‍රාදේශීය සභාවේ ආදේශක/ ස්ථිර/ අනියම්/ තාවකාලික සේවකයෙකු වන බවත්, ඔහු/ ඇය ........................................... දින සිට මේ දක්වා ........................................................ තනතුරෙහි සේවය කරන බවට මෙයින් සහතික කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :——————.

09-837

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### මීගමුව මහා නගර සභාව

මීගමුව මහා නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත සම්පූර්ණ කර "නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව" යන ලිපිනයට 2016.10.23 දිනට පෙර මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

දැනටමත් රජයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේනතු ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

| *තනතුරු නාමය* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| රියදුරු | III | 01 | PL -3-2016 (රු.25,790-10x270-10x300-10x330 -12x350-රු. 38,990) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම. (එක් වරක දී විෂයයන් පහක් (05) අවම වශයෙන් සමත්ව තිබිය යුතු ය.) |
| කාර්යාල සේවක සේවය (මුරකරු) | III | 02 | PL -1-2016 (රු.24,250-10x250-10x270-10x300 -12x330- රු. 36,410) | අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06) ක් සමත් වී තිබිම. (මින් විෂයයන් (05) ක් එකවර සමත් විය යුතු ය.) |

රියදුරු තනතුරු සඳහා සම්පූර්ණ කර තිබිය යුතු වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද හා කායික සුදුසුකම් :

*වෘත්තීය සුදුසුකම් :-*

1. පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර තුනක (03) ට පෙර අවම වශයෙන් 'සී' සහ 'සී 1' වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව 'බී' පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතු ය.)

2. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

*පළපුරුද්ද :-*

බලපත්‍රය ලැබීමෙන් පසු රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබිය යුතු ය.
(පළපුරුද්ද විධිමත් සහතිකයක් මගින් සනාථ කළ යුතු යි.)

*කායික සුදුසුකම් :-*

අවම උස අඩි පහක් (5') විය යුතු ය.

දිවාකාලයේ හා රාත්‍රීකාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් මගින් ඒ බැව් සනාථ කළ යුතු ය.

*මුරකරු තනතුර සඳහා සම්පූර්ණ කර තිබිය යුතු කායික සුදුසුකම් :-*

තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**සියළුම තනතුරු සඳහා :**

*වෙනත් සුදුසුකම් :-*

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු යි.
- අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතු යි.
- අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කල යුතු අවසාන දිනට අවම වශයෙන් වසර 03 ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතු ය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට, එම සුදුසුකම් සෑම ආකාරකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

*වයස :-* අවම සීමාව - අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු යි.
උපරිම සීමාව - අවුරුදු 45 ට නොවැඩි විය යුතු යි.

(රියදුරු තනතුර සඳහා දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභින් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

*තනතුරෙහි ස්වාභවය :-* ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත ය.

- පත්වීම ලබා වසර 5ක් ඉක්මවීමට පෙර අංක 01/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව අදාළ භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.
- වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු යි.

*බඳවා ගැනීමේ ක්‍රමය :-*

01. ***රියදුරු*** - වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් සමත් වන අයදුම්කරුවන් පුරප්පාඩු අනුව බඳවාගනු ලැබේ.

*වෘත්තීය පරීක්ෂණය :-*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. රිය පැදවීමේ නිපුණත්වය | 40 | 20 |
| 2. මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| 3. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

ඉහත වෘත්තීය පරීක්ෂණය පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන විධායක/මාණ්ඩලික නිලධාරියෙකු. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු මගින් පවත්වනු ලැබේ.

*සාමාන්‍ය පරීක්ෂණය :*

බඳවා ගැනීමේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ ඉහත පරීක්ෂණය අදාළ පත්වීම් බලධරයා විසින් පත්කරන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පැවැත්වේ.

02. ***මුරකරු*** - සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය - මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂනයේ දී සිදු කරනු ලැබේ. පවත්නා පුරප්පාඩු සඳහා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ අනුව පත්වීම් කරනු ලබයි.

*බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි:-*

තෝරාගනු ලබන්නන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද ආයතන ප්‍රධානින් විසින් නිකුත් කරනු ලබන නියෝග වලටද අනුව කටයුතු කළ යුතු යි.

*බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ:-*

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

නාගරික කොමසාරිස්,  
මීගමුව.

**රියදුරු/ මුරකරු තනතුරු සඳහා අයදුම් පත්‍රය**  
**මීගමුව මහා නගර සභාව**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1. මුලකුරු සමග නම :——————.
2. සම්පූර්ණ නම :——————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :——————. දුරකථන අංක :——————.
4. ඉල්ලුම් කරන තනතුර :——————.
5. ස්ථිර පදිංචි ලිපිනය :——————.
6. තැපැල් ලිපිනය :——————.
7. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————.
8. ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :——————.
9. ස්ථිර පදිංචිය දරන පළාත් පාලන ආයතන බල ප්‍රදේශය :——————.
10. උපන් දිනය :——————.
11. 2016.10.23 දිනට වයස :——————.
12. අධ්‍යාපන සුදුසුකම් :——————. (ඡායා පිටපත් ඇමිණිය යුතුයි)
13. පළපුරුද්ද :——————.(රියදුරු තනතුර සඳහා ඡායා පිටපත් ඇමිණිය යුතුයි)
14. වෘත්තීය සුදුසුකම් :——————.(රියදුරු තනතුර සඳහා ඡායා පිටපත් ඇමිණිය යුතුයි)
15. වෙනත් සුදුසුකම් :——————.
16. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරු කර තිබේ ද යන වග :-

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ විශ්වාසයේ හා දැනීමේ හැටියට නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. යම් තොරතුරක් සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට, බඳවා ගැනීමෙන් පසුව හෙළිදරව් වුවහොත් සේවයෙන් පහකිරීමටත්, යටත්වන බව හොඳාකාරවම දනිමි.

...............  
අයදුම්කරුගේ අත්සන.

දිනය :-

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .................................... මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...................................... වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයකින් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කරමි/ නොකරමි.

...............  
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :-  
තනතුර :-  
දිනය :-

09-767

# පළාත් පාලන නිවේදන

## හෝමාගම ප්‍රදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ ජූලි මස 21 වැනි දින අංක 5114 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**තීරණ අංක 5114**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 දින දරන අති *විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1976/21 හා 2016 ජූලි 20 දිනැති *ගැසට් පත්‍රයේ* හා 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947/6 දරන *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධි විධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 දින සිට අදළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ තීරණය කරමි.

තව ද මෙම තීරණය ගනු ලබන මෙදින වන විට හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වන පහත උපලේඛනගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා, එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 දිනෙන් පසුවට හෝමාගම ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවට ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණ අංක 5114 යටතේ 2016.07.28 දින මවිසින් තීරණය කරමි.

*උපලේඛනය*

(අ) ලැගුම් නිවාස අතුරු ව්‍යවස්ථාව.
(ආ) හෝටල් අතුරු ව්‍යවස්ථාව.
(ඇ) බත් කඩ/ආපනශාලා හෝ තේ හෝ කෝපි කඩ අතුරු ව්‍යවස්ථාව.
(ඈ) මාළු විකිණීම අතුරු ව්‍යවස්ථාව.
(ඉ) මස් විකිණීම අතුරු ව්‍යවස්ථාව.
(ඊ) අප්‍රසන්න හා අන්තරායදායක වෙළදාම් අතුරු ව්‍යස්ථාව.
(උ) සංචාරක වෙළෙදාම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව.
(ඌ) ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසර අතුරු ව්‍යවස්ථාව.
(එ) බේකරි අතුරු ව්‍යවස්ථාව.

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
හෝමාගම ප්‍රාදේශීය සභාව.

2016 ජූලි මස 21 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය සභාව,
හෝමාගම ප්‍රධාන කාර්යාලය.

09-777

---

## හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

### දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට අක්කර බදු/වරිපනම් බදු කාර්යයන් සඳහා දේපළ සතොක්ෂණය කිරීමට අවශ්‍ය වාර වාර්තා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව විසින් 2016 ක් වූ අගෝස්තු මස 10 වන දින තීරණ අංක 566 යටතේ හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සෑම දේපළකටම අදාළව වාර වාර්තා ලබා ගැනීම කළ යුතු යැයි තීරණය කර ඇත.

ඒ අනුව සභාව විසින් ඔබ වෙත ලබා දෙනු ලබන ආකෘති පත්‍රය හා අනෙකුත් ලිපි ලේඛන පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර 2016.10.14 දින දහවල් 12.00ට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, හල්දුම්මුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දෙන ලෙස ඔබට මෙයින් දන්වමි.

කේ. එම්. ජී. ඩබ්ලිව්. වසන්තිමාලා,
ලේකම්,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව.

දුරකතන අංකය : 057 20 500 32
ෆැක්ස් අංක : 057 20 500 33

09-838

## හපුතලේ ප්‍රාදේශීය සභාව

### දේපළවල වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමට/ අක්කර බදු/වරිපනම් බදු කාර්යයන් සඳහා දේපළ සත්‍යාක්ෂණය කිරීමට අවශ්‍ය වාර වාර්තා කැඳවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල යටතේ හපුතලේ ප්‍රාදේශීය සභාව විසින් 2016 ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින තීරණ අංක 221 යටතේ හපුතලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම දේපළකටම අදාලව වාර වාර්තා ලබා ගැනීම කළ යුතු යැයි තීරණය කර ඇත.

02. ඒ අනුව සභාව විසින් ඔබ වෙත ලබා දෙනු ලබන ආකෘති පත්‍රය හා අනෙකුත් ලිපි ලේඛන පිටපත් දෙකකින් යුක්තව සම්පූර්ණ කර 2016.10.20 දින දහවල් 12.00ට පෙර ලේකම්, හපුතලේ ප්‍රාදේශීය සභාව, දියතලාව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාර දෙන ලෙස ඔබට මෙයින් දන්වමි.

වයි. එම්. යූ. බී. යාපා,
ලේකම්,
හපුතලේ ප්‍රාදේශීය සභාව.

දුරකථන අංකය : 057-2229075
ෆැක්ස් අංකය : 057 - 2229075

09-970

## මඩුල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. ඩී. එම්. අබේසේකර,
ලේකම්,
මඩුල්ල ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 10 වැනි දින,

### තීරණය

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, මඩුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන නියම කළ යුතු ය යි, එකී පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි."

09-971

## කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව

261 අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවැරී ඇති බලතල ප්‍රකාර කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභාව විසින් 2016.08.23 වැනි දින පහත සඳහන් තීරණ ගන්නා ලද බව මහජනයා වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ජේ.ඒ.එස්.උදයසිරි,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
කහටගස්දිගිලිය.

2016 අගෝස්තු මස 23 වැනි දින,
කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණ

"පළාත් පාලන අමාත්‍යවරයා විසින් සාදන ලද 1992 අංක 08 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථාව පනතේ දෙවන (2) වගන්තිය යටතේ 1988 අංක 22 දිනැති අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ හා උතුරු මැද පළාත් සභාවේ යෝජනාවකින් අනුමත කළ බවට 1992.02.28 වැනි දින අංක 704 දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයකින් පළ කරන ලද්දා වූ ද, පළාත් පාලන ආයතන (අතුරු සම්මත ව්‍යවස්ථා ) හා අතුරු ව්‍යවස්ථාවල 1 කොටසේ හා 1 සිට 42 දක්වා වූ කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට කහටගස්දිගිලිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පැවැත්විය යුතු අතුරු සම්මත ව්‍යවස්ථාව බවට 1987 අංක 15 දරන පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු පනතේ 122 වැනි වගන්තිය හා 126 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කහටගස්දිගිලිය බල ප්‍රදේශය සඳහා අතුරු සම්මත ව්‍යවස්ථා වැළඳව තීරණ අංක 350 යටතේ තීරණය කරමි.

09-780

## නාගොඩ ප්‍රාදේශීය සභාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධි විධාන) පනතේ 2 වන වගන්තියේ (i) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (i) වන උප වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද්ද වූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක 1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්ද වූ ද සම්මත අතුරු ව්‍යවස්ථා වල

(i) සියළු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදල අර්ථ නිරූපනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

(ii) සියළු සම්මත අතුරු ව්‍යවස්ථා වලටම අදල පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යස්ථාව,

(iii) කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධව දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

(xix) සංචාරක වෙළෙඳුන් විසින් ආහාර පාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීමේ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

(xxii) වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

(xxiii) මාර්ගවලට අලාභහානි කිරීම හා මාර්ගවල ගමනාගමනයට බාධා කිරීම වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

(xxvi) ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

(xxvii) ප්‍රජා ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

(xxx) වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව,

පිළිබඳ යෝජනාව 2016.06.30 දින නාගොඩ ප්‍රාදේශීය සභා තීරණ පොතේ තීරණ අංක 02 යටතේ වැළඳගෙන ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම්. එච්. ෆර්සියා ෆර්වින්,<br>ලේකම්,<br>නාගොඩ ප්‍රාදේශීය සභාව.

09-773

---

## කෑගල්ල නගර සභාව

### 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනත

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් තැනැත්තා විසින්, එහි නම ඉදිරියෙන් දක්වෙන සමාජ ශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 2017 වර්ෂයට බලපත්‍රයක් ලබා ගැනීමට මා වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කොට ඇති බව 1975 අංක 17 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ පනතේ 06 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජ ශාලාව පවත්වාගෙන යාම සඳහා යම් පාර්ශවයක්, යම් ආයතනයක් විසින් එම සමාජ ශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට සති හතරක් (04) ඇතුළත තම විරෝධතාවයට හේතුව ලියවිල්ලකින් දන්වමින්, පිටපත් දෙකකින් යුක්තව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

ආර්. ජී. එස්. නිරෝෂන්,<br>ලේකම්,<br>කෑගල්ල නගර සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,<br>කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | සමාජ ශාලාවේ සභාපති/ලේකම් | සමාජ ශාලාවේ නම | සමාජ ශාලාවේ නව කටයුතු කරගෙන යාමට බලය පවත්වන ස්ථානය |
|---|---|---|---|
| විදාන හේනයලාගේ සිරිල් 167/28, ඔලගම, කෑගල්ල | සභාපති | බ්ලූ ලයිට් ට්‍රේඩර්ස් ඇන්ඩ් රෙස්ටුරන්ට් | අංක 152, කළුගල්ල මාවත, කෑගල්ල |

09-774

---

## රිදීගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 1871 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.


2016 අගෝස්තු මස 31 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**සියඹලාඇල්ල ප්‍රධාන මාර්ගයේ සිට සියඹලාඇල්ල ගම දක්වා දිවෙන අතුරු මාර්ගය**

| මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණු පස ඉඩම් හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරි වසම සහ අංකය | මාර්ගයේ දිග (අඩි) | මාර්ගයේ පළල (අඩි) |
|---|---|---|---|---|---|---|---|
| සියඹලාඇල්ල ප්‍රධාන මාර්ගයේ සිට ඒ. ජී. විමලසේන මහතාගේ නිවස දක්වා මාර්ගය | පී. ජී හරමානිස් මයා | ඒ. ජී. විමලසේන මයා | 1. පී. ජී. හරමානිස් මයා<br>2. පී. ජී. ප්‍රියන්ත මයා<br>3. බී. ඩී. වසන්ත මයා<br>4. බී. ඩී. නිමල් මයා<br>5. කේ. ඩී. රංජි මයා<br>6. කේ. ජී. බන්දුල මයා<br>7. ජී. ජී. මුනිදාස මයා<br>8. සුසන්ත සේනාරත්න මයා<br>9. ආර්. ඩී. ගුණලතා මිය<br>10. ජී. ජී. සෝමදාස මයා<br>11. ඒ. ඒ. නිමල් මයා<br>12. ඒ. ජී. පියසේන මයා | 1. ඩී. එම්. ජී. ධර්මසේන මයා<br>2. ඒ. ජී. සෝමදේව මයා<br>3. කේ. ඩී. ආරියවතී මිය<br>4. කේ. ජී. සරදියා මයා<br>5. කේ. ජී. ගයනි මිය<br>6. බී. ජී. ජිනදාස මයා<br>7. ඒ. ජී. විමලසේන මයා | 568 පල්ලෙ කන්ද | කි. මී. 1 | අඩි 10 |

ජී.එම්.ජේ.බණ්ඩාර
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
කැප්පිටිගල පාර
පිදීණුම
දුරකථන :- කාර්යාලය 037 2251494

පිඹුරු අංකය : 1871



පරිමාණය 1 : 2000

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ [illegible]

[illegible]

[illegible]

පිඹුර

| කැබලි අංකය | බිම් ප්‍රමාණය | | | | විස්තරය |
|---|---|---|---|---|---|
| | හෙක්ටයාර | අක්කර | රූඩ් | පර්චස් | |
| 1 | 0.0966 | 0 | 0 | 38.2 | මාර්ගය |

මැනීම ඉහත සඳහන් පරිදි වේ

බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.0966

මැනීම/සොයාගත් දිනය 2016 . 05 . 10

දිනය 2016 . 06 . 25

බලයලත් මිනින්දෝරු
ජී.එම්.ජේ. බණ්ඩාර
ලියාපදිංචි බලයලත් මිනින්දෝරු
කැප්පිටිගල පාර,
පිදීණුම.
037-2251494/ 072-3441522

09-840

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන (අනුෂාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් සබරගමු පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ලද අංක CLG 5/4/K/1 හා 2015.04.15, CLG 5/4/K/B/7/1 හා 2016.08.01 , 5/4/K/B/78/1 හා 2016.08.01 දිනැති ලිපි අනුව පහත උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03 ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළයුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. ඒ. එස්. එම්. වික්‍රමසූරිය,
ලේකම්,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.


01. පාරේ නම - පරගම්මන උඩපාරේ සිට වල්දෙණිය පන්සල දක්වා මාර්ගය
වසම - 53 සී වල්දෙණිය
දිග - මීටර් 104
පළල - මීටර් 2.90

| පාරේ වම් පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 01. යූ. සෙනෙවිරත්න | බෙරවාදෙණියහේන | 01. ජී. වනිගසේකර | බෙරවාදෙණියහේන |
| 02. ජී. ඒ. එන්. ගනේආරච්චි | බෙරවාදෙණියහේන | 02. වල්දෙණිය පන්සල | |
| 03. ඩී. පී. ඩබ්. මල්කාන්ති | බෙරවාදෙණියහේන | | |
| 04. ජී. ඒ. එල්.සමරරත්න | බෙරවාදෙණියහේන | | |
| 05. ඩී. පී. ආර්. විජේතිලක | බෙරවාදෙණියහේන | | |
| 06. ඊ. ආර්. පී. ප්‍රියන්ත | බෙරවාදෙණියහේන | | |

01 [illegible]


F.M.I.J.B.Ranatunga (M.S.I)
Registered Licensed Surveyor & Leveller
No: F 21/2, Marapana, Kegalle
T.P. No: 0352222379, 0718141955


PLAN NO: 218




Reference

| | |
|---|---|
| B | Bank |
| LF | Live Fence |
| EP | Electric Post |
| BP | Boundary Post |
| RW | Retaining Wall |
| WF | Wire Fence |
| Road(PS) | Road (Pradesiya Saba) |

සභාපති
කෑගල්ල ප්‍රාදේශීය සභාව

Scale 1:1000

PLAN

— of —

One(01) an allotment of Road

situated in the

Village of Waldeniya at 596, Waldeniya GN Division in Kegalle Divisional Secretaries Division within Pradesiya Saba Limit of Kegalle (Mawatha Pallu of Paranakuru Korale)

Kegalle District

SABARAGAMUWA PROVINCE

| LOT | EXTENT | | | | SCHEDULE OF BOUNDARIES | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Ha. | A | R | P | NORTH | EAST | SOUTH | WEST | REMARKS |
| 1 | 0.0212 | 0 | 0 | 8.4 | Shown as in Plan | | | | |
| Total | 0.0212 | 0 | 0 | 8.4 | | | | | |

NOTE: Minimum Width of this Road 2.90m and Lenth of Road 104m


Surveyed on : 26th April 2012

(Boundaries are pointed out by G.A.N.Ganearachchi & others)

M. I. J. B. Ranatunga (M.S.I)
Registered Licensed Surveyor
& Leveller
No. F 21/2
Marapana, Kegalle.
Reg No 20081756

| | | |
|---|---|---|
| 02. පාරේ නම | - | කුරුඹාපිටිය ප්‍රජාශාලාව අසල සිට බෝගහමුලහේන දක්වා මාර්ගය |
| වසම | - | හිග්ගොඩ |
| දිග | - | අඩි 429 |
| පළල | - | අඩි 08 |

| පාරේ වම් පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 01. එම්. කේ. සමරසිංහ | ජයසිංහගේ වත්ත | 01. එම්. කේ. නවරත්න කුමාර | ජයසිංහගේ වත්ත |
| 02. එම්. කේ. කරුණාරත්න | ජයසිංහගේ වත්ත | 02. එම්. කේ. සුනිල් විජේරත්න | ජයසිංහගේ වත්ත |
| 03. වි. අල්ලිසා | ගලඋඩහේනවත්ත | | |




03. පාරේ නම - හෙට්ටිමුල්ල පුරන්කුඹුර හරහා අඹවලවත්ත මාර්ගය
වසම - 49 හෙට්ටිමුල්ල
දිග - මීටර් 216.83
පළල - අඩි 12

පාරේ වම් පස

| | | |
|---|---|---|
| 01. | පී. සී. වීරසිංහ | කැබලි අංක 6 |
| 02. | ජේ. ඒ. යූ. ජේ. අඹවල | කැබලි අංක 2 |
| 03. | එම්. බී. ආර්. පී. වික්‍රමසිංහ | කැබලි අංක 2 |
| 04. | ටී. කේ. ඩී. හතුරුසිංහ | කැබලි අංක 10 |
| 05. | එම්. යමුනාරාණි | කැබලි අංක 1 |
| 06. | එල්. පී. එම්. ලංකාතිලක | කැබලි අංක 2 |
| 07. | එස්. අයි. කේ. සමරසිංහ | කැබලි අංක 3 |


පාරේ දකුණු පස

| | | |
|---|---|---|
| 01. | ඒ. පී. වික්‍රමසිංහ | කැබලි අංක 11 |
| 02. | ඒ. පී. වික්‍රමසිංහ | කැබලි අංක 04 |
| 03. | ජී. ඩී. ප්‍රියනන්දනී | කැබලි අංක 05 |
| 04. | එච්. ජී. ජී. ශාන්ත | කැබලි අංක 06 |
| 05. | ටී. කේ. ඩී. හතුරුසිංහ | කැබලි අංක 08 |
| 06. | එස්. අයි. කේ. සමරසිංහ | කැබලි අංක 2 |
| 07. | ඩබ්. එම්. එස්. කේ. විජේසුන්දර | කැබලි අංක 3 |
| 08. | එම්. බී. ආර්. පී. වික්‍රමසිංහ | කැබලි අංක 4 |
| 09. | එම්. බී. ආර්. වික්‍රමසිංහ | කැබලි අංක 4 |
| 10. | එම්. ඒ. එන්. සුරංග | පන්සලවත්ත |




| | | | |
|---|---|---|---|
| 04. | පාරේ නම | - | උඩකරඩුපන ලෝලුගහවත්ත උඩමුල්ල මාර්ගය |
| | වසම | - | උඩකරඩුපන |
| | දිග | - | අඩි 544 |
| | පළල | - | අඩි 08 |

| පාරේ වම් පස | | | පාරේ දකුණු පස | | |
|---|---|---|---|---|---|
| 01. | ආර්. එම්. වික්‍රමපාල | ලෝලුගහමඩවත්ත | 01. | කේ. ඩේවිඩ් පෙරේරා | මැදිකැලේවත්ත |
| 02. | ආර්. එම්. බංඩාර රත්නායක | ලෝලුගහමඩවත්ත | 02. | ඩී. පී. එස්. පුෂ්පකුමාර | ලෝලුගහමඩවත්ත |
| 03. | ගයන්ත ඉන්දික සමරනායක | ලෝලුගහමඩවත්ත | | | |




05. පාරේ නම - කලුගල්ල මුරුකහේන මාර්ගය
වසම - කලුගල්ල
දිග - අඩි 365.5
පළල - දුර මීටර් 0-262 දක්වා පළල අඩි 12
දුර මීටර් 262-365.5 දක්වා පළල අඩි 8

| පාරේ වම් පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 01. වයි. එම්. පී. එම්. යාපා බණ්ඩාර | ඒදණ්ඩමුලතැන්නේහේන | 01. අයි. ආර්. එල්. බී. ජයතිලක | පොල්කටුගොල්ලවත්ත |
| 02. එම්. ජේ. මුතුබංඩා | | 02. ඊ. ආර්. රංජිත් පෙරේරා | පොල්කටුගොල්ලවත්ත |
| 03. එම්. පී. එම්. කරුණාරත්න | ඒදණ්ඩමුලතැන්නේහේන | 03. ඩී. එම්. කුසුමලතා | නිලපංගුවේ හේන |
| 04. ජී. ඩබ්. ඩබ්. එම්. සනත් අබේරත්න බංඩාර | ඒදණ්ඩමුලතැන්නේහේන | 04. එම්. පී. එම්. කරුණාරත්න | ඒදණ්ඩමුලතැන්නේහේන |



06. පාරේ නම - පන්දෙනිය තිබ්බුටුමුණුව මාර්ගය
වසම - බුළුරුප්ප
දිග - අඩි 512
පළල - අඩි 8 - 10

| පාරේ වම් පස | පාරේ දකුණු පස |
|---|---|
| 01. නාරංගහමුලවත්ත | 01. බෝමළුව වත්ත |
| 02. එච්. කුලතුංග බෝමළුව වත්ත | 02. අරඹේවත්ත කාන්ති |
| | 03. නාරංගහමලවත්ත සමරනායක |




09-835

## රිදීගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 7000 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොදා ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.


03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. ඒ. අජිත්. කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.

2016 අගෝස්තු මස 31 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ලිහිණිවැහැර ජනපදයේ අතුරු මාවත

| මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම්හිමියන්ගේ නම් | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම්හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරි වසම සහ අංකය | මාර්ගයේ දිග අඩි | මාර්ගයේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| ලිහිණිවැහැර ජනපදයේ අතුරු මාර්ගය | එල්. එච්. ඒ. රංජිත් සමරකෝන් මහතා හිමිකම් කියන ඉඩමෙන් | ඒ. ජී. ඒ. සුගත් සුසන්ත මයා හිමිකම් කියන ඉඩමෙන් | 1 එල්. එච්. ඒ රංජිත් සමරකෝන් මයා<br>2. එල්. එච්. ඒ. රත්නාවතී මැණිකේ<br>3. ඒ. ජී. ඒ. සුගත් සුසන්ත මයා | 1. එම්. ඒ. ප්‍රේමලාල් ඥාණරත්න මයා<br>2. කේ. එම්. ඩිංගිරි මැණිකේ මිය<br>3. ඒ. ජී. ඒ. ජිනාදරී සඳමාලි<br>4. ඒ. ජී. ඒ. සුගත් සුසන්ත | 554 නුවරයාය | අඩි 600 | අඩි 20 |




09-841

## රිදීගම ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය සභාව විසින් පහතින් සඳහන් කරන පිඹුරු අංක 6989 යටතේ සඳහන් කොට ඇති මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදාල ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් යම් විරෝධතාවයක් පළ කරනු ලබන්නේ නම් මේ නිවේදනය පළ වූ දින සිට මසක් ඇතුළත තමාගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුණහොත් පහත සඳහන් මංමාවත රිදීගම ප්‍රාදේශීය සභාව සතු මංමාවතක් වශයෙන් පිළිගෙන පාලනය කරන බව පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ජේ. ඒ. අජිත් කුමාරසිංහ,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
රිදීගම.


2016 අගෝස්තු මස 31 වැනි දින,
රිදීගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### ගනේගොඩ ගල්ළිඳ දෙවට මාර්ගය

| මාර්ගයේ නම | මාර්ගයේ ආරම්භය | අවසානය | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා වම්පස ඉඩම් හිමියන්ගේ නම් | මාර්ගයේ ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් | ග්‍රාම නිලධාරී වසම සහ අංකය | මාර්ගයේ දිග අඩි | මාර්ගයේ පළල අඩි |
|---|---|---|---|---|---|---|---|
| ගනේගොඩ ගල්ළිඳ දෙවට මාර්ගය | ගනේගොඩ හංදියේ සිට දොඩම්තලාව දක්වා දිවෙන ප්‍රාදේශීය සභා මාර්ගයේ එම්. එච්.එස්.අහමඩ් මහතාගේ ඉඩම අසලින් | එස්. බී. උක්කුබංඩා මහතා හිමිකම් කියන ඉඩමෙන් | 1. නෝනාවත්ත ජස්ටින් සිසිරකුමාර මහතා<br>2. ගනේගොඩ සමිති ශාලාව<br>3. එස්. කේ. එම්. ලලිත් කරුණාරත්න මහතා<br>4. එස්. කේ. එම්. ඩඩ්ලි කරුණාරත්න මහතා<br>5. එස්. කේ. එම්. අනුර කරුණාරත්න මහතා<br>6. එස්. කේ. එම්. ලලිත් කරුණාරත්න මහතා<br>7. ආර්. ඒ. එන්. එම්. සුමනා නවරත්න මිය | 1. එම්. එච්. එස්. අහමඩ් මහතා<br>2. එස්. කේ. එම්. විජේරත්න මහතා<br>3. ඩී. එම්. නන්දන මැණිකේ මිය<br>4. එස්. කේ. එම්. ඩඩ්ලි කරුණාරත්න මහතා<br>5. ඒ. කේ. ජී. ධර්මරත්න මහතා<br>6. එස්. බී. උක්කු බංඩා මහතා | 587 ගනේ-ගොඩ | අඩි 1141 | අඩි 10 |

W.A Gunathilaka
Registered Licensed Surveyor & Leveller
Kurunegala Road
Rideegama
T.P. :- 037 - 2236464
072 - 6252880

Plan No.- 6989



Reference

Scale Of 1 : 2000

PLAN

of

An allotment of Land Called Gallinda Watta Road Situated at Ganegoda Village in Madure Korale of Weuda Willi Hatpattu in

KURUNEGALA DISTRICT
NORTH WESTERN PROVINCE

Boundaries surveyed as pointed out by the owners

| Lot No | Extent | | | |
|---|---|---|---|---|
| | Hectares | A | R | P |
| 1 | 0.1062 | 0 | 1 | 02.0 |

Length :- 1141 Ft
Wide :- 10 Ft

W.A.Gunathilake (M.S.I)
Registered Licensed Surveyor
Reg.No-19880614
Kurunegala Road
Rideegama.

Surveyed on 26th of June 2016

## අතුරලිය ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)(ආ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වගන්තිය ප්‍රකාරව දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි දක්වා ඇති උපලේඛනයේ සඳහන් මංමාවත් අතුරලිය ප්‍රාදේශීය සභාව වෙත පොදු ප්‍රයෝජනය සඳහා සන්තකයට ගැනීමට 2015.02.24 දින දරන සභා සම්මුතිය අනුව සහ 2016.08.22 දින තීරණ අංක 1670 යටතේ තීරණය කර ඇත.

එසේම 24(2) වගන්තිය අනුව මෙසේ පළකරනු ලබන යම් මාර්ගයක් ලකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම්පාන යම් පාර්ශවයක් ඇත්තේ ද සහ අදාළ මාර්ගයට විරෝධතාවයක් පළ කරනු ලබන්නේ ද එම ඉඩමට තමන්ගේ ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 30 ක් තුළ තමන්ගේ විරෝධතාව සාක්ෂි ඇතිව ලිඛිතව ප්‍රාදේශීය සභාව වෙත දැනුම් දීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.


එකී කාලසීමාව තුළ දැනුම් දීම් ප්‍රකාරව ක්‍රියා නොකරන්නේ නම් විරෝධතා නොකරන ලද සේ සලකා මෙම ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙකී උපලේඛනයේ සඳහන් මාර්ග අතුරලිය ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව මෙයින් දන්වමි.

කේ. පී. පේමවතී,<br>
ලේකම්,<br>
අතුරලිය ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 22 වැනි දින,<br>
තිබ්බොටුවාව,<br>
අතුරලිය ප්‍රාදේශීය සභාවේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *ග්‍රාමසේවා වසම* | *පාරේ නම* | *ආරම්භය* | *අවසානය* | *දෙපස ඉඩම් හිමියන් - වම්පස* | *දෙපස ඉඩම් හිමියන් - දකුණුපස* | *පාරේ පළල මීටර්* | *පාරේ දිග මීටර්* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | විල්පිට නැගෙනහිර 11 | බෙලිගහඕවිට කරහින්නවත්ත මාර්ගය | අකුරැස්ස කඹුරුපිටිය මාර්ගයේ 4 කණුව | පල්ලෙ වත්ත ඉඩම | 1. චන්ද්‍රලතා ආසලගේ වගා කරන කුඹුර<br>2. කරහින්න වත්ත ඉඩම | 1. චන්ද්‍රලතා ආසලගේ වගා කරන කුඹුර<br>2. ඩබ්. ජී. අමරපාල වගා කරන කුඹුර<br>3. කරහින්න වත්ත ඉඩම | 1.2 | 216 |




09-880

# අතුරු ව්‍යවස්ථා

## පොල්පිතිගම ප්‍රාදේශීය සභාව

පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව)

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 3 වැනි වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වෙනි වගන්තියේ (03) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ලේකම් රත්නායක මුදියන්සේලාගේ තිලක් කුමාර රත්නායක වන මම ප්‍රාදේශීය සභාවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 2016.02.12 දිනැති අංක 728 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බවට මෙයින් නිවේදනය කරමි.

ආර්. එම්. ටී. කේ. රත්නායක,<br>
ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය<br>
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,<br>
ප්‍රාදේශීය සභාව.<br>
පොල්පිතිගම.

2016 පෙබරවාරි මස 17 වැනි දින,<br>
පොල්පිතිගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 02 වන වගන්තියේ 1 වැනි උපවගන්තියේ (අ) නිවේදනය යටතේ තීරණය විය යුතු 261 වෙනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වන වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2015.09.25 දින අංක 1933/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (අතිවිශෙෂ) *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ප්‍රාදේශීය සභා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) වැනි උපවගන්තිය විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

***ප්‍රාදේශීය සභා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

01. මෙම අතුරු ව්‍යවස්ථාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව ලෙස සඳහන් කරනු ලැබේ.

02. ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රසිද්ධ ස්ථානයන්හි, පෞද්ගලික පරිශ්‍රයන්හි, වීථිවල, මංමාවත්වල ජනනය වන ඝණ අපද්‍රව්‍ය වෙන් කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, ගබඩා කිරීම, මාරු කරන ස්ථාන ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, සැකසීම, පිරියම් කිරීම හා බැහැර කිරීම සම්බන්ධයෙන් වන නියාමනය, අධීක්ෂණය, පරීක්ෂාව හා පාලනය සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

03. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි යම් පරිශ්‍රයක සෑම හිමිකරුවෙකුම තම පරිශ්‍රය අපද්‍රව්‍යවලින් තොර සෞඛ්‍ය සම්පන්න හා ප්‍රසන්න තත්වයෙන් තබා ගත යුත්තේ ය.

04. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි යම් පරිශ්‍රයක හිමිකරු හෝ පදිංචිකරු තම පරිශ්‍රය ඇතුළත ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීම, වෙන් කිරීම, ගබඩා කිරීම හා බැහැර කිරීම කළ යුත්තේ ය. නැතිනම් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කළ යුත්තේ ය.

05. (i) පරිශ්‍රයක සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම තම පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ ඝණ අපද්‍රව්‍ය අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයක් භාවිතා කරමින් හෝ දෛනිකව නැතිනම් ඊට වඩා අඩු කාලාන්තරයෙන් එක්රැස් කළ යුත්තේ ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාව පූර්වගාමී උපවගන්තිය අනුව එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය අංක 8 සිට 20 දක්වා වන වගන්තිවල විධිවිධානවලට අනුකූලව වෙන් කළ යුත්තේ ය. නැතිනම් එසේ කිරීමට සැලැස්විය යුත්තේ ය.

(iii) හිමිකරු හෝ පදිංචිකරු විසින් අපද්‍රව්‍ය ගබඩා කිරීම හෝ මුදා හැරීම සඳහා භාවිතා කරනු ලබන යම් මල්ලක්, උරයක්, විශාල බඳුනක් හෝ වෙනත් බහාලුමක් මෙම අතුරු ව්‍යවස්ථාවේ වගන්තිවල වන කාර්යයන් සඳහා මනා තත්වයෙන් පවත්වා ගත යුතු වේ.

(iv) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 5(I) උපවගන්තියට අනුකූලව එක්රැස්වන කසල භාර ගැනීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් පූර්ව දැනුම් දීමකින් නිශ්චිත සේවාවක් පවත්වාගෙන යා යුතු අතර එකී (1) වන උපවගන්තියේම සඳහන් ආකාරයට එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සභාව විසින් කලින් කලට තීරණය කර ප්‍රසිද්ධ කරනු ලැබූ සභා බල ප්‍රදේශ තුළ ක්‍රියාත්මක වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමයට හා කාලසටහනට අනුකූලව හිමිකරු හෝ පදිංචිකරු විසින් භාර දිය යුත්තේ ය.

(v) හිමිකරු හෝ පදිංචිකරු නිවැසියන්ගේ, අමුත්තන්ගේ හෝ අසල්වැසියන්ගේ සෞඛ්‍යයට හෝ එම ප්‍රදේශයේ සනීපාරක්ෂක තත්වයට හානිකර හෝ අන්තරාකාරී වන අන්දමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ගබඩා කිරීම හෝ බැහැර කිරීම නොකළ යුත්තේ ය.

06. (i) කිසිම තැනැත්තෙක් වීථියකට, පාරකට, මංමාවතකට, පටු මාවතකට, මාවතකට හෝ වෙනත් පොදු ස්ථානයකට හෝ පරිශ්‍රයකට හෝ කාණුවකට හෝ ජල මාර්ගයකට, රක්ෂිතයකට හෝ ජලාශයකට, කළපුවකට, ජල මූලාශ්‍රයකට හෝ මුහුදට අපද්‍රව්‍ය මුදාහැරීම නොකළ යුත්තේ ය.

(ii) කිසියම් තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ විවෘත භූමියක පරිසරයට හානිකරවන අන්දමින් අපද්‍රව්‍ය පිළිස්සීම නොකළ යුත්තේ ය.

(iii) යම් හිමිකරුවෙක් හෝ පදිංචිකරුවෙක් අංක 7 දරන වගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් අපද්‍රව්‍ය වර්ගයක් මුදාහැරීම, පිරියම් කිරීම, සැකසීම හෝ බැහැරලීම සඳහා අවසර ලබා ගැනීමට සිදුවන අවස්ථාවක ද එසේ අවසර ගැනීමට අපොහොසත් වේ නම් ඔහුට එම අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) අංක 7 දරන වගන්තියේ විධිවිධාන යටතේ සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම හෝ නොකරනු ලැබූ අපද්‍රව්‍ය ඉහත 6 (iii) හි විධිවිධාන යටතේ යම් බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් කරන ලද යම් අපද්‍රව්‍ය වර්ගයක් මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුකූලව ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

07. (i) යම් පරිශ්‍රයක හිමිකරුට හෝ පදිංචිකරුට පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් හැර අපද්‍රව්‍ය එම පරිශ්‍රය ඇතුළතම බැහැර කළ හැකිය.

(අ) ප්‍රාදේශීය සභාව විසින් එවැනි අපද්‍රව්‍ය බැහැරලීම තහනම් කරන ලද ප්‍රදේශයක් වීම.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් නිශ්චිතව නියම කරනු ලැබ ඇති ඇතැම් අපද්‍රව්‍ය වර්ග

(ii) පරිශ්‍රයේ හිමිකරුට හෝ පදිංචිකරුට ලේකම්වරයා විසින් අනුමත කරන ලද සැලසුමකට හා ප්‍රමිතියකට අනුකූලව ඉදිකරනු ලැබූ දහනයක හෝ පෝරණුවක අපද්‍රව්‍ය පිළිස්සිය හැකිය. නැතිනම් ලේකම්වරයා විසින් අනුමත කරන ලද ආකාරයට අපද්‍රව්‍ය පිරියම් කිරීම, සැකසීම හෝ වැළලීම කළ හැකිය.

(iii) යම් හිමිකරුවෙකු හෝ පදිංචිකරුවෙකු ''කොම්පෝස්ට් බඳුන්'' සඳහා ලේකම්වරයා වෙතින් ඉල්ලීමක් කළහොත් ඒ හිමිකරුට හෝ පදිංචිකරුට එම කොම්පෝස්ට් බඳුන් නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් පරිශ්‍රය තුළ තිබේනම් ලේකම්වරයා එම කොම්පෝස්ට් බඳුන්වල පිරිවැයෙන් කොටසක් හෝ මුළුමනින් හෝ සහනාධාරයක් වශයෙන් ලබාදෙමින් එම කොම්පෝස්ට් බඳුන් හිමිකරුට හෝ පදිංචිකරුට සැපයිය හැකිය.

(iv) හිමිකරු හෝ පදිංචිකරු පරිශ්‍රය ඇතුළත එකතුවන 'ගෙවතු අපද්‍රව්‍ය' හැකිතාක් අදාළ පරිශ්‍රය තුළ මෙම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව බැහැර කිරීමට කටයුතු කළ යුතු ය. අනතුරුව ඉතිරිවන යම් ගෙවතු අපද්‍රව්‍යක් වේ නම් එය බැහැරලීමට ඇති අපද්‍රව්‍යවල ස්වභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි නියමිත ගාස්තුවක් ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නාට භාරදිය යුත්තේ ය.

(v) වීථියක හෝ මංමාවතක යාබදව පිහිටි යම් ගසක් හෝ ගසක කොටසක් කපන යම් තැනැත්තෙක් වහාම එය ඉවත් කළ යුත්තේ ය. නැතිනම් ඉවත් කිරීමට සැලැස්විය යුත්තේ ය. එසේත් නැතිනම් ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු ගෙවීමක් මත ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරනු ලබන අයට භාර දිය යුත්තේ ය.

(vi) සෑම තැනැත්තෙක්ම ඔහුගේ පාලනය යටතේ සිටින යම් සතෙකු වීථියක, මංමාවතක් හෝ පොදු ස්ථානයක මළපහ කිරීම වැළැක්වීමට පියවර ගත යුත්තේ ය. එසේ මළපහ කරනු ලැබුවහොත් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව එය පවිත්‍ර කොට බැහැරලීම ඒ තැනැත්තාගේ වගකීම වන්නේ ය.

(vii) කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කුමන වර්ගයක හෝ අපද්‍රව්‍යයක් වාහනයක සිට වීථියකට, මංමාවතකට හෝ පොදු ස්ථානයකට, ඇලකට, දෙළකට, ජල මූලාශ්‍රයකට, රක්ෂිතයකට හෝ කළපුවකට මුදාහැරීම හෝ එහි තැන්පත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(viii) නිවසක් හෝ වෙනත් පරිශ්‍රයක් ඉදි කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට සැලැස්මක් අනුමත කරවා ගැනීමට අයදුම් කරන යම් කෙනෙක් ඔහුගේ පරිශ්‍රයේ ජනනය වන ඝණ අපද්‍රව්‍ය හා මුදා හරිනු ලබන ද්‍රව්‍ය පිරියම් කරනු ලබන හා සකස් කරනු ලබන ආකාරය පිළිබඳ සැළසුම ඔහුගේ අයදුම්පත්‍රයේ ඇතුළත් කළ යුත්තේ ය.

*නිවාස පරිශ්‍රයන්*

08. (i) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම අතුගෑමෙන් හෝ වෙනත් ක්‍රමයකින් එකතු කරනු ලැබූ අපද්‍රව්‍ය පහත දැක්වෙන පරිදි තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හිමිකරුවෙක්ම හෝ පදිංචිකරුවෙක්ම එසේ තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම මලුවලට, බඳුන්වලට හෝ වෙනත් බහාලුම්වලට දැමිය යුතු අතර, ඒවා ඉවත් කරනු ලබන තෙක් ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයක තැබිය යුත්තේය. ආහාර අපද්‍රව්‍ය හා ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය තෙතමනය කාන්දු නොවන ද්‍රව්‍යයන් සාදනු ලැබූ සහ මීයන්, කෘමීන් හා අනෙකුත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි පරිදි වසනු ලැබූ බහාලුමක තැබිය යුත්තේය. සතුන්ගේ මළකුණු ශරීර කොටස් හෝ අසූචි ආශ්‍රිත අපද්‍රව්‍ය, බැහැරලිය යුතු අපද්‍රව්‍යවල ස්වාභාවය සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා කලින් කලට ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසුව පමණක් ප්‍රාදේශීය සභාව විසින් අදාළ අපද්‍රව්‍ය භාර ගැනීම සිදු කළ යුතු ය.

(iii) සෑම හිමිකරුවෙකුටම හෝ පදිංචිකරුවෙකුටම 8 (i) උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය. නොඑසේ නම් ප්‍රාදේශීය සභාව විසින් එම අපද්‍රව්‍ය එක්රැස් කරන බහාලුමකට බැහැරලීම කළ හැක්කේ ය.

09. (i) කුලී නිවැසියන් ගණනාවක් සහිත බහු මහල් ගොඩනැගිල්ලක සෑම අයිතිකරුවෙක්ම ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන අයුරු තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) සතුන්ගේ මළකුණු, ශරීර කොටස් සහ අසූචි,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 9 (I) වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු ඉහත (අ), (ආ) සහ (ඇ) යන අයිතමය විස්තර කර ඇති අපද්‍රව්‍ය සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවේ ප්‍රමිතීන්ට පිරිවිතරයන්ට අනුකූල වූ බහාලුම් සපයාගත යුතු අතර ඒවා පවිත්‍රව හා සනීපාරක්ෂක තත්වයෙන් පවත්වාගත යුතු ය.

(iii) 9 (i) වන උප වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ගොඩනැගිල්ලක හිමිකරු හෝ පදිංචිකරු (ii) වන උප වගන්තියේ විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක දී ලේකම්වරයා විසින් දැනුම්දෙනු ලබන දිනයක දී හෝ ඊට පෙර අදාළ බඳුන් හෝ බහාලුම් සපයන ලෙසට හිමිකරුට හෝ පදිංචිකරුට නියම කිරීමට ලේකම්වරයාට බලය ඇත්තේය. ලේකම්වරයාගේ නියමයන් අනුව ක්‍රියා කිරීම හිමිකරුගේ හෝ පදිංචිකරුගේ යුතුකම වන්නේ ය.

(iv) ගොඩනැගිල්ලේ බිමක හෝ මහලක හිමිකරු හෝ පදිංචිකරු තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඒ සඳහා තබා ඇති අදාළ බඳුනකට හෝ බහාලුමකට දැමිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 9(i) වන උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම බලයලත් එක්රැස් කරන්නෙකුගේ කාර්යය වන්නේ ය. එසේ ඉවත් කරනු නොලැබූ යම් අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සකස් කර පවත්වාගෙන යනු ලබන ස්ථානයකට බැහැර කිරීම හෝ එසේ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුත්තේ ය.

(vi) ඉහත 9 (i) (ඇ) අයිතමයෙහි සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) සහ (ඉ) යන අයිතමයන් යටතේ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර නිවාස පරිශ්‍රයේ අයිතිකරු, කුලී නිවැසියා හෝ පදිංචිකරු එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

10. (i) ප්‍රාදේශීය සභාවේ පූර්ව අනුමැතිය ලබාගෙන මුඩුක්කු නිවැසියන්ගේ භාවිතය සඳහා ලේකම්වරයා විසින් අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නොමිලයේ සැපයීම නීත්‍යානුකූල වේ.

(ii) සෑම මුඩුක්කු නිවසකම හිමිකරු හෝ පදිංචිකරු ඔහුගේ වාසස්ථානයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කර ඔහුගේ වාසස්ථානයට ආසන්නව සපයනු ලබන අනුමත බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය.

(iii) මේ අතුරු ව්‍යවස්ථාවේ 10 (ii) වැනි උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග ඉවත් කිරීම පිණිස අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට අවසර දීම ලේකම්වරයාගේ කාර්යය විය යුත්තේ ය.

*සාප්පු සහ කාර්යාල*

11. (i) සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙක්ම හෝ කළමණාකරුවෙක්ම එක් එක් සංකීර්ණයේ එකතුවන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය ඃ

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(iii) සාප්පුවක හෝ කාර්යාලයක හිමිකරුට හෝ කළමණාකරුට මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වැනි උප වගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකිය.

(iv) මහල් කිහිපයකින් යුක්ත සාප්පු හෝ කාර්යාල සංකීර්ණයක හිමිකරු හෝ කළමණාකරු ලේකම්වරයා විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව එම සාප්පුවෙන් හෝ කාර්යාලයෙන් හෝ වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තුරු වෙන් වෙන් වශයෙන් බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කරනු ලැබිය යුත්තේ ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (iv) වැනි උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කරනු ලැබ ඇති සාප්පුවක හෝ කාර්යාලයක යම් හිමිකරුවෙක් තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙන වෙනම බඳුන්වලට හෝ බහාලුම්වලට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදීමට සෑම හිමිකරුවෙකුටම සහ කළමණාකරුවෙකුට අයිතිවාසිකමක් ඇත.

(vi) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් එක්රැස් නොකරන ලද මෙම අතුරු ව්‍යවස්ථාවේ 11 (i) වැනි උප වගන්තියේ (ඇ) අයිතමයේ සඳහන් කරනු ලැබ ඇති අපද්‍රව්‍ය වර්ග ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් අය කිරීමෙන් පසු ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකු වෙත භාරදීම නීත්‍යානුකූල වන්නේ ය.

(vii) ඉහත (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඇ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍රවීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුම හෝ කළමණාකරුවෙකුම එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(viii) අසල්වාසීන්ට හෝ එකී සාප්පුවේ හෝ කාර්යාලයේ සේවයේ නියුතු තැනැත්තන්ට හෝ යම් සෞඛ්‍ය හෝ සනීපාරක්ෂක ගැටළුවක් ඇති නොවීම පිණිස අපද්‍රව්‍ය ඉවත් කිරීමත් මෙම අතුරු ව්‍යවස්ථාවේ විශේෂයෙන් නියම කර ඇති අපද්‍රව්‍ය බඳුන් හෝ බහාලුම් නඩත්තු කිරීමත් යම් සාප්පුවක හෝ කාර්යාලයක සෑම හිමිකරුවෙකුගේම හෝ කළමණාකරුවෙකුගේම වගකීම වන්නේ ය.

*හෝටල්*

12. (i) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තම පරිශ්‍රයේ එක්රැස් වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය. නැතහොත් එසේ කිරීමට සැලැස්විය යුත්තේ යඃ

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් තෝරා වෙන් කරන ලද අපද්‍රව්‍ය ඉවත් කරනු ලබන තෙක් වෙන් වෙන් වශයෙන් යෝග්‍ය බඳුන්වලට හෝ බහාලුම්වලට දමා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iii) සෑම හෝටල්කරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතෙකු ඇතුළු වීම වළකමින් සියලුම ආහාර අපද්‍රව්‍ය සහ ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද සහ පියනක් යෙදූ නිසි ලෙස ආරක්ෂාකාරී කරන ලද බඳුනක හෝ වෙනත් බහාලුමක ඇසිරිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (i) වැනි උපවගන්තියේ (අ) සහ (ආ) අයිතමයන්හි විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය හැකි ය.

(v) මෙම අතුරු ව්‍යවස්ථාවේ 12 (iv) වැනි උපවගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව සකස් කරන ලද බහාලුමකට හෝ නම් කරන ලද ස්ථානයට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(vi) ඉහත (ඇ) ඡේදයේ සඳහන් උපද්‍රව අපද්‍රව්‍ය ඉහත (අ), (ආ), (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර සෑම හෝටල් හිමිකරුවෙක්ම හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*එළවළු සහ පළතුරු වෙළඳසල්*

13. (i) සෑම එළවළු සහ පළතුරු වෙළෙඳ සලකම හිමිකරු හෝ එය භාරව සිටින තැනැත්තා තම වෙළෙඳ සලේ එක්රැස්වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු එළවළු, පළතුරු හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (i) වැනි උපවගන්තියේ (අ) අයිතමයෙහි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන ප්ලාස්ටික් හෝ ලෝහ ද්‍රව්‍යයකින් සාදන ලද වෙනම බහාලුමක තැබිය යුතු අතර එය තුළට මැස්සන්, මීයන්, කෘමීන් හෝ යම් වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය. අනෙකුත් අපද්‍රව්‍ය සුදුසු යම් බඳුනකට හෝ වෙනත් බහාලුමකට හෝ දැමිය යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13(i) වැනි උපවගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුතු ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 13 (iii) වැනි උපවගන්තිය යටතේ භාර ගනු නොලැබූ ඉහත (අ), (ආ) ඡේද යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය සභාව විසින් එවැනි කසළ එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*මස්, මාළු හෝ බිත්තර වෙළෙඳ කුටි*

14. (i) තත් කාර්යය සඳහා සභාපතිවරයා විසින් ඊට අදාළ යම් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් ප්‍රකාර එහි සඳහන් ස්ථානයේ දී කිසිම තැනැත්තෙක් ගෝඝාතක ආඥාපනතේ විධිවිධාන යටතේ අවසරලත් සතුන් හැරුණුවිට වෙනත් කිසිම සතෙකු ඝාතනය නොකළ යුත්තේ ය.

(ii) මස්, මාළු හෝ බිත්තර අලෙවි කිරීම සඳහා ඇති කුටියක හිමිකරු හෝ එම ව්‍යාපාරය කරගෙන යන අය හෝ ඔවුන්ගේ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:

(අ) මිනිස් පරිභෝජනයට නුසුදුසු සත්ව මළකුණු හෝ මළකුණුවල කොටස් හෝ වෙනත් දිරන අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම භාජනයක හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේ ය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වැනි උපවගන්තියේ (අ) අයිතමයේ විශේෂයෙන් සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග තෙතමනය කාන්දු නොවන බහාලුමක් ඇතුළත තැබිය යුතු අතර එම බහාලුමට මැස්සන්, මීයන්, කෘමීන් හෝ වෙනත් සතුන් ඇතුළුවීම වළකමින් එය නිසි ලෙස සුරක්ෂිත කර තැබිය යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 14 (ii) වැනි වගන්තියේ (අ), (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග අවසර ලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය. එසේ භාරදෙනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍යයක් ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යන කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව පත් කරන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

### *පදික වෙළෙඳාම හෝ සංචාරක වෙළෙඳාම*

15. (i) අපද්‍රව්‍ය ජනනය වන්නාවූ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සංචාරක හෝ පදික වෙළෙන්දෙක්, ඊට අදාළව යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ විධිවිධාන සලසා ඇති පරිදි හා ප්‍රමිතීන්ට අනුකූලව එම අපද්‍රව්‍ය දැමීම සඳහා බඳුනක් හෝ බහාලුමක් තබාගත යුත්තේ ය. එවැනි කිසිම අපද්‍රව්‍යයක් පදික වේදිකාවේ, මහා මාර්ගයේ ජල කානුවකට හෝ පොදු ස්ථානයකට නොදැමිය යුත්තේ ය.

(ii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම වාහනවල ගමනාගමනයකට හෝ පදිකයින්ගේ ගමනාගමනයට බාධා ඇති වන ආකාරයෙන් බඳුනක් හෝ වෙනත් බහාලුමක් නොතැබිය යුත්තේ ය.

(iii) සෑම පදික හෝ සංචාරක වෙළෙන්දෙක්ම ඔහුගේ ව්‍යාපාරය හේතුවෙන් ජනනය වන්නාවූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය:

(අ) ආහාර අපද්‍රව්‍ය සහ වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය.

(iv) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය වෙනම බඳුනක් හෝ වෙනත් බහාලුමක් තුළට දැමිය යුත්තේය. මෙම අතුරු ව්‍යවස්ථාවේ 15(iii) උපවගන්තියේ (අ) අයිතමයේ සඳහන් කර ඇත්තා වූ අපද්‍රව්‍ය කෘමීන්, මීයන් හෝ වෙනත් සතුන් විසින් කා දැමීමට නොහැකි වන පරිදි ආරක්ෂාකාරී බහාලුමක අභ්‍යන්තරයේ තැබිය යුතු අතර අමතර අපද්‍රව්‍ය දැමීමට අවශ්‍ය වන විට හැර එය වසා තැබිය යුත්තේ ය.

(v) සෑම පදික වෙළෙන්දෙක්ම හෝ සංචාරක වෙළෙන්දෙක්ම මෙම අතුරු ව්‍යවස්ථාවේ 15 (iii) උපවගන්තියේ (අ) හා (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දිය යුතු ය.

(vi) ඉහත (iii) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉහත (අ), (ආ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර පදික වෙළෙන්දා හෝ සංචාරක වෙළෙන්දා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

(vii) මෙම අතුරු ව්‍යවස්ථාවේ (v) වැනි උපවගන්තිය යටතේ භාරගනු නොලැබූ ඉහත (අ), (ආ) අයිතම යටතේ විස්තර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් එවැනි කසල එක්රැස් කිරීම සඳහා විශේෂිතව තබන ලද බහාලුමකට හෝ ස්ථානයකට බැහැර කිරීම නීත්‍යානුකූල වන්නේ ය. සෑම සංචාරක/පදික වෙළෙන්දෙක්ම අපද්‍රව්‍ය බඳුන් නාගරික අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීමට පෙර ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ගෙවිය යුත්තේ ය.

*කර්මාන්තශාලා*

16. (i) සෑම කර්මාන්තශාලා හිමිකරුවෙක්ම හෝ නිෂ්පාදකයෙක්ම කර්මාන්තශාලා පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කර පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 16 (1) වන උප වගන්තියේ (අ), (ආ) හා (ඈ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන ගාස්තුවක් ප්‍රාදේශීය සභාවේ කසල එක්රැස් කරන්නෙකුට භාර දීම කළ යුතු ය.

(iii) වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ එම ව්‍යාපාරය සඳහා නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව උපද්‍රවකාරී අපද්‍රව්‍ය ඉවත් කළ යුතු වන්නේ ය.

(iv) ඉහත 16 (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ), (ආ) (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමඟ මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර කර්මාන්ත ශාලා හිමිකරු හෝ ඔහු විසින් බලය දී ඇති තැනැත්තා එම කසල බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*කැනීම්, ඉදිකිරීම් සහ කඩා දැමීම්*

17. (i) යම් වීථියක්, පාරක් හෝ පොදු ස්ථානයක් කණින හෝ යම් නිර්මාණයක් ඉදිකරන හෝ කඩාදමන සෑම තැනැත්තෙක්ම එමඟින් ජනනය වන්නා වූ අපද්‍රව්‍ය සුදුසු ආකාරයකින් එකී පරිශ්‍රයෙන් ඉවත් කරන තෙක් පරිශ්‍රය ඇතුළත හෝ ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන ස්ථානයක හෝ ගබඩා කළ යුත්තේ ය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ 17 (i) වන උපවගන්තියේ සඳහන් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි ගාස්තුවක් ලේකම්වරයාට ගෙවීම මත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාරදිය යුත්තේ ය.

*ආරෝග්‍යශාලා*

18. (i) ආරෝග්‍යශාලාවක භාරකරු පරිශ්‍රය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 18 (i) වන උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩපිළිවෙලක් යටතේ කසළ එක්රැස් කරනු ලබන අවස්ථාවක ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසල එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය. 18 (i) උපවගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 18 (i) (ඇ), (ඈ) අයිතම යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර, එකී අපද්‍රව්‍ය වයඹ පළාතේ 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

*පෞද්ගලික රෝහල් හා රසායනාගාර*

19. (i) පෞද්ගලික රෝහලක හෝ රසායනාගාරයක හිමිකරු හෝ අයිතිකරු තම ආයතනය තුළ ජනනය වන්නා වූ අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) සායනික අපද්‍රව්‍ය,
(ඈ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඉ) පරිශ්‍රය අතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 19 (i) වන උපවගන්තිය යටතේ (අ) සහ (ආ) අයිතමයන්හි සඳහන් කර ඇති අපද්‍රව්‍ය වර්ග වෙනම බහාලුම්වල තැන්පත් කර ඒවා ඉවත් කරනු ලබන තෙක් යෝග්‍ය ස්ථානයක ගබඩා කළ යුතු අතර, එකී අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා විශේෂයෙන් සලසා ඇති වැඩ පිළිවෙළක් යටතේ කසල එක්රැස් කරන අවස්ථාවක ප්‍රාදේශීය සභාව වෙනුවෙන් එසේ කසළ එක්රැස් කරන්නා වෙත භාර දිය යුතු ය.

(iii) 19 (i) උපවගන්තියේ (ඉ) අයිතමය යටතේ සඳහන් කර ඇති අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසු එක්රැස් කරන්නා වෙත භාරදිය යුතු ය.,

(iv) ඉහත 19 (i) උපවගන්තියේ (ඇ), (ඈ) අයිතමය යටතේ එකතුවන අපද්‍රව්‍ය කවර ආකාරයකින් හෝ වෙනත් අපද්‍රව්‍ය සමග මිශ්‍ර නොකළ යුතු අතර, එකී අපද්‍රව්‍ය 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව බැහැර කළ යුත්තේ ය.

*වෙනත් පරිශ්‍රයන්*

20. (i) අංක 8 සිට 19 දක්වා වන ඡේදයන්හි විශේෂයෙන් සඳහන් කර නොමැති ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තෙක් හෝ මහජනතාවගේ සහභාගිත්වය ඇතිව පොදු, ආගමික, සාමාජීය, සංස්කෘතික හෝ අධ්‍යාපනික ක්‍රියාකාරකම් සංවිධානය කරන හා ක්‍රියාත්මක කරන යම් තැනැත්තෙක් එකී ක්‍රියාකාරකම් නිසා හෝ එවැනි ආයතනයක් පවත්වාගෙන යාම නිසා ජනනය වන අපද්‍රව්‍ය පහත දැක්වෙන ආකාරයට තෝරා වෙන් කළ යුත්තේ ය.

(අ) ආහාර අපද්‍රව්‍ය හා වෙනත් ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය,
(ආ) ප්‍රතිභාවිතාකරණීය හා ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය,
(ඇ) උපද්‍රවකාරී අපද්‍රව්‍ය,
(ඈ) පරිශ්‍රය ඇතුගෑමෙන් පසු එකතුවන දූවිලි හා වෙනත් වියළි අපද්‍රව්‍ය.

(ii) 20 (i) වන උපවගන්තියේ විශේෂයෙන් සඳහන් කර ඇති යම් ක්‍රියාකාරකමක් සංවිධානය කරන පුද්ගලයෙක් එම ක්‍රියාකාරකම් නිසා ජනනය වන්නා වූ අපද්‍රව්‍ය එක්රැස් කිරීමට විශේෂ වැඩපිළිවෙලක් යෙදීමට හැකිවනු පිණිස ඒ ගැන කල්තියා ප්‍රාදේශීය සභාවට දැනුම්දිය යුත්තේ ය.

(iii) තෝරා වෙන් කරනු ලැබූ අපද්‍රව්‍ය ඉවත් කරගනු ලබන තෙක් වෙනම බහාලුම්වල අසුරා සුදුසු ස්ථානයක ගබඩා කළ යුත්තේ ය.

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 20 (i) වන උපවගන්තියේ (අ), (ආ) හා (ඇ) අයිතම යටතේ එක්රැස් වන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලැබූ පරිදි ප්‍රකාශයට පත් කර ඇති ගාස්තුවක් අය කර ප්‍රාදේශීය සභාව විසින් බලය දී ඇති කසල එක්රැස් කරන්නෙකු විසින් භාර ගැනීම නිත්‍යානුකූල වන්නේ ය.

(v) එසේ වුව ද, කිසියම් වූ ආගමික ස්ථානයක ආගමික කාර්යයක් වශයෙන් වාණිජ පරමාර්ථයකින් තොරව පවත්වාගෙන යන කවර ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් වුව ද එකී ක්‍රියාකාරකම හේතුවෙන් එක්රැස් වන ඉහත (i) උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) යන අයිතම යටතේ එක්රැස්වන අපද්‍රව්‍ය බැහැර කරලීම සම්බන්ධයෙන් ඉහත (iv) උපවගන්තියේ සඳහන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අය කිරීම යන්න අදාළ නොවේ.

(vi) ඉහත (i) (ඇ) අයිතමයේ සඳහන් උපද්‍රවකාරී අපද්‍රව්‍යය ඉහත (අ) (ආ) සහ (ඈ) යන අයිතම යටතේ ඇති අපද්‍රව්‍ය සමග මිශ්‍ර වීමක් කවර ආකාරයකින් හෝ නොකළ යුතු අතර, අදාළ පරිශ්‍රවල හිමිකරුවන් එම කසළ බැහැර කළ යුත්තේ ඒ සඳහා විශේෂයෙන් සේවාවන් පවත්වාගෙන යාමට බලය ලබා දී ඇති කසල එක්රැස් කරන්නෙකුට විය යුතු ය.

*වීථි සහ පොදු ස්ථාන*

21. (i) ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරන ආකාරයට සභාපතිවරයා විසින් පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීමට, පාලනය කිරීමට සහ පරිපාලනය කිරීමට පියවර ගත යුත්තේ ය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි වීථි, පොදු ස්ථාන, මංමාවත්, පොදු කාණු, ජල මාර්ග සහ පොදු වෙළෙඳ පොළවල් පිරිසිදු හා සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම,

(ආ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කසළ තාවකාලිකව එක්රැස් කිරීමට යථායෝග්‍යයැයි හඳුනාගන්නා ස්ථානයන්හි ප්‍රමාණවත් බක්කි සංඛ්‍යාවක් සවි කිරීම හා නඩත්තු කිරීම,

(ඇ) උත්සවවල දී, විශේෂ සිදුවීම් අවස්ථාවල දී හෝ ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන සිදුවීම් අවස්ථාවල දී ප්‍රාදේශීය සභාවෙන් තීරණයක් කරන විටක දී හෝ එකී උත්සව හෝ විශේෂ සිදුවීම් අවස්ථා සංවිධායකවරුන්ගේ ඉල්ලීමක් මත හෝ පොදු ස්ථානයන්හි භාවිතය සඳහා ජංගම අපද්‍රව්‍ය බක්කි සැපයීම,

(ඈ) කසළ තාවකාලික එක්රැස් කිරීමට යථායෝග්‍ය යැයි හඳුනාගෙන ඇති ස්ථානවල සවි කර ඇති පොදු අපද්‍රව්‍ය බක්කි හෝ බහාලුම් සනීපාරක්ෂක තත්ත්වයෙන් පවත්වා ගැනීම සහ ඒ ආසන්නයේ පදිංචි වැසියන්ට එය පීඩාවක් වීමට පෙර එම බක්කිවල හා බහාලුම්වල තැන්පත් කර ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීම,

(ඉ) පූර්වගාමී වගන්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ක්‍රියාකාරකම් පිළිබඳව ලැබුණු යම් පැමිණිල්ලක් විමර්ශන කිරීම හා අප්‍රමාදව ඒ ගැන ක්‍රියා කිරීම,

(ii) ප්‍රාදේශීය සභාව විසින් විශේෂයෙන්ම එක් එක් අපද්‍රව්‍ය සඳහා වෙන් කරනු ලැබූ බක්කියක ඊට අදාළ නොවන අපද්‍රව්‍ය තැන්පත් කිරීම කිසිම තැනැත්තෙක් නොකළ යුත්තේ ය.

*ප්‍රාදේශීය සභාවේ යුතුකම්*

22. (i) ලේකම්වරයා විසින් සභාපතිවරයා සමග සාකච්ඡාකර සභාවේ අනුමැතියට යටත්ව පහත දක්වෙන කාර්යයන් සැලසුම් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කළ හැක්කේ ය.

(අ) අපද්‍රව්‍ය අඩු කිරීමට, ප්‍රතිභාවිතයට හා ප්‍රතිචක්‍රීකරණයට ජනතාව ධෛර්යමත් කිරීම,

(ආ) අපද්‍රව්‍ය තෝරා වෙන්කිරීම, එක්රැස් කිරීම, ගබඩා කිරීම, මුදාහැරීම හා බැහැරලීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම හෝ මාධ්‍ය මගින් ප්‍රචාරණය කිරීම,

(ඇ) ප්‍රතිභාවිතකරණ හා ප්‍රතිචක්‍රීකරණ කටයුතුවල නියුක්ත පුද්ගලයින්ට හා කුඩා ව්‍යවසායකයින්ට පහසුකම් සැපයීම,

(ඈ) අපද්‍රව්‍ය අඩු කිරීමේ, ප්‍රතිභාවිතා කිරීමේ හා ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වී සිටින අයට දිරි ගැන්වීම් පිරිනැමීම,

(ඉ) අපද්‍රව්‍ය මුදාහැරීමේ ක්‍රම පිළිබඳ ආකෘති නියාමනය කිරීම,

(ඊ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් එක් ප්‍රදේශයන්හි එක් එක් අපද්‍රව්‍ය වර්ග සඳහා ප්‍රාදේශීය සභාව විසින් තීරණය කරනු ලබන පරිදි අපද්‍රව්‍ය එක්කාසු කරන දිනයන්, වේලාවන්, ක්‍රමවේදයන් හා ගාස්තු සඳහන් කරමින් අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ කාල සටහනක් පිළියෙළ කිරීම සහ ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හි අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා වන කොන්දේසි එම කාල සටහනේ ඇතුළත් කිරීම,

(උ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට වෙනම භාරදෙනු නොලැබූ යම් වෙන් කරන ලද අපද්‍රව්‍යයක් කාල සටහනට අනුව නියමිත වේලාවට එක්රැස් කිරීම,

(ඌ) බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්ට භාරදෙනු නොලැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය සහ වෙනත් යම් අපද්‍රව්‍ය සනීපාරක්ෂක ආකාරයෙන් ප්‍රවාහනය කිරීම.

(එ) අන්තරායකාරී අපද්‍රව්‍ය හෝ ලේකම්වරයා විසින් නියම කරන ලද වෙනත් යම් අපද්‍රව්‍ය වර්ග හැර වීථි අතුගෑමෙන්, කාණු පිරිසිදු කිරීමෙන් සහ පොදු ස්ථාන පිරිසිදු කිරීමෙන් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය පොදු බක්කිවලින් එක්රැස් කෙරෙන අපද්‍රව්‍ය සහ ප්‍රාදේශීය සභාවේ කම්කරුවන් විසින් එක්රැස් කරනු ලබන අපද්‍රව්‍ය බලයලත් අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකුට භාර දීම හෝ ප්‍රාදේශීය සභාව විසින් විධිමත් පරිදි බැහැර කිරීමට කටයුතු කිරීම,

(ඒ) ආහාර සහ වෙනත් ජෛව ජීර්ණනීය ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය ප්‍රායෝගිකව කළ හැකි තාක් මුළුමනින්ම හෝ කොටසක් හෝ සැකසීමට හා පිරියම් කිරීමට වැඩ පිළිවෙලක් ද ඇතුළත්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නන් විසින් එක්රැස් කරනු ලබන වෙන් කරන ලද අපද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කිරීමට සහ එම ක්‍රියාවලියෙන් ප්‍රතික්ෂේප වන හා මෙම අපද්‍රව්‍ය වර්ගවල වෙනත් අවශේෂ අපද්‍රව්‍ය ලේකම්වරයා අනුමත කරන ආකාරයට බැහැරලීමට යෝග්‍ය පියවර ගැනීම,

(ඔ) වයඹ පළාත් පරිසර අධිකාරිය සමග අන්තරායකාරී අපද්‍රව්‍ය බැහැර කිරීම සම්බන්ධයෙන් සියලු කටයුතු නියාමනය කිරීම,

(ඕ) 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ විධිවිධාන අනුව බලපත්‍රයක් හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම සහ එම බලපත්‍රයේ හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රයේ විශේෂයෙන් සඳහන් කර ඇති කොන්දේසිවලට යටත්ව අපද්‍රව්‍ය පිළිස්සීම හෝ සනීපාරක්ෂක බිම් පිරවුමක් පවත්වාගෙන යාම හෝ විධිමත් ක්‍රමවේදයන් පවත්වාගෙන යාම,

(ක) අපද්‍රව්‍ය අතුගෑම, එක්කාසු කිරීම, තෝරා වෙන් කිරීම, ප්‍රවාහනය කිරීම, මාරු කිරීම හා බැහැරලීම යන කාර්යයන් හි නිරතවන සෑම සේවකයෙකුටම පිරිසිදුකාරක ද්‍රව්‍ය, සුදුසු ඇඳුම්, අත් ආවරණ, මුඛ ආවරණ සහ බූට් සපත්තු සැපයීම හා එකී සේවකයින් සඳහා සුදුසු රක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම හා වසරකට දෙවරකට නොවැඩි සෞඛ්‍ය සායනයන් පැවැත්වීම,

(ග) ප්‍රාදේශීය සභා පරිශ්‍රය සඳහා අභ්‍යන්තර අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,

(ජ) 2000 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳ ජාතික උපාය මාර්ගය සහ අදාළ නීතියට හා 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියට අනුකූලව සවිස්තර වශයෙන් යටත් පිරිසෙයින් එක් ලිත් වර්ෂයක් ආවරණය කරන හා අවසාන බැහැරලීම සම්බන්ධයෙන් වර්ෂ 03 ක් ඉදිරියට ආවරණය කරන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාත්මක සැලැස්මක් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම හා එම සැලැස්ම එය ආවරණය කරන කාලසීමාව අනුව නිරන්තර පදනම මත ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂිකව අනුමත කරනු ලැබීම,

(ට) (අ) සිට (ජ) දක්වා අයිතමයන්හි සඳහන් වන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබෙන යම් පැමිණිල්ලක් එය අදාළ වන්නේ උද්ගත විය හැකි පීඩාවකට නම්, දින තුනක් ඇතුළතත් වෙනත් පැමිණිල්ලක් නම්, දින දහතරක් ඇතුළතත් විමර්ශනය කිරීම හා වහාම අවශ්‍ය කටයුතු කිරීම.

*අවසර පත්‍රය*

23. (i) අපද්‍රව්‍ය ප්‍රතිභාවිතයට ගන්නා වූ හා ප්‍රතිචක්‍රීකරණය කරන්නා වූ හෝ කොම්පෝස්ට්, ජීව වායු හෝ වෙනත් නිපැයුම් නිර්මාණය කරන්නා වූ යම් තැනැත්තෙක් හෝ තැනැත්තන් පහත දැක්වෙන කරුණු සපුරාලන්නේ නම් ඔහුට කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ඇත:

(අ) ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත හෝ වෙනත් පළාත් පාලන ආයතන ප්‍රදේශයක හෝ යම් ව්‍යාපාරයක් කරගෙන යාම,

(ආ) 1990 අංක 12 දරන වයඹ පළාත් පරිසර ප්‍රඥප්තිය යටතේ විධිවිධාන අනුව නිකුත් කරනු ලබන පරිසර ආරක්ෂණ බලපත්‍රයක් සතුව තිබීම,

(ඇ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය සඳහා ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ඉදිකරනු ලබන අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන තිබීම,

(ඈ) එක්රැස් කරන ලද අපද්‍රව්‍ය ලේකම්වරයා විසින් අනුමත කරනු ලබන පරිදි හා ජනතාවට පීඩාවක් සිදුනොවන සනීපාරක්ෂක ක්‍රමයකට ප්‍රවාහනය කිරීම සඳහා වාහන තිබීම,

(ඉ) අදාළ ව්‍යාපාර ප්‍රාදේශීය සභාවේ සීමාවක් ඇතුළත කරගෙන යනු ලබන විටෙක දී ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා ගාස්තුවක් සභාවට ගෙවීම මත අපද්‍රව්‍ය සැකසීමේ දී හෝ පිරියම් කිරීමේ දී අවශේෂ වන්නාවූ ප්‍රතික්ෂේප වන්නා වූ හෝ අතුරු නිෂ්පාදන වශයෙන් නිර්මාණය කෙරෙන්නා වූ අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව විසින් අනුමත කරනු ලබන පරිදි ප්‍රාදේශීය සභාවට භාරදීමට එකඟ වීම.

(ii) ප්‍රාදේශීය සභාව අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කළ විටෙක හෝ නිෂ්ප්‍රභා කළ විටෙක ඉල්ලුම්කරු ඉල්ලා සිටියහොත් එසේ ප්‍රතික්ෂේප කිරීමට හා නිෂ්ප්‍රභා කිරීමට හේතු අවසර පත්‍රය සඳහා ඉල්ලුම්පත්‍රය ලැබී දින 30 ක් ඇතුළත ලිඛිතව ඉල්ලුම්කරුට දැනුම් දිය යුත්තේ ය.

(iii) ලේකම්වරයා විසින්, වලංගු කාල පරිච්ඡේදය තුළ එක්රැස් කිරීමට අවසර දෙනු ලබන අපද්‍රව්‍ය වර්ගය හෝ වර්ග එකී අපද්‍රව්‍ය එක්රැස් කිරීමට අවසර දෙනු ලබන ප්‍රදේශය සහ වෙනත් සුදුසු කොන්දේසි අවසර පත්‍රයේ දැක්විය යුත්තේ ය,

(iv) මෙම අතුරු ව්‍යවස්ථාවේ 23 (i) වැනි උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා නොකරන අවස්ථාවක දී මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කළ යුත්තේ ය.

(v) 23 (iv) වැනි උපවගන්තියේ විධිවිධාන යටතේ අවසර පත්‍රයක් අවලංගු කරනු ලැබූ අවස්ථාවක දී කිසියම් තැනැත්තෙක් අපද්‍රව්‍ය එක්රැස් කිරීම හෝ ලබාගැනීම හෝ නොකළ යුත්තේ ය. එවැනි අවස්ථාවක දී අවසර පත්‍රය අවලංගු කරනු ලැබූ බවට ජනතාව දැනුවත් කිරීම පිණිස ලේකම්වරයා මගින් හෝ වෙනත් ක්‍රමයකින් ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදිය යුත්තේ ය.

*අපද්‍රව්‍ය බැහැරලන ප්‍රදේශ*

24. ප්‍රාදේශීය සභාව විසින් අපද්‍රව්‍ය බැහැරලීමේ කාර්යයන් සඳහා වෙන් කරන ලද ප්‍රදේශවලට අවසර නොලත් තැනැත්තෙක් ඇතුළු නොවිය යුතු හා එහි නොගැවසිය යුතු අතර, එම ප්‍රදේශයේ යම් භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ ඉවතලන දෙයක් තැන්පත් කිරීම, අවුල් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුත්තේ ය. කිසිම තැනැත්තෙක් විශේෂයෙන් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ප්‍රාදේශීය සභාව විසින් අවසර දෙනු ලැබුවහොත් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි යම් තහනම් කරන ලද අපද්‍රව්‍ය තැන්පත් කිරීම නොකළ යුත්තේ ය.

25. අනුමත කිරීමේ යම් කොන්දේසිවලට යටත්ව ලේකම්වරයාගේ සහ වයඹ පළාත් පරිසර අධිකාරියේ පූර්ව ලිඛිත අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තෙක් ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත පිහිටි යම් ඉඩමක් හෝ පහසුකමක් එයට පිටස්තර ස්ථානයක ජනනය වන්නාවූ අපද්‍රව්‍ය තැන්පත් කිරීම සඳහා සැපයීම හෝ භාවිතා කිරීම නොකළ යුත්තේ ය.

26. අපද්‍රව්‍ය බැහැර කරනු ලබන කවර ස්ථානයන් වුව ද එකී ස්ථානයට නැතහොත් ඉඩමට මායිම් තාප්පයක් හෝ ඒ සඳහා සුදුසු ආවරණයක් මගින් සීමා කර තිබිය යුතු අතර එකී ස්ථානයට හෝ ඉඩමට බැහැරලන කැලිකසල සුළඟ, ජලය වැනි කාරණා හේතු කොටගෙන යාබද ඉඩම් හෝ ප්‍රදේශ වෙත යොමු වීමට නොහැකි වන ආකාරයට පවත්වාගෙන යා යුතු ය.

27. (i) සභාපතිවරයා හෝ ඔහු විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකුට සියලු සාධාරණ වේලාවන්හී දී යම් පරිශ්‍රයකට ඇතුළත් වීමට සහ එහි හිමිකරු හෝ පදිංචිකරු මෙම අතුරු ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට අනුකූලව ක්‍රියාකරන්නේ දැයි පරීක්ෂාකර බැලීමට බලය ඇත්තේ ය.

(ii) එම පරිශ්‍රයේ හිමිකරු, පදිංචිකරු, භාරකරු, කළමණාකරු හෝ එහි වාසය කරන්නාවූ හෝ සේවය කරන්නාවූ යම් තැනැත්තෙක් සභාපතිවරයාට හෝ ඔහුගේ යම් බලයලත් නිලධාරියෙකුට අවශ්‍ය කරන තොරතුරු ඉදිරිපත් කළ යුත්තේ ය.

(iii) මෙම අතුරු ව්‍යවස්ථා යටතේ සභාපතිවරයාගේ ඔහුගේ බලයලත් නිලධාරියෙකුට සිය බලතල භාවිතා කිරීමෙහිලා කිසිම තැනැත්තෙක් බාධා නොකළ යුත්තේ ය.

*දණ්ඩන*

28. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ කවර හෝ වගන්තියක් උල්ලංඝනය කිරීම වරදකරු වන අතර එම වරද සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය යටතේ සඳහන් දණ්ඩන සීමාවන් යටතේ දඬුවම් ලැබිය යුතු යි.

*අර්ථ නිරූපණය*

29. මෙම අතුරු ව්‍යවස්ථාවන්හි කාර්යයන් සඳහා පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස,

"අපද්‍රව්‍ය හෝ ඝන අපද්‍රව්‍ය" යන්නෙන් ඒවා ඉවත දමූ තැනැත්තාට පරිභෝජන වටිනාකමක් නොමැති ද්‍රව්‍ය අදහස් වන අතර රොඩු, කසළ, වීථි ශුද්ධ කිරීමේ දී එකතුවන අපද්‍රව්‍ය, දූවිලි, පස්, මඩ සහ අළු ද අදහස් කෙරේ.

"ආහාර අපද්‍රව්‍ය" යන්නෙන් මිනිස් පරිභෝජනය සඳහා පාවිච්චියට ගත නොහැකි ආහාර ද්‍රව්‍ය අදහස් කෙරේ.

"උපද්‍රවකාරී අපද්‍රව්‍ය" යන්නෙන් මහජන සෞඛ්‍යයට හෝ පරිසරයට හානිදායක වන විෂ සහිත, දැවෙන සුළු, ප්‍රතික්‍රියා දක්වන සුළු, රෝග කාරක, විකිරණශීලී ස්වභාවයේ අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"එක් රැස් කිරීම" යන්නෙන් බලයලත් එක්රැස් කරන්නෙකු හෝ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නෙකු විසින් ප්‍රතිචක්‍රීකරණය, සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීමේ පහසුකම් සහ ප්‍රවාහනය කිරීම පිණිස අපද්‍රව්‍ය එකතු කිරීම අදහස් කෙරේ.

"කොම්පෝස්ට්" යන්නෙන් කාබනික අපද්‍රව්‍ය ක්ෂුද්‍රජීවී ජීර්ණයට ලක්වීමෙන් පසුව ලැබෙන අවසන් නිමැවුම අදහස් කෙරේ. එය පාංශු තත්වාරක්ෂකයක් ලෙස ක්‍රියාකළ හැකි හියුමස් ද්‍රව්‍යයකි.

සභාපතිවරයා :- පොල්පිතිගම ප්‍රාදේශීය සභාව සඳහා තේරීපත්වී ඇති සභාපතිවරයා

"ලේකම්" යන්නෙන් පොල්පිතිගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සම්බන්ධයෙන් වන විට ප්‍රාදේශීය සභා පනත යටතේ එම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සහ සංස්ථාපනය කරන ලද පොල්පිතිගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා අදහස් කෙරෙන අතර එම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට පත්කරන ලද යම් තැනැත්තෙකු සහ ප්‍රාදේශීය සභා පනත යටතේ ලේකම්වරයාගේ බලතල යුතුකම් හෝ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට බලය දෙනු ලැබූ සභාවේ යම් නිලධාරියෙකු එම නිලධාරියාට එම බලය දෙනු ලැබ ඇති ප්‍රමාණය ද ඊට ඇතුළත් වේ.

"ගබඩා කිරීම" යන්නෙන් හිමිකරුවකුගේ හෝ පදිංචිකරුවකුගේ පරිශ්‍රය ඇතුළත හෝ අනුමත පොදු එක්රැස් කිරීමේ ස්ථානයක අපද්‍රව්‍ය තැබීම හෝ තැන්පත් කිරීම අදහස් කෙරේ.

"ගාස්තුව" යන්නෙන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන කිසියම් ගාස්තුවක් අදහස් කෙරේ.

"ගෙවතු අපද්‍රව්‍ය" යන්නෙන් ගෙවත්තක පිහිටි ගස්වලින් හෝ පැළවලින් ඉවත් කෙරෙන ශාඛ කොටස් සහ ගෙවත්තකින් ඉවත් කරනු ලබන ගල්, පස් ආදිය අදහස් කෙරේ.

"ජෛව ජීර්ණනීය අපද්‍රව්‍ය" යන්නෙන් ක්ෂුද්‍ර ජීවී කාරකයන් මගින් දිරාපත් කරනු ලැබිය හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

"පොදු ස්ථානය" යන්නෙන් පාරක්, පිට්ටනියක්, පොදු ඉඩමක්, මාර්ග රක්ෂිතයක්, ක්‍රීඩා පිටියක්, පොදු ගොඩනැගිල්ලක්, සුසාන භූමියක්, බස් නැවතුම්පළක්, දුම්රිය ස්ථානයක්, ගඟක්, ඇළක්, දොළක්, විලක්, ජලාශයක්, පොකුණක්, තටාකයක්, කලපුවක්, අතු ගඟක්, ජල මාර්ගයක්, මුහුදු, මුහුදු වෙරළ හෝ මහජනතාව විසින් පොදුවේ පාවිච්චි කරනු ලබන වෙනත් ස්ථානයක් අදහස් කෙරේ.

"ප්‍රතිචක්‍රීකරණීය අපද්‍රව්‍ය" යන්නෙන් අපද්‍රව්‍ය තවදුරටත් අපද්‍රව්‍ය වශයෙන් හඳුනාගත නොහැකි වන පරිදි එහි ස්වරූපය වෙනස් කරමින් නව පාරිභෝජනය නිෂ්පාදනයන් කිරීමට යොදාගත හැකි අපද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රතිභාවිතාකරණීය අපද්‍රව්‍ය'' යන්නෙන් සේදීමෙන්, විෂබීජ නැසීමෙන් හෝ වෙනත් ක්‍රමයකින් පිරිසිදු කිරීමෙන් පසුව උපයෝගීකර ගත හැකි අප ද්‍රව්‍ය අදහස් කෙරේ.

''ප්‍රවාහනය'' යන්නෙන් මිනිස් සත්ව හෝ යාන්ත්‍රික බලයකින් ක්‍රියා කරන යම් ආකාරයේ ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගනිමින් අපද්‍රව්‍ය එක්රැස් කරනු ලබන ස්ථානයේ සිට ඒවා සැකසීම, පිරියම් කිරීම හෝ බැහැරලීම සඳහා ඇති ස්ථානය වෙත ගෙන යාම අදහස් කෙරේ.

''බක්කිය/බඳුන් හෝ වෙනත් බහාළුම්'' යන්නෙන් අතුරු ව්‍යවස්ථාවන්හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව අපද්‍රව්‍ය ගබඩා කිරීම, මුද්‍රාහැරීම, එක්රැස් කිරීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා භාවිතා කරනු ලබන යම් ආවරණයක් සහිත වූ බක්කියක්, බඳුනක් හෝ උරයක්, මල්ලක් හෝ වෙනත් බහාලුමක් අදහස් කෙරේ.

''බලයලත් එක්රැස් කරන්නා'' යන්නෙන් අපද්‍රව්‍ය එක්රැස් කිරීමට හෝ ලබාගැනීමට ලේකම්වරයාගෙන් අවසර පත්‍රයක් ලබා ගන්නා තැනැත්තෙකු අදහස් කෙරේ.

''බලයලත් නිලධාරි'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ වන රාජකාරි ඉටු කිරීමට හෝ කරගෙන යාමට අවස්ථාවෝචිතව ලේකම්වරයා හෝ සභාපතිවරයා විසින් ලිඛිතව බලය දෙනු ලැබූ යම් තැනැත්තෙකු අදහස් කෙරේ.

''මාරු කරන ස්ථානය'' යන්නෙන් සභාව විසින් මේ කාර්යය සඳහා නියම කරනු ලබන ස්ථානයක් අදහස් කෙරෙන අතර, ඒ ස්ථානයෙහි සිට යම් ප්‍රතිචක්‍රීකරණ, සැකසුම් කරන, පිරියම් කරන හෝ බැහැරලීම කරන පහසුකමක් වෙත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා අපද්‍රව්‍ය වඩා කුඩා ප්‍රමාණයේ වාහනවලින් වඩා ලොකු ප්‍රමාණයේ වාහනවලට මාරුකිරීම එහි දී සිදු කෙරේ.

''තැනැත්තා'' යන්නෙන් සංස්ථාගත නොවන සමාගමක් හෝ පුද්ගලයින්ගේ සමිතියක් හෝ මඩුල්ලක් හෝ යම් පුද්ගලයෙක් ද අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අපද්‍රව්‍ය එක්රැස් කරන්නා'' යන්නෙන් බක්කිවලින් හෝ බහාළුම්වලින් අපද්‍රව්‍ය අතුගා දැමීම, එක්රැස් කිරීම, ලබාගැනීම හෝ ඉවත් කිරීම සඳහා සභාව විසින් යොදවනු ලැබූ සේවකයෙකු හෝ මේ කාර්යයන් ඉටු කිරීමට සභාව සමග කොන්ත්‍රාත්තුවකට ඇතුළු වී සිටින තැනැත්තෙක් අදහස් කෙරේ.

''වෙන් කිරීම'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවන්හි යොදා ඇති ප්‍රභේදයන්ට අනුකූලව අපද්‍රව්‍ය විවිධ වර්ගවලට තෝරා වෙන් කිරීම අදහස් කෙරේ.

''සැකසීම'' යන්නෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනයට නිපැයුමක් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

''සභාව'' යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය'' යන්නෙන් ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශය අදහස් කෙරේ.

''සනීපාරක්ෂක බිම් පිරවීම'' යන්නෙන් ඒ හා ආශ්‍රිත සාමාජයීය, සෞඛ්‍ය සහ පාරිසරික බලපෑම් අවම කිරීමට ශ්‍රී ලංකාවේ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව අපද්‍රව්‍ය භූමියකට අවසාන වශයෙන් බැහැර කරලීම අදහස් කෙරේ.

''හිමිකරු හෝ පදිංචිකරු'' යන්නෙන් පරිශ්‍රයේ හිමිකරු හෝ හිමිකරු වෙනුවෙන් ඇටෝනි බලය දරන යම් තැනැත්තෙකු හෝ හිමිකරු විසින් සිය කර්මාන්තය, කර්මාන්ත ශාලා, වත්ත කළමණාකරණයට පත් කරන ලද නියෝජිතයෙකු හෝ භාරකරුවෙකු හෝ කුළියට ලබාගන්නා අයෙකු ඇතුළත් වන අතර, වෙනත් තැනැත්තෙකුගේ නියෝග යටතේ ක්‍රියා කරන කළමනාකරුවෙකු ඇතුළත් වේ.

''මෙම වගන්තියේ කාර්යයන් සඳහා කැනීම, ඉදිකිරීම හා කඩාදැමීම යන ක්‍රියාවක නියුතු සෑම තැනැත්තෙකු'' යන්නට සේවා යෝජකයෙකු විසින් එම සේවය සඳහා නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තෙකු ද ඇතුළත් වේ.

''ඉදිකිරීම් අපද්‍රව්‍ය'' යන්නට ඉදිකිරීමේ දී ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතයෙන් ජනනය වන්නාවූ පස්, මඩ, දූවිලි, හා අපද්‍රව්‍ය සහ යම් ඉදිකිරීමක් කඩාදැමීමේ දී ජනනය වන්නාවූ අපද්‍රව්‍ය ඇතුළත් වේ.

''ආරෝග්‍ය ශාලාව'' යන්නෙන් අදහස් කරන්නේ යම් රෝගයකින් හෝ දුබලතාවයකින් පෙලෙන තැනැත්තෙක් හෝ සතුන් පිළිගැනීම, ඔවුන්ට සාත්තු කිරීම සහ ප්‍රතිකාර කිරීම සඳහා යොදාගනු ලබන හෝ යොදාගැනීමට අපේක්ෂා කරන යම් පරිශ්‍රයක් (කුමන ආකාරයෙන් විස්තර කරණු ලැබුව ද) වන අතර, සාත්තු නිවාසයක්, සායනයක්, වෛද්‍ය මධ්‍යස්ථානයක්, මාතෘ නිවාසයක් සහ සත්ව රෝහලක්/සත්ව සායන ඊට ඇතුළත් වේ.

''උපද්‍රවකාරී ආරක්ෂණ ද්‍රව්‍ය'' යන්නෙන් අදහස් කරන්නේ සායනික අපද්‍රව්‍ය, ශරීර කොටස්, වැදෑ මස්, ආසාදනය වන සුළු හා අතිශයෙන් ආසාදනය වන සුළු අපද්‍රව්‍ය හා උල් කටුය.

''කාර්යාලය'' යන්නට 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලය සේවා නියුක්තිකයන් පිළිබඳ පනතේ (129 වන අධිකාරය) දී ඇති අර්ථයම ඇති.

''සාප්පුව'' යන්නෙන් අදහස් කෙරෙන්නේ තොග හෝ සිල්ලර වෙළඳාම සඳහා භාණ්ඩ තබා ඇති ස්ථානයක් වන අතර ආහාර පාන අලවියට තබා ඇති ස්ථානයක් සහ බාබර් සාප්පුවක් හෝ රූපලාවන්‍ය සැලෝන් එකක් පවත්වාගෙන යනු ලබන ස්ථාන ද මීට ඇතුළත් වේ.

මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.

09-964

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

### පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්ති සමඟ කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09 වැනි වගන්තියේ (03) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ජයසිංහ මුදියන්සේලාගේ නිමල් ජයසිංහ වන මම ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ආදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ අතුරු ව්‍යවස්ථා පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා බලාත්මකව ක්‍රියාත්මක විය යුතු බවට 2016.02.26 දිනැති අංක 01-33 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ජේ. එම්. එන්. ජයසිංහ,<br>
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය,<br>
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,<br>
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 31 වැනි දින,<br>
පොල්ගහවෙල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තියේ *(අ)* ඡේදය සමඟ කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 02 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබූ 2015.08.31 වැනි දින අංක 1930/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *(අතිවිශෙෂ) ගැසට් පත්‍රයේ IV(අ)* වැනි කොටසේ පලකරනු ලැබුවා වූ ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, ආදහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යන අතුරු ව්‍යවස්ථා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව පොල්ගහවෙල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ක්‍රියාත්මක විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව මා තීරණය කරමි.

***ප්‍රාදේශීය සභාවල කාරක සභා ඇති කිරීම, රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව***

1. මෙම අතුරු ව්‍යවස්ථාව '' ප්‍රාදේශීය සභාවේ කාරක සභා ඇති කිරීම, ඒවායේ රැස්වීම් පැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කාරක සභාවන් සහ ප්‍රාදේශීය සභාවන් විසින් කලින් කල තීරණය කරනු ලබන කිසියම් නිශ්චිත කාර්යයක් සඳහා වන කාරක සභා ඇති කිරීම සහ එකී කාරක සභා සඳහා සාමාජිකයින් පත්කිරීම ප්‍රාදේශීය සභාව විසින් කරනු ලැබිය හැකිය.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පහත සඳහන් කාර්යයන් සඳහා වන කාරක සභා හතරක් ඇති කිරීම ප්‍රාදේශීය සභාවේ කාර්යය විය යුතුය.

(i) මුදල් හා ප්‍රතිපත්ති සැකසීම,
(ii) නිවාස සහ ප්‍රජා සංවර්ධනය,
(iii) කාර්මික සේවා,
(iv) පරිසරය සහ පහසුකම්.

3. ඉහත 2 වන වගන්තියේ සඳහන් ආකාරයට පත් කරනු ලබන එක් එක් කාරක සභාවේ සාමාජිකයන් පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) ප්‍රාදේශීය සභාවේ සභික සංඛ්‍යාවෙන් 1/3 කට නොඅඩු සභික සංඛ්‍යාවක්; හා
(ආ) අවම වශයෙන් කාරක සභාවට අදාළ වන විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීණත්වය දක්වන සහ බල ප්‍රදේශය තුළ පදිංචි තැනැත්තන් තිදෙනෙක් ; හා
(ඇ) ඉහත (අ) හා (ආ) හි සංඛ්‍යාව සමග ගත් කළ 25% ක නියෝජනයක් ඇතිවන පරිදි ප්‍රදේශයේ ඒ පිළිබඳ උනන්දුවක් දක්වන කාන්තාවන් සඳහා අවම අවස්ථාව සැළසිය යුතු ය.
(ඈ) 3 *(ඇ)* හි කුමක් සඳහන් වුව ද ප්‍රමාණවත් කාන්තාවන් සංඛ්‍යාවක් නොවුනහොත් ඉදිරිපත් වන සාමාජිකයින් මගින් එය කළ හැකිය.

4. (අ) 3 වන වගන්තියේ සඳහන් සාමාජිකයන් පත්කිරීම සඳහා වාර්ෂිකව දෙසැම්බර් මාසයේ පවත්වනු ලබන මහා සභා රැස්වීමේ දී හෝ ඊට පෙර යෝජනා සම්මුතියකින් තෝරා පත්කර ගත යුතු ය.

(ආ) ඉහත 4 (අ) වගන්තිය අනුව සාමාජිකයින් තෝරාපත් කර ගැනීමට නොහැකි වූයේ නම් ඊළඟට එළඹෙන පළමුවන මහ සභා රැස්වීමේදීම අදාළ සාමාජිකයින් තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) එක් එක් කාරක සභාවට තෝරා පත්කරගනු ලැබූ කිසියම් සාමාජිකයකු ඉල්ලා අස්වීම නිසා හෝ අදාළ සාමාජිකයා ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන විට ඔහුගේ ධුරය අවසන් වීම නිසා හෝ සාමාජිකයකුගේ මරණය හෝ වෙනත් යම් හේතුවක් නිසා කාරක සභාවේ සාමාජිකත්වය අවසන් වීමෙන් ඇතිවන පුරප්පාඩුවක් සඳහා එම පුරප්පාඩුව ඇති වූ දිනයෙන් පසුව පවත්වනු ලබන ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමකදී වෙනත් යම් සාමාජිකයකු තෝරා පත්කර ගැනීම එම සභාවේ කාර්යය විය යුතු ය.

5. (අ) එක් එක් කාරක සභාවට සභාපතිවරයෙකු බැගින් විය යුතු අතර, කාරක සභාවේ ප්‍රථම රැස්වීමේදී කාරක සභා සාමාජිකයන්ගේ ඡන්දයෙන් ඔහු තෝරා පත්කර ගත යුතු ය.

(ආ) කාරක සභාවේ සභාපති ධුරයට තෝරා පත්කරගනු ලබන තැනැත්තා ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් ඒ අවස්ථාවේ ධුරය දරන තැනැත්තකු විය යුතු ය.

(ඇ) කාරක සභාවේ සභාපතිවරයා ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ මියයාම හෝ ප්‍රාදේශීය සභාවේ සභික ධුරයෙන් ඉවත් වීම හේතුවෙන් එකී කාරක සභාවේ ඔහු දරන සභාපති ධුරය අවසන් විය යුතු අතර, එකී සිදුවීමෙන් පසුව එළඹෙන කාරක සභාවේ පළමු රැස්වීමේදී වෙනත් කාරක සභා සභාපතිවරයෙකු තෝරා පත්කර ගැනීම කාරක සභාවේ කාර්යය විය යුතු ය.

6. ඉහත 5 වන වගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, මුදල්, මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වය හා සභාපති ධුරය නිල බලයෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට හිමිවිය යුතු ය.

7. කිසියම් කාරක සභා රැස්වීමකට එකී කාරක සභාවේ සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් අතරින් —

(අ) ප්‍රාදේශීය සභාවේ සභිකයන් රැස්වීමට පැමිණ ඇත්නම් ඔවුන් අතුරින් කිසියම් සභිකයකු ; හෝ
(ආ) එම රැස්වීමට ප්‍රාදේශීය සභාවේ සභිකයන් කිසිවකු පැමිණ නොමැති නම් වෙනත් සාමාජිකයන් අතුරින් තැනැත්තකු පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්තෙන් එම කාරක සභා රැස්වීමේ සභාපතිවරයා ලෙස තෝරා පත්කර ගත යුතු ය.

8. (අ) එක් එක් කාරක සභාවේ රැස්වීමේ ගණපූරණය ඒ කාරක සභාවට තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් සංඛ්‍යාවෙන් අවමය 1/3 විය යුතු අතර, එකී 1/3 සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන විට පූර්ණ සංඛ්‍යාව හා භාගයට ආසන්න ඉහළ සංඛ්‍යාව ගණපූරණය විය යුතු ය.

(ආ) යම් කාරක සභාවකට පත්කරන ලද සාමාජිකයකු අඛණ්ඩව කාරක සභා රැස්වීම් වාර 03ක් සඳහා නොදන්වා සහභාගී නොවී සිටීම එම සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි වීමට හේතු වන්නේ ය.

9. (අ) සෑම කාරක සභාවක්ම අවම වශයෙන් මාසයකට එක් වතාවක් බැගින් රැස්වීම් පැවැත්විය යුතු ය.

(ආ) සුවිශේෂී හේතුවක් මත කාරක සභාවේ විශේෂ කාරක සභා රැස්වීමක් පැවැත්විය යුතු යැයි කාරක සභාවේ සභාපතිවරයා අදහස් කරන්නේ නම් ඒ පිළිබඳ සාමාජිකයන් දැනුවත් කිරීමෙන් පසු කිසියම් මාසයක් තුළ කැඳවීම් කළ හැකි ය.

(ඇ) කාරක සභාවේ සාමාජිකයන් සම්බන්ධයෙන් 1/3 කට නොඅඩු සංඛ්‍යාවක් විසින් කාරක සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අනුව කාරක සභාවේ විශේෂ සභා රැස්වීමක් කැඳවීම කාරක සභාවේ සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ඈ) යම් රැස්වීමක් පැවැත්වීම නියම කරන දිනට අවමය දින 03 කට වත් පෙර සාමාජිකයන් දැනුවත් කිරීම කාරක සභා ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

10. (අ) මුදල් හා ප්‍රතිපත්ති පිළිබඳ කාරක සභාවේ ලේකම් ධුරය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් දැරිය යුතු ය. ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා නොමැති යම් අවස්ථාවක දී එකී කාරක සභාවේ ලේකම් ධුරය තත්කාලයේ ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ කාර්යය හා කර්තව්‍ය ඉටුකරනු ලබන වෙනත් යම් නිලධාරියකු විසින් දැරිය යුතු ය.

(ආ) මුදල් හා ප්‍රතිපත්ති සකස් කිරීම පිළිබඳ කාරක සභාව හැර සෙසු කාරක සභාවන්හි ලේකම් ධුරය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ නිර්දේශය මත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් පත් කරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියකු වෙත පැවරිය යුතු ය.

11. (අ) එක් එක් කාරක සභාවේ ලේකම්වරයා විසින් එකී කාරක සභාවේ රැස්වීමට සහභාගී වූ සාමාජිකයන්ගේ පැමිණීමේ ලේඛනය පවත්වාගෙන යාම කළ යුතු අතර, කාරක සභාවේ න්‍යාය පත්‍රය මහා සභාවේ න්‍යාය පත්‍රයට අනුරූපී විය යුතු ය.

(ආ) එක් එක් කාරක සභාවේ රැස්වීමේ දී ගනු ලබන තීරණ ඇතුළත් වාර්තාවක් පවත්වාගෙන යාම ඒ ඒ කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එය අධීක්ෂණය කිරීම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයාගේ වගකීම විය යුතු ය. පසුව එළඹෙන රැස්වීමේ දී ඒ වාර්තාව ස්ථිර කිරීමෙන් අනතුරුව කාරක සභාවේ සභාපතිවරයා විසින් ඊට අත්සන් තබා සහතික කළ යුතු ය.

(ඇ) කිසියම් කාරක සභාවක් විසින් යම් කාරණයක් සම්බන්ධයෙන් ගනු ලබන අවසාන තීරණය ප්‍රාදේශීය සභාවේ ඊළඟ මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා වෙත යොමු කිරීම කාරක සභාවේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

(ඈ) කිසියම් කාරණයක් සම්බන්ධයෙන් තීරණයක් ගෙන ක්‍රියා කිරීමට එක් කාරක සභාවකට ප්‍රාදේශීය සභාව විසින් බලය පවරනු ලැබ ඇති යම් කාර්යයක් සම්බන්ධයෙන් ගනු ලබන තීරණ ප්‍රාදේශීය සභාවේ දැනගැනීම සඳහා සභාගත කළ යුතු අතර, සෙසු තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබා ගත යුතු ය.

12. කිසියම් කාරක සභාවක රැස්වීමේ දී ගනු ලැබිය යුතු යම් තීරණයක් සඳහා පරීක්ෂාකර බැලීමට අවශ්‍ය සභාව සතු ලිපිගොනු, ලිපිලේඛන සහ පොත් පත් එකී කාරක සභා රැස්වීමට ගෙන්වා ගැනීමට කාරක සභාවට බලය තිබිය යුතු ය.

13. වරිපනම් පැනවීම, බදු පැනවීම, ගාස්තු නියම කිරීම, කිසියම් මුදලක් අයකර ගැනීම හා කිසියම් ණයක් ලබාගැනීම යන කාර්යයන් හැර ප්‍රාදේශීය සභාවට පැවරී ඇති වෙනත් කාර්යයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාව විසින් කලින් කල කාරක සභාවලට පවරනු ලැබිය හැකි ය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ කොටසේ අතුරු ව්‍යවස්ථාවේ :

''කාරක සභා'' යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවන වගන්තියේ සඳහන් කාරක සභා ද ;

''සභික'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභිකයකු ද ;

''සභාව'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද ;

''ලේකම්'' යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා හෝ ලේකම්වරයාගේ කාර්යය හෝ කර්තව්‍ය ඉටු කරන යම් තැනැත්තකු ද ;

අදහස් විය යුතු ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

### වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මේ අතුරු ව්‍යවස්ථාව ''වරිපනම් බදු සහ ගාස්තු පැනවීම, අයකරගැනීම සහ ලබාගැනීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු සහ කර්මාන්ත හෝ ව්‍යාපාර පිළිබඳ වාර වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (අ) ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පිහිටි නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලබන සෑම තැනැත්තෙකුම විසින්, එකී නිශ්චල දේපළ අත්පත් කර ගනු ලැබූ දින සිට මාස තුනක් ඇතුළත.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ආකාරයෙන් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන කවර හෝ තැනැත්තෙකු විසින් එකී අයදුම්පත්‍රය සමග, නොතාරිස්වරයෙකු විසින් සහතික කරනු ලැබූ පහත සඳහන් ලේඛනවල ඡායාස්ථිතික පිටපත් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(I) එකී දේපළෙහි හිමිකම් ඔප්පුව.

(II) බලයලත් මිනින්දෝරුවරයෙකු විසින් අඳිනු ලැබූ එකී දේපළෙහි ඔප්පුවට අදාළ පිඹුරු පත.

(ඇ) අදාළ දේපළෙහි හිමිකම් ඔප්පුව හා ඊට අදාළ දින 14 ක් ඇතුළත ලබාගත් පත්ඉරු සටහන් අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

3. මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනය වන විටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි කිසියම් නිශ්චල දේපළක් අත්පත් කර ගනු ලැබ ඇති සෑම තැනැත්තෙකු ම විසින් මේ අතුරු ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට අවුරුද්දක් ගත වීමට මත්තෙන් 2 වන වගන්තියේ නියමකර ඇති ආකාරයෙන් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

4. (අ) මේ අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකු විසින් තමා සතුව පවතින කවර හෝ නිශ්චල දේපළ සහ හෝ එහි ඇති ගොඩනැගිල්ලක් යොදවනු ලැබ ඇති කාර්යය වෙනස් කරනු ලැබ ඇත්නම් එකී වෙනස් කිරීම සිදුකර මාසයක් ගතවීමට මත්තෙන් ඒ බව ලේකම්වරයාට ලිඛිත නිවේදනයක් මගින් දන්වනු ලැබීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු ය.

(ආ) මේ අතුරු ව්‍යවස්ථාවේ නියම කර ඇති ආකාරයට ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකු විසින් තමා සතුව පවතින කවර හෝ ;

(I) නිශ්චල දේපළක අනු බෙදුම් පිඹුරක් සකස් කිරීමේ දී,
(II) නිශ්චල දේපළක් වන කිසියම් ඉඩමක් මත අළුතෙන් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර,
(III) නිශ්චල දේපළක් වන කිසියම් ගොඩනැගිල්ලක ආකෘතියේ වෙනසක් වන ආකාරයෙන්

(1) අළුතින් කොටසක් එකතු කරනු ලබන්නේ නම්, හෝ
(2) පවතින කොටසක් කඩා ඉවත් කරනු ලබන්නේ නම්, හෝ
(3) පවතින කොටසක් කඩා ඉවත් කර අළුතින් කොටසක් එකතු කරනු ලබන්නේ නම්, හෝ
(4) සම්පූර්ණ ගොඩනැගිල්ලම කඩා ඉවත් කර වෙනත් ගොඩනැගිල්ලක් ඉදි කරනු ලබන්නේ නම් හෝ එකී කවර හෝ සිදුවීමක් සිදු කිරීමට පෙර, ඒ සඳහා වන අනුමැතියක් ප්‍රාදේශීය සභාවෙන් ලබාගත යුතු ය.

(ඇ) ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචිය ලබා ඇති යම් නිශ්චල දේපළ හිමියෙකුගේ ස්ථිර පදිංචි ලිපිනය වෙනස් වී ඇති විටක, එකී වෙනස් වීම සිදුවී දින දහහතරක් ඇතුළත ඒ පිළිබඳව වන ලිඛිත දැන්වීමක් ලේකම්වරයා වෙත භාර දීම එකී නිශ්චල දේපළ හිමියාගේ කාර්යය විය යුතු අතර ඒ ලිඛිත දැන්වීම ලැබුණු වහාම නිශ්චල දේපළ හිමියන් ලියාපදිංචි කිරීමේ ලේඛනය, ඒ අනුව සංශෝධනය කිරීම සහ එසේ සංශෝධනය කරනු ලැබ ඇති බව එකී නිශ්චල දේපළ හිමියාට ලිඛිතව දැනුම් දීම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

5. මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් ම සම්බන්ධයෙන් වන නිශ්චල දේපළ හිමියන් හා ඔවුන් සතුව පවතින නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනයක්, මේ කොටසේ දෙවන උපලේඛනයේ ආකෘතියට සාරානුකූලව පිළියෙල කර පවත්වාගෙන යාම ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය.

6. (අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන කවර හෝ ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හෝ විකිණීමක් මත හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ප්‍රාදේශීය සභාව විසින් පනවනු ලබන යම් බද්දක් හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත අයකරනු ලබන ගාස්තුවක් හෝ අයකර ගැනීමේ දී, ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු එකී බද්ද හෝ බලපත්‍ර ගාස්තුව ගණන් බැලීම සඳහා අවශ්‍ය කරන්නා වූ එකී ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ හෝ විකිණීමේ කටයුතු කරගෙන යාමේ දී,

(I) කිසියම් වර්ෂයක කාලයක් තුළ ලද ලැබීම් ප්‍රමාණය, හෝ
(II) කිසියම් වර්ෂයක කාලයක් තුළ ව්‍යාපාර පිරිවැටුම, හෝ
(III) කිසියම් වර්ෂයක කාලයක් තුළ උපයනු ලැබිය හැකි ලාභය, හෝ
(IV) කිසියම් විකිණීමක් මගින් ලැබුණු මුදල, හෝ

සාම විනිසුරුවරයෙකු හෝ දිවුරුම් කොමසාරිස්වරයෙකු ඉදිරියේ සහතික කළ වාර්තාවක් මගින් තහවුරු කරන ලෙස එකී කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ හිමිකරුගෙන් හෝ කළමනාකරුගෙන් ලේකම්වරයා විසින් ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඉල්ලා සිටිනු ලැබීම නීත්‍යානුකූල විය යුතු ය.

(ආ) ලේකම්වරයා විසින් එවනු ලබන (අ) ඡේදය යටතේ වන දැන්වීමක් ලැබූ කවර හෝ තැනැත්තෙකු විසින් එකී දැන්වීම තමාට ලැබුණු දින සිට දින දහ හතරක් ඇතුළත එකී දැන්වීම මගින් ඉල්ලා ඇති වාර්තා ලේකම්වරයා වෙත සැපයීම කළ යුතු ය.

7. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතුය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහේස්ත්‍රාත් අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ :

''කළමනාකරු'' යන්නෙන් මේ අතුරු ව්‍යවස්ථාවේ අදාළ වන කිසියම් දේපළක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක නීත්‍යානුකූල අයිතිකරු හෝ එකී අයිතිකරු වෙනුවෙන් පෙනී සිටින වෙනත් කිසියම් නියෝජිතයකු හෝ එකී දේපළ හෝ ව්‍යාපාරය හෝ කර්මාන්තය කළමනාකරනය පවරනු ලැබ ඇති කිසියම් තැනැත්තකු ද,

''නිශ්චල දේපළ'' යන්නෙන්, කිසියම් ඉඩමක් සහ හෝ ගොඩනැගිල්ලක් හෝ කිසියම් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් අදහස් විය යුතු ය.

''දේපළ හිමිකරු'' යන්නෙන්, කිසියම් නිශ්චල දේපළක තනි අයිතිකරු වන යම් තැනැත්තෙක් හෝ එකී නිශ්චල දේපළ තනි අයිතිකරුවෙකුට වැඩි ගණනක අයිතිකරුවන් සිටින විට ඒ එක් එක් අයිතිකරු වෙන් වෙන්ව හා සාමූහිකව එකී දේපළෙහි හිමිකරු වශයෙන් අදහස් විය යුතු අතර තත් කාලයේ දී එකී දේපළෙහි පදිංචිව සිටින හෝ එකී දේපළෙහි භාරකාරත්වය දරන හෝ වෙනත් කිසියම් තැනැත්තෙකු ද ඊට ඇතුළත් විය යුතු ය.

''ලේකම්වරයා'' යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා ද,

''වාර වාර්තා'' යන්නෙන් හය වැනි වගන්තියේ සඳහන් කිසියම් නිශ්චිත කාලයකට අදාළ වාර්තා ද,

''සභාව'' යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාව ද,
අදහස් විය යුතු ය.

**පළමුවැනි උපලේඛනය**

*2 වැනි වගන්තිය (අ) ඡේදය*

.................................. ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ පවතින නිශ්චල දේපළ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම,
(එක් එක් දේපළ වෙනුවෙන් වෙන වෙනම ආකෘති පත්‍රයක් බැගින් ඉදිරිපත් කළ යුතු ය)

1. *(අ)* දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ නම/නම් : 1. ..................................................
2. ..................................................
3. ..................................................

*(ආ)* දේපළ හිමිකරුගේ/ හිමිකරුවන්ගේ ස්ථිර ලිපින(යන්)‍: 1. ..................................................
2. ..................................................
3. ..................................................

*(ඇ)* දුරකතන අංකය : ..................................................

*(ඈ)* දේපළ පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අංකය හා නම : ..................................................

*(ඉ)* දේපළ පිහිටි වීථියේ හෝ ගමේ නම : ..................................................

*(ඊ)* වරිපනම් අංකය : ..................................................

*(උ)* ඔප්පුවේ අංකය : ..................................................

*(ඌ)* භූමි ප්‍රමාණය : අක්කර : ..................... රූඩ් : ................. පර්චස් : ....................... (හෙක්ටයාර් : ................)

*(එ)* නොතාරිස්තැනගේ නම/සහ ලිපිනය : ..................................................

2. ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ නම/පත්ඉරු අංකය : ..................................................
..................................................

3. *(අ)* දේපළ ඉඩමක් වන විට එකී දේපළ මත කවර හෝ ගොඩනැගිල්ලක් ඉදිකර තිබේද ? ඔව්/නැත

*(ආ)* පිළිතුර ''ඔව්'' නම් එකී ගොඩනැගිල්ල, තනි ගොඩනැගිල්ලක් ද නැතහොත් සහාධිපත්‍ය ගොඩනැගිල්ලක් ද යන වග?
..................................................

4. දේපළ අත්පත් කර ගනු ලැබූ දිනය : ..................................................

5. දේපළ පාවිච්චි කරන කාරණය : නේවාසික/වෙළෙඳ හෝ වාණිජ කාර්යය.

6. සභාව අනුමත කළ ගොඩනැගිලි සැළසුමේ අංකය : ..................................................

7. ඉදිරිපත් කරනු ලබන හිමිකම් සහතිකයේ

*(අ)* දිනය : ..................................................

*(ආ)* නොතාරිස්වරයාගේ නම : ..................................................

*(ඇ)* නොතාරිස්වරයාගේ ලිපිනය : ..................................................

දිනය : ........................ ..................................................................,
දේපළ හිමියාගේ අත්සන.

*දෙවන උපලේඛනය*
*5 වන වගන්තිය*

................................**ප්‍රාදේශීය සභාව**

නිශ්චල දේපළ ලියාපදිංචි කිරීමේ ලේඛනය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | වර්ෂය හා දිනය | ලියාපදිංචි කළ |
| | | | | | | අංකය | |
| | | | | | | නම/නම් | දේපළ හිමිකරුගේ |
| | | | | | | ස්ථිර පදිංචි ලිපිනය/ලිපිනයන් | |
| | | | | | | දේපළ පිහිටි වීථිය/ගම | |
| | | | | | | වරිපනම් අංකය | |
| | | | | | | ග්‍රා.සේ.නි. වසමේ අංකය හා නම | |
| | | | | | | ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්) | |
| | | | | | | ඔප්පුවේ අංකය | |
| | | | | | | ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ නම/පත්‍ඉරු අංකය | |
| | | | | | | නොතාරිස්තැනගේ නම හා ලිපිනය | |
| | | | | | | ඉඩමක් ද නැතහොත් ගොඩනැගිල්ලක් ද යන වග | |
| | | | | | | ගොඩනැගිල්ලක් නම් අවසර පත්‍රයේ අංකය | |
| | | | | | | දිනය | ඉදිරිපත් කරනු ලබන හිමිකම් සහතිකයේ |
| | | | | | | නොතාරිස්වරයාගේ නම | |
| | | | | | | නොතාරිස්වරයාගේ ලිපිනය | |
| | | | | | | දේපළ අත්පත් කරගත් දිනය | |
| | | | | | | දේපළ පාවිච්චි කරන කාරණය | |
| | | | | | | විෂය භාර නිලධාරියාගේ අත්සන | |
| | | | | | | ලේකම්ගේ අත්සන හා දිනය | |

**ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර විධිමත් කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව මගින් කුමක් ප්‍රකාශ වුව ද 1946 අංක 57 දරන පොදු සුසාන සහ පුද්ගලික සුසාන පිළිබඳ ආඥා පනතේ ඇති විධිවිධාන හා අනනුකූල නොවිය යුතු ය.

3. *(අ)* සභාපතිවරයා හෝ බලයලත් නිළධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් නොමැතිව ප්‍රාදේශීය සභාවට අයත් කිසියම් ආදහනාගාරයක කවර හෝ මෘත ශරීරයක් ආදහනය නොකළ යුතු ය.

   *(ආ)* මියගිය යම් තැනැත්තෙකුගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත යටතේ මහෙස්ත්‍රාත්වරයෙකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයෙකු විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබ, එකී පරීක්ෂණය අවසානයේ මෘත දේහය ආදහනය කිරීමට එකී මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා අවසරයක් දී ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදහනය කිරීමට භාර ගැනීම හෝ ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම හෝ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

   *(ඇ)* මියගිය යම් තැනැත්තෙකුගේ මරණ සහතිකයේ 7 වන තීරුවේ "මරණයට හේතුව හා භූමදාන හෝ ආදාහනය කළ ස්ථානය" යන්නෙහි, ප්‍රාදේශීය සභාවේ ආදහනාගාරය නම් කර සඳහන්ව ඇත්තේ නම් මිස, එකී මෘත දේහය ආදහනය කිරීමට භාර ගැනීම හෝ ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් නොකළ යුතු ය.

   *(ඈ)* සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් වාර්ෂිකව තම බල ප්‍රදේශයේ පවතින ආදහනාගාර පිහිටි ස්ථානය හා ලිපිනය දැක්වෙන ලේඛනයක් දිස්ත්‍රික් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

4. *(අ)* මෘත ශරීරයක් ආදහනය කිරීමට අයකරන ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මතයක් මගින් නියම කරනු ලැබිය හැකි අතර එවැනිම යෝජනා සම්මතයක් මගින් එකී ගාස්තු කලින් කල සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේය.

   *(ආ)* ඉහත (අ) ඡේදය යටතේ පනවනු ලබන හෝ කලින් කල සංශෝධනය කරන ගාස්තු ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර ආදහනාගාරය වෙන්කරවා ගැනීමට අයදුම්පත් භාරගන්නා ස්ථානයේ සහ ආදහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම ද කළ යුතුය.

   *(ඇ)* මෘත ශරීරයක් ආදහනය කිරීමට අයකරන ගාස්තු මෙහි පළමුවන උපලේඛනයේ දැක්වෙන වර්ගීකරණය යටතේ පනවනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

5. 3 වන වගන්තියේ දැක්වෙන අවසර පත්‍රයක් ලබා ගැනීම අපේක්ෂා කරන (මෙහි මින්මතු "ඉල්ලුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන) යම් තැනැත්තෙකු මෙහි පහත දැක්වෙන ලේඛන සමග මෙහි දෙවන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ අදාළ ප්‍රාදේශීය සභාවෙන් ලබාගත් ඉල්ලුම් පත්‍රයක් සභාපතිවරයා හෝ ආදහනාගාර භාරකරු නොවන බලයලත් නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

   *(අ)* ඉල්ලුම්කරුගේ අනන්‍යතාවය තහවුරු කිරීමට අදාළ කරගත හැකිවනු පිණිස

   (i) ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත, හෝ
   (ii) ඉල්ලුම්කරුගේ රියදුරු බලපත්‍රය හෝ
   (iii) ඉල්ලුම්කරුගේ වලංගු විදේශ ගමන් බලපත්‍රය යන ඒවායින් එකක් ඉදිරිපත් කිරීම මගින්

   *(ආ)* මියගිය තැනැත්තාගේ මරණ සහතිකය හෝ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41.1 (ආ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මරණ දැන්වීම හෝ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ඊ - 24 ආකෘතිය.

   *(ඇ)* මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත යටතේ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්, එකී පරීක්ෂණය පවත්වන ලද මහෙස්ත්‍රාත්වරයා හෝ හදිසි මරණ පරීක්ෂකවරයා විසින් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41(ඉ) ඡේදය යටතේ මෘත ශරීරය ආදහනය කිරීමට අවසර දෙමින් නිකුත් කළ සහතිකය හෝ අජීවී උපතකින් බිහිකළ මෘත ශරීරයක් නම් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 43(ආ) ඡේදය යටතේ නිකුත් කළ සහතිකය.

6. මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ඉල්ලා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත්‍රයක් මත අවසර පත්‍රයක් නිකුත් කිරීමට තීරණය කරන ලද්දේ නම් එවැනි අයදුම්පත් ලැබෙන අනු පිළිවෙල අනුව මෙහි තුන්වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කළ ලේඛනයක ලේඛනගත කිරීම සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ කාර්යය වන්නේ ය. මේ ලේඛනය අයදුම්පත් භාරගන්නා ප්‍රාදේශීය සභාව කාර්යාලයයේ පවත්වාගත යුතු ය.

7. *(අ)* ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයකට අනුව 3 වන වගන්තියේ විධිවිධානයන්ට පටහැනි නොවන අයුරින් යම් මෘත ශරීරයක් ආදහනය කිරීම සඳහා තීරණය කරන ලද්දේ නම්, 4 වන වගන්තියට අනුව පනවන ලද නියමිත ගාස්තුව අයකර ගැනීමෙන් පසුව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ සඳහා වන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය. එකී අවසර පත්‍රයට අනුව ආදහනය කිරීමට නියමිත මෘත ශරීරය ආදහනාගාර භාරකරු වෙත ගෙනැවිත් භාරදිය යුතු දිනය හා වේලාව එකී අවසර පත්‍රයෙහි පැහැදිලිව සටහන් කර තිබිය යුතු ය.

*(ආ)* 3 වන වගන්තියේ සඳහන් කරුණු සම්පූර්ණ නොවීම මත ආදහනය කිරීම සඳහා මෘත ශරීරයක් භාර නොගන්නේ නම්, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඊට හේතු වූ කරුණු ද සමග ඒ බව ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් වන අවස්ථාවේ දී ම ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

8. *(අ)* ආදහනය කිරීම සඳහා සතියේ සෑම දිනකම පෙරවරු 7.00 සිට පස්වරු 7.00 දක්වා කාලය ඇතුළත මෘත ශරීර භාර ගැනීම කළ හැකිය. මෘත දේහ ආදහනය කරනු ලබන වේලාවන් ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ තීරණය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*(ආ)* ආදහනාගාර පරිශ්‍රයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක ආදහන කටයුතු සිදු කරනු ලබන කාලසටහන දෛනිකව ප්‍රදර්ශනය කළ යුතු ය.

9. නිකුත් කළ අවසර පත්‍රයේ නිරූපිත වේලාවට හෝ ඊට පෙර මෘත දේහය ආදහනාගාර භාරකරුට භාරදිය යුතු ය. එකී වේලාවට මෘත දේහය භාර දීමට ප්‍රමාද වීම හේතුවෙන් ඉල්ලුම්කරුට හෝ මියගිය තැනැත්තාගේ අයිතිවාසිකම් ඇති වෙනත් යම් තැනැත්තකුට සිදුවන යම් අපහසුතාවයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව, සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා වගකීමට යටත් නොවිය යුතු ය.

10. සෑම ආදහනාගාරයකම ආදහනය කරන ලද එක් එක් මෘත දේහය සම්බන්ධයෙන් සිව්වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද ලේඛනයක් ආදහනාගාර භාරකරු විසින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

11. *(අ)* කිසියම් මෘත දේහයක් ආදහනය කිරීමෙන් පසු එකී මෘත දේහය භෂ්මාවශේෂ ලබා ගැනීමට ඉල්ලුම්කරු අදහස් කරන්නේ නම් ඒ බව දෙවන උපලේඛනයේ සඳහන් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු අතර මෘත දේහය ආදහනය කිරීම සඳහා බාරදෙනු ලබන අවස්ථාවේ දී භෂ්මාවශේෂ බහාලීම පිණිස ඒ සඳහා ප්‍රමාණවත් භාජනයක් ආදහනාගාර භාරකරු වෙත සැපයීම ඉල්ලුම්කරුගේ කාර්යය විය යුතු ය. සෑම මෘත දේහයක්ම ආදහනය කර පැය හැත්තෑ දෙකක් ගතවීමට මත්තෙන් ඉල්ලුම්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් එකී මෘත දේහයේ භෂ්මාවශේෂ භාරගත යුතුය.

*(ආ)* එසේ වුව ද ඉල්ලුම්කරුගේ ලිඛිත ඉල්ලීමක් මත සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියා විසින් එකී භෂ්මාවශේෂ ආදහනාගාර භාරකරුගේ භාරයේ තබා ගන්නා කාල සීමාව දීර්ඝ කිරීම කරනු ලැබිය හැකිය. මෙසේ දීර්ඝ කරනු ලැබිය හැකි සම්පූර්ණ කාලය දින හතක් නොඉක්මවිය යුතුය.

*(ඇ)* එසේ භෂ්මාවශේෂ ඉවත්කර ගැනීමට ඉඩදෙන ලද කාලය අවසන් වීමෙන් පසුව ද ඉවත්කර නොගත් භෂ්මාවශේෂ බැහැර කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට හෝ ආදහනාගාර භාරකරු විසින් ආදහනාගාරයේ පවතින වලකට බහාලීම නීත්‍යානුකූල වනනේ ය.

*(ඈ)* කිසියම් ඉල්ලුම්කරුවෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් භාර නොගත් භෂ්මාවශේෂ ආදහනාගාර පරිශ්‍රයේ හෝ යම් සුසාන භූමියක වල දැමීමට කටයුතු සැලැස්වීම ආදහනාගාර භාරකරුගේ කාර්යය වන්නේය.

*(ඉ)* කිසිදු මෘත දේහයක භෂ්මාවශේෂ අයදුම්පත්‍රයේ සඳහන් ඉල්ලුම්කරුට හැර වෙනත් අයකුට ලබාදීම නොකල යුතුය.

12. *(අ)* කිසියම් අදහනාගාරයක අදහන කුටීරයට මෘත දේහය ඇතුළත් කර එහි ආරක්ෂිත දොර වසා දැමීමෙන් පසුව කුටීරය ආවරණය කළ කොටසට ආදහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් හැර වෙනත් යම් තැනැත්තකු ඇතුළුවීම නොකළ යුතු ය.

(ආ) සභාපතිවරයාගේ, බලයලත් නිලධාරියාගේ හෝ ආදහනාගාර භාරකරුගේ අවසරය නොමැතිය යම් ආදහනාගාර පරිශ්‍රයකට ඇතුල්වීම නොකළ යුතු ය.

*(ඇ)* (ආ) ඡේදයේ කුමක් සඳහන්ව තිබුණ ද -

(i) මෘත දේහයක් ආදහනය කිරීමට යම් තැනැත්තෙකු අවසර පත්‍රයක් ලබා ඇත්තේ නම්, මෘත දේහය ආදහනය සඳහා භාරදීමට ඔහු හෝ ඔහුගේ බලයලත් තැනැත්තෙකු සමග එකී අවස්ථාව සහභාගීවන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන්; සහ

(ii) ආදහනය කරන ලද යම් මෘත දේහයක භස්මාවශේෂ භාර ගැනීමට නියමිත දින හෝ එදිනට පෙර අවසරය පත්‍රය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා සමග පැමිණෙන වෙනත් යම් තැනැත්තෙකු හෝ තැනැත්තන් ආදහනාගාර පරිශ්‍රයට ඇතුල්වීමට අවසරය ලැබී ඇති තැනැත්තන් ලෙස සළකනු ලැබිය යුතු ය.

13. යම් ආදහනාගාර පරිශ්‍රයක් තුළ -

*(අ)* සාමය කඩවන ආකාරයෙන් හැසිරීම,
*(ආ)* ආදහනාගාර පරිශ්‍රය තුළ ඇති ප්‍රාදේශීය සභාවට අයත් දේපළවලට අලාභහානි කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම
*(ඇ)* ආදහනාගාර භාරකරුගේ හෝ ඔහුගේ යම් සහායකයකුගේ රාජකාරියට බාධා කිරීම,
*(ඈ)* ආදහනාගාර පරිශ්‍රය තුළ කිසියම් සැරසිල්ලක් කිරීම හෝ දැන්වීම් ඇලවීම නොකළ යුතු ය.

14. *(අ)* මෘත ශරීර ආදහනය කිරීමට සුදුසු තත්ත්වයකින් (ආදහනාගාරයක උෂ්ණත්වය) ආදහනාගාර නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

*(ආ)* යම් ආදහනාගාරයක් ප්‍රතිසංස්කරණය කිරීමේ හෝ නඩත්තු කිරීමේ කාර්යය සඳහා එකී ආදහනාගාරය වසා තබන්නේ නම්, ඒ පිළිබඳ නිවේදනයක් භාෂාත්‍රයෙන්ම මෘත දේහ ආදහනය සඳහා අවසරපත් නිකුත් කරන කාර්යාලයේ සහ ආදහනාගාර පරිශ්‍රයට ඇතුල්වන ස්ථානයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කිරීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

*(ඇ)* කිසියම් ආදහනාගාරයක ආදහනය කිරීම සඳහා භාරගනු ලැබූ මෘත දේහයක් පූර්ණ වශයෙන් ආදහනය කිරීමට නොහැකි වන ආකාරයෙන් ආදහනාගාරය අක්‍රීය වන අවස්ථාවක දී එකී මෘත දේහය දව භාවිතයෙන් ආදහනය කිරීම හෝ අවස්ථානුකූලව මෘත ශරීරයේ ඉතිරි වූ කොටස් සුසානභූමියේ භූමදනය කිරීම සඳහා සභාපතිවරයා විසින් ගනු ලබන තීරණ නීත්‍යානුකූල වන්නේ ය. ඒ සඳහා එකී ආදහනාගාර පරිශ්‍රය තුළ ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් ඇති කර තිබීම ප්‍රදේශීය සභාවේ කාර්යයන් විය යුතුය.

*(ඈ)* සුදුසුකම්ලත් අයෙකුගෙන් මෘත ශරීර දහනයට වැයවන ගෑස් ප්‍රමාණය පිළිබඳ ප්‍රමාණ ඇතුළත් දැන්වීමක් ප්‍රදර්ශනය කළ යුතුය.

*(ඉ)* දහනය වන ගෑස් නිරීක්ෂණය කිරීමට මීටර් සවිකර තිබිය යුතු ය.

*(ඊ)* ආදහනාගාරයේ ප්‍රමිතිය පිළිබඳ සුදුසුකම් ලත් අයෙකුගෙන් වාර්තාවක් කලින් කළ ලබාගැනීම නිත්‍යානුකූල වන්නේය.

15. නව ආදහනාගාරයෙක් ඉදිකිරීමට පෙර පළාත් පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන නිරවුල් සහතිකය හා ආදහනාගාරය පවත්වාගෙන යාම සඳහා වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමත් දැනට ආරම්භකර ඇති ආදාහනාගාර සඳහා ප්‍රාදේශීය සභාව විසින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව එළඹෙන වර්ෂයේ සිට වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගැනීමත් කළ යුතු ය.

16. මේ අතුරු ව්‍යවස්ථාව කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝණය කිරීම වරදක් විය යුතුය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උප වගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතුය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රාදේශයේ මහෙස්ත්‍රාත් අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තෙකු විසින් එකී කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ අතුරු ව්‍යවස්ථාවේ -

"ආදහන කුටීරය" යන්නෙන්, ආදහනය කිරීම සඳහා මෘත දේහය තැන්පත් කරන කුටීරය සහ එකී කුටීරයට පිටතින් සාදන ලද බාහිර කුටීරය ද,

"ආදහනාගාරය" යනුවෙන්, ද්‍රව පීඩිත වායු හෝ විදුලි බලයෙන් ක්‍රියාකරන එක්වරක දී එක් මෘත ශරීරයක් පූර්ණ දහනයට ලක්වන කුටීර දෙකකින් සමන්විත පිරියතය ද,

"ආදහනාගාරයක උෂ්ණත්වය" යන්නෙන්, දහන කුටීරය තුළ අවම උෂ්ණත්වය සෙල්සියස් අංශක 800ක් පවත්වාගෙන යා හැකි සහ මෘත ශරීරය දහනය වන අවස්ථාවේ දී සෙල්සියස් අංශක 1000 දක්වා තිබිය යුතු උෂ්නත්වය ද,

"ආදහනාගාර පරිශ්‍රය "යන්නෙන්, සම්පූර්ණ ආදහනාගාරය සහ ඊට අයත් භූමිය ද,

"ආදහනාගාර භාරකරු" යන්නෙන්, තත් කාලයේ දී ප්‍රාදේශීය සභාවේ ආදහනාගාරය සහ එහි කටයුතු භාරව සිටීමට පත්කරනු ලැබ ඇති යම් සේවකයකු ද,

"ඉල්ලුම්කරු" යන්නෙන්, කිසියම් මෘත දේහයක් ආදහනය කිරීම පිණිස සභාපතිවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන කවර හෝ තැනැත්තෙකු ද,

"බලයලත් නිලධාරියා " යන්නෙන්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති ප්‍රාදේශීය සභාවේ නිලධාරියෙකු ද,

"භෂ්මාවශේෂ" යන්නෙන්, යම් මෘත දේහයක් ආදහනය කිරීමෙන් අනතුරුව, මෘත දේහයේ සහ එය තැන්පත් කර තිබූ යම් පෙට්ටියක නොදැවී ශේෂ වන යම් ද්‍රව්‍යයන් ද,

"මෘත ශරීරය" යන්නෙන්, මියගිය කිසියම් තැනැත්තෙකුගේ මෘත දේහය හෝ අජීවී දරු උපතක මෘත දේහය ද,

"සභාපතිවරයා" යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සභාව" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,
අදහස් විය යුතුය.

***පළමුවන උපලේඛනය***

*4 වැනි වගන්තිය*

**ආදාහනාගාරය පාවිච්චි කිරීමේ දී අයකරන ගාස්තු පිළිබඳ උපලේඛනය**

| *ගාස්තු ඛාණ්ඩ අංකය* | *ගාස්තු අය කිරීමේ වර්ගීකරණය* | *වටිනාකම රු. ශත* |
|---|---|---|
| 1. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 2. | බල ප්‍රදේශය තුළ පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 3. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 4. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 5. | බල ප්‍රදේශය තුළ පදිංචි ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශිත අඩු ආදායම් ලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |
| 6. | බල ප්‍රදේශය තුළ පදිංචි ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශිත අඩු ආදායම් ලාභියෙකුගේ පවුලේ වැඩිහිටි අයෙකු නොවන අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | |

මෙහි වැඩිහිටි අයෙකු නොවන අයෙකු යන්නෙන්, වයස අවුරුදු 12ට අඩු ළමයෙකු අදහස් වේ.

*දෙවන උපලේඛනය*

*5 වැනි වගන්තිය*

(ඉදිරි පිටුව)

(පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.)

**.................. ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත ශරීරයක් ආදාහනය කිරීමට අවසර පත්‍රයක් ලබාගැනීමට ඉල්ලුම් කිරීම**

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :..........................................................
   ලිපිනය :..........................................................
   ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................
   ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :..........................................................

2. මියගිය අයගේ සම්පූර්ණ නම :..........................................................
   ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................
   පදිංචි වී සිටි ස්ථානයේ ලිපිනය :..........................................................

   ග්‍රාම නිලධාරි කොට්ඨාස අංකය හා නම :..........................................................
   ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :..........................................................

   ඉල්ලුම්කරු අයත්වන ගාස්තු බාණ්ඩ අංකය : ☐
   (ඔබ අයත්වන්නේ ගාස්තු බාණ්ඩ අංක 05 හෝ 06 ට නම්, ඒ බව සනාථ කිරීමට අදාළ ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.)

3. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ ඇති සම්බන්ධය :..........................................................
   (තහවුරු කිරීමට 5 වන අතුරු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් සහතිකයක් අමුණන්න.)

4. මරණ සහතිකයේ ලියාපදිංචි අංකය හා දිනය :..........................................................
   (මරණ සහතිකයේ පිටපතක් අමුණන්න)

5. මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්ගේ නම හා කොට්ඨාසය :..........................................................

6. මරණයට හේතුව :..........................................................

7. මරණය සම්බන්ධයෙන් මරණ පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම්,
   (5 වන අතුරු ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ දැක්වෙන සහතිකය අමුණන්න)

   පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :..........................................................
   පරීක්ෂණය පැවැත්වූ දිනය :..........................................................
   පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :..........................................................
   මෘත දේහය ආදාහනය කිරීමට පරීක්ෂණ නිලධාරියා අවසර දී තිබේ ද ?

8. ආදහනය කිරීමට ඉල්ලා සිටින දිනය හා වේලාව (කැමැත්තේ අනුපිළිවෙල අනුව)

| *දිනය* | *වේලාව* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|
| 1. 20...................... | පැය :...................... | 2. 20...................... | පැය :...................... |
| 3. 20...................... | පැය :...................... | 4. 20...................... | පැය :...................... |

9. මෘත දේහය ආදහනය කිරීමෙන් පසු භස්මාවශේෂ භාර ගැනීමට අපේක්ෂා කරන්නේ ද?.....................
   (භස්මාවශේෂ භාර ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් භාජනයක් මෘත දේහය භාර දෙන අවස්ථාවේ දී ආදහනාගාර භාරකරු වෙත භාර දිය යුතුය.)

   ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මෙහි දක්වා ඇති තොරතුරුවල සම්පූර්ණ වගකීම මා විසින් භාරගනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි. අදළ සහතික අමුණා ඇත.

.........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය : 20........................................

දෙවන උපලේඛනය

(පසුපිට)

..........................................මහත්මා/මහත්මිය/මෙනවිය
..........................................
මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියෙනි,

*මෘත දේහයක් ආදහනය කිරීමට අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම.*

ඔබ විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති පසු පිටේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුව, අවසර පත්‍රයක් නිකුත් කිරීම පහත දැක්වෙන හේතුමත ප්‍රතික්ෂේප කරන බව කණගාටුවෙන් දන්වනු කැමැත්තෙමි.

i ..........................................
ii ..........................................
iii ..........................................
iv ..........................................
v ..........................................

..........................................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය : 20 .........................

---

ආදහනාගාර භාරකරු,
......................... ආදහනාගාරය.

**මෘත දේහයක් ආදහනය කිරීමට නිකුත් කරන අවසර පත්‍රය.**

*(අ)* ................................................ යන අයගේ මෘත දේහය 20 .................ක්වූ .........................මස ...................දින, පෙරවරු/පස්වරු .........................ට ......................... ආදහනාගාරයේ දී ආදහනය කිරීමට මෙයින් අවසර දෙමි.

*(ආ)* පසුපිට අයදුම්පත්‍රයේ දැක්වෙන තොරතුරු 6 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි ලේඛනයේ සටහන් කරන ලදී.

*(ඇ)* 20.................... දින, අංක......................... දරන ලදුපත මගින් රු. ......................... ක් අයකර ගෙන ඇත.

*(ඈ)* මේ අවසර පත්‍රයේ දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 10 වන අතුරු ව්‍යවස්ථාවේ පරිදි අදළ ලේඛනයේ සටහන් තැබීමෙන් අනතුරුව මෘත දේහය ආදහනය කිරීමට ක්‍රියා කරන්න.

*(ඉ)* අවසරපත් ලේඛනයේ අනුක්‍රමික අංකය .........................වේ.

.........................
සභාපති/බලයලත් නිලධාරියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය : 20.........................

**.....................................ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ ආදාහනය කරන ලද මෘත දේහ පිළිබඳ ලේඛනය**

| අනු අංකය | ඉල්ලුම්පත්‍රයේ අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | අවසරපත් ලේඛනයේ අනු. අංකය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | ලදුපතේ | | ආදහනය කළ | | භස්මාවශේෂ ගෙන ගිය දිනය | ආදාහනාගාර භාරකරුගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | අංකය | දිනය | නම | ජා. හැ. ප අංකය | අංකය | මුදල රු. ශත. | දිනය | වේලාව | | |
| 1. | | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | | |
| 6. | | | | | | | | | | | | | | | | |
| 7. | | | | | | | | | | | | | | | | |
| 8. | | | | | | | | | | | | | | | | |
| 9. | | | | | | | | | | | | | | | | |
| 10. | | | | | | | | | | | | | | | | |

(සැ.යු. : ලේඛනයේ වම් පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)

*6 වන වගන්තිය*

**....................................ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ මෘත දේහ ආදාහනය කිරීමට නිකුත් කරන ලද අවසර පත්‍ර ලේඛනය**

තුන්වන උපලේඛනය

| අනු අංකය | ඉල්ලුම්පත්‍රයේ අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකයේ ලියාපදිංචි කළ | | ඉල්ලුම්කරුගේ | | | | මහෙස්ත්‍රාත්/හදිසි මරණ පරීක්ෂක නියෝගයේ | | ලදුපතේ | | ආදහනය සඳහා වෙන් කළ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | නම | මරණකරු වෙත ඇති සම්බන්ධය | ලිපිනය | ජා.හැ.ප. අංකය | යොමු අංකය | දිනය | අංකය | මුදල රු. ශත | දිනය | වේලාව |
| 1. | | | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | | | |
| 6. | | | | | | | | | | | | | | | | | |
| 7. | | | | | | | | | | | | | | | | | |
| 8. | | | | | | | | | | | | | | | | | |
| 9. | | | | | | | | | | | | | | | | | |
| 10. | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |

(සැ.යු. : ලේඛනයේ වම් පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව**

01. මේ අතුරු ව්‍යවස්ථාව "ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. *(අ)* මෙහි පළමුවන උපලේඛනයේ සඳහන් ආකෘතියට අනුව පිළියෙල කළ ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කළ අයදුම් පත්‍රයක් සභාපතිවරයා වෙත ඉදිරිපත් කර ලබාගත් ඔහුගේ අත්සන සහිත බලපත්‍රයක් ඇත්තේ නම් මිස, කිසියම් තැනැත්තකු විසින් බල ප්‍රදේශය ඇතුළත අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාම නීත්‍යානුකූල නොවන්නේ ය.

*(ආ)* මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක් ම, සභාපතිවරයා විසින් මේ වගන්තිය යටතේ කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, එය නිකුත් කරනු ලැබුවේ යම් වර්ෂයක් වෙනුවෙන් ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වන දින අවසන් විය යුතු අතර, එකී බලපත්‍රය අන් අයකුට පැවරිය නොහැකි විය යුතු ය.

03. සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් වෙනුවෙන් නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් අයකළ හැකි අතර, එකී ගාස්තු ප්‍රමාණය ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

04. කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හිමිකරු විසින් මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් නියමයක් හෝ නියමයන් පැහැර හැරීමක් හෝ කඩ කිරීමක් කළ විට, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යාමට නිකුත් කළ බලපත්‍රය මහා සභාවේ තීරණය මත සභාපතිවරයා විසින් අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

05. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ අතුළත මෘත දේහ සැකසීම පිණිස වෙන්වූ කාමරයක් තිබිය යුතු අතර, එකී කාමරයේ එක් පුද්ගලයකුගේ මෘත දේහයක් සැකසීම සඳහා අවම වශයෙන් වර්ග අඩි අසූවකට නොඅඩු ඉඩ කඩක් තිබිය යුතු ය. එසේම එකී කාර්යය කිරීමට භාවිත කිරීමට ප්‍රමාණවත් කොන්ක්‍රීට් වේදිකාවක් තිබිය යුතු වන අතර එය පිඟන් ගඩොලින් බැඳ මනා නිමාවකින් පැවතිය යුතු ය.

06. *(අ)* අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන ආරම්භ කිරීමට පෙර පළාත් පරිසර අධිකාරියෙන් නිකුත් කරනු ලබන නිරවුල් සහතිකය ලබාගත යුතු අතර අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම සඳහා වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමත් කළ යුතු ය.

*(ආ)* දනට ආරම්භ කර ඇති අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන සඳහා ප්‍රාදේශීය සභාව වෙතින් මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳ ගැනීමෙන් අනතුරුව එලඹෙන වර්ෂයේ සිට වාර්ෂික පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමත් කළ යුතු ය.

07. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයේ අභ්‍යන්තරයට පිරිසිදු වාතාශ්‍රය ලැබෙන පරිදි භාවිත කාමරයේ වර්ගඵලයෙන් හතෙන් එකකට නොඅඩු ප්‍රමාණයකට වූ වාතයට විවෘත වන කවුළු සකසා තිබිය යුතු අතර, ඒ පිළිබඳ කාර්යයන්හි නියුක්තවීම කිසිදු බාහිර පුද්ගලයකුට නොපෙනන ආකාරයෙන් තිබිය යුතු ය. එකී කවුළු අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පිහිටි පරිශ්‍රයේ ආසන්න ඉඩම්වල ඇති පදිංචි හෝ පවත්වාගෙන යන කාර්යාල පරිශ්‍ර දෙසට එක එල්ලේ විවෘත නොවී තිබිය යුතු ය.

08. මෘත දේහයක් සැකසීම කිරීමේ දී ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් තාවකාලිකව බහාලීමට ප්‍රමාණවත් භාජන තිබිය යුතු අතර, එකී කාර්යය කරන අවස්ථාවේ දී මෘත ශරීරයෙන් බැහැරවන ලේ හෝ වෙනත් යම් දියර හෝ මෘත දේහය සේදීම කරනු ලබන්නේ නම් එකී අප ජලය රැස්කර ගැනීම සඳහා සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ භාජන තබා තිබිය යුතු ය. එකී භාජන අපාරගම්‍ය, අපාරදෘශ්‍ය හා මැස්සන්, මීයන් හෝ වෙනත් සතුන්ට ප්‍රවේශ විය නොහැකි වන සේ හොඳින් වසා තිබිය හැකි ඒවා විය යුතු ය.

09. මෘත දේහයක් සැකසීමේ දී ඉවත්කරනු ලබන හෝ ඉවත්වන මෘත ශරීර කොටස්, මහෙස්ත්‍රාත්වරයකු හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු හෝ විසින් ඒ පිළිබඳව ලබා දී ඇති නියෝගයක් නොමැති නම්, එකී කොටස් ඒ කාර්යය අවසන් වී පැය හයක් ගතවීමට මත්තෙන් පොළොවේ මතු පිට සිට අඩි හතරක් ගැඹුරු වලක වල දමා මැනවින් වසා දැමිය යුතු ය. එවැනි නියෝගයක් ඇත්තේ නම්, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් ඒ අනුව ක්‍රියා කිරීම කළ යුතු ය.

10. ඉහත 9 වන වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ නොමැති විටක, සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් පසුව එකී කාර්යය ප්‍රාදේශීය සභාවේ පොදු සුසාන භූමියේ ඇතුළත, ඉහත කී ගැඹුරින් යුතුව වල දමා වසා දැමිය යුතු ය.

11. මෘත දේහ සැකසීම කරනු ලබන කාමරය සෑම විටම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හෝ ශාලාවලින් වෙන්වී තිබිය යුතු අතර, සේවකයකු නොවන කිසිම බාහිර පුද්ගලයෙකුට අවසරයකින් තොරව ඇතුළුවීමට නොහැකි විය යුතු ය.

12. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය නිරන්තරයෙන් විෂබීජනාශක යොදා පිරිසිදුව පවත්වා ගැනීම සිදු කළ යුතු ය. එසේම අවශ්‍ය අවස්ථාවක දී කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා ප්‍රයෝජනයට ලබා ගත හැකි වන පරිදි එකී ස්ථානයේ ප්‍රමාණවත් ප්‍රථමාධාර හා වෙනත් අවශ්‍ය උපකරණ තිබිය යුතු ය.

13. මෘත දේහය සැකසීම කරනු ලබන පරිශ්‍රය තුළ මෘත දේහය සැකසීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ හැර ශබ්දය හෝ රූපය පටිගතකළ හැකි හෝ ඡායාරූපගත කළ හැකි කිසිදු උපකරණයක් භාවිතා කිරීම වරදක් වන්නේ ය.

14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් පිළිබඳව වාර්තා පවත්වා ගැනීම හිමිකරු විසින් කළ යුතු අතර, මෘත දේහ සැකසීම කරනු ලබන කාමරවල කටයුතු කරන සියළුම සේවකයන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයේ ඇඳුම් හා ආරක්ෂිත වැසුම් පැළඳ සිටිය යුතු අතර එකී කාමර තුළ ආහාර හෝ පාන කිසිවක් සැපයීම හෝ භාවිතා කිරීම කරනු නොලැබිය යුතු ය.

15. මෘත දේහ ගෙනයනු ලබන රථවල ඇතුළත නිරන්තරයෙන්, රික්ත ශෝධක මගින් පිරිසිදු කර, විෂබීජ නාශක යොදා තිබිය යුතු ය.

16. අධික වශයෙන් තුවාල සිදුවීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සැකසීම කළ නොහැකි අන්දමින් පවතින මෘත දේහ හැර වෙනත් මෘත දේහ තැන්පත් කරනු ලබන පෙට්ටියක ඇතුළත හෝ මෘත දේහය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් හෝ ආවරණය කිරීම පිණිස පොලිතීන් හෝ දිරාපත් නොවන වෙනයම් ද්‍රව්‍යයක් හෝ භාවිත නොකළ යුතු ය.

17. මේ අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍රයක් ලබා ගෙන ඇති අයකු හෝ එවැනි බලපත්‍රධාරියකු විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු හෝ හැර, වෙනත් අයකු විසින් කිසියම් මෘත දේහයක් සැකසීම හෝ මෘත දේහයක් ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය.

18. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ කළමනාකරු මෙම ආයතනය විවෘත කර ඇති වේලාව තුළ සිදුවන සියළු කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර, ඔහු සේවා ස්ථානයේ පෞද්ගලිකව නොමැති අවස්ථාවක් වේ නම් එවැනි අවස්ථාවකට බලයලත් නිලධාරියෙකුව ලිඛිතව පත් කිරීම කළමනාකරුගේ වගකීම වන්නේ ය.

19. කවර හෝ බලපත්‍රධාරියකු විසින් කොළරාව, මහාමාරිය, වසූරිය, කහ උණ රෝගයෙන් මියගොස් ඇති බවට සැළකෙන අයෙකුගේ මෘතදේහයක්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව ඔහු විසින් ඒ සඳහා බලපත්‍රධාරියාට දෙන ලද ලිඛිත අවසරයක් ඇත්තේ නම් මිස, බලපත්‍රලත් ස්ථානය වෙත ගෙන ඒම හෝ ගෙන ඒමට ඉඩ දීම නොකළ යුතු ය.

20. කිසියම් මෘත දේහයක් සැකසීමට හා අවමංගල්‍ය කටයුතු සංවිධානය පිණිස භාර ගැනීමට පෙර එකී මරණය සම්බන්ධයෙන් මරණ ලියාපදිංචි කිරීමේ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබූ විධිමත් මරණ සහතිකයක් හෝ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 41.1 (ආ) වගන්තිය යටතේ නිකුත් කරන ලද මරණ දැන්වීමක් හෝ ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන E - 24 ආකෘතියක් තමා වෙත ඉදිරිපත් කළහොත් මිස, එකී කාර්යයන් සඳහා මෘතදේහයක් භාර ගැනීම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක හිමිකරු විසින් නොකළ යුතු ය.

21. කිසියම් මෘත ශරීරයකට අදාළ මරණය හදිසි මරණයක් වනවිටක හෝ එකී මරණය සැක සහිත වනවිටක, මහෙස්ත්‍රාත්වරයකු විසින් හෝ හදිසි මරණ පරීක්ෂකවරයකු විසින් එකී මෘත දේහයේ අවසන් කටයුතු සම්බන්ධයෙන් දෙනු ලැබ ඇති කිසියම් නියෝගයක් වේ නම්, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් එකී නියෝගයේ විධිවිධාන පිළිපැදිය යුතු ය.

22. ස්වකීය අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ දී හෝ තම ආයතනය විසින් වෙනත් බලපත්‍රලාභී බාහිර ස්ථානයක දී හෝ සිදුකරනු ලබන සෑම මෘතදේහ සැකසීමක්ම හා අවමංගල්‍ය සේවා සැපයීම් සම්බන්ධව මෙහි දෙවැනි උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කළ අයදුම්පත්‍රයක් සේවා ලාභියාට ඉදිරිපත් කර අදාළ තොරතුරු ලබාගත යුතු අතර, ඊට අදළව මෙහි තෙවැනි උපලේඛනයෙහි දක්වෙන ආකෘතියට අනුකූලව පිළියෙල කරගත් තොරතුරු ලේඛනයක් එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු විසින් පවත්වාගත යුතු අතර එකී ලේඛනය ඉල්ලා සිටි අවස්ථාවක දී සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකුට ඉදිරිපත් කළ යුතු ය.

23. මහජන ගෞරවය පිණිස මෘතදේහ තබා ගැනීමේ සේවාවක් පවත්වාගෙන යනු ලබන ස්ථානයක් සම්බන්ධයෙන් වනවිට, එකී ස්ථානයේ තැන්පත් කර තබන මෘත දේහයට හෝ දේහයන්ට හා එහි භාරකරුවන්ට නිසි ගෞරව ලැබෙන අයුරින් ප්‍රදර්ශනය

කළ යුතු ය. එසේම අවසන් ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ පහසුව පිණිස ප්‍රමාණවත් තරමේ ආසන පැනවීමටත්, එසේ පැමිණෙන අයගේ වාහන නැවතීමට ප්‍රමාණවත් ඉඩකඩ ප්‍රමාණයක් සැළසීමටත් වැසිකිළි සහ කැසිකිළි පහසුකම් සැළසීමටත් ඒ ස්ථානය සභාපතිවරයා විසින් කරනු ලබන නියමයන්ට අනුකූලවන පරිදි පිරිසිදුව හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීමත් කළ යුතු ය.

24. ගෞරවය සඳහා මෘත දේහයන් තැන්පත් කර තැබීමේ ස්ථානය, ඒ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ප්‍රදර්ශන ශාලාවෙන් හා මෘත දේහ සැකසීම කරනු ලබන කාමරයෙන් වෙන්වී පවත්වාගෙන යා යුතු ය.

25. බලපත්‍රධාරියකු විසින් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ අවට අසල්වාසීන්ට කරදරකාරී වන්නා වූ හෝ පීඩාකාරී වන්නා වූ හෝ කිසිදු කාර්යයක් නොකිරීමට වග බලා ගත යුතු ය.

26. කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක ස්වාභාවික මල් තබා ගැනීම හෝ විකිණීම සඳහා තබාගනු ලබන විට එමගින් ඉවතලන කොටස් බැහැරලීම සභාපතිවරයා විසින් සෑහීමකට පත්වන ආකාරයෙන් කළ යුතු ය.

27. ඉහත 26 වැනි වගන්තියේ පරිදි ක්‍රියා කළ නොහැකිවන විට, එකී කොටස් ඉවත් කිරීමට සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව සභාවේ කිසියම් කසල රඳවනයකට හෝ රැස් කිරීමේ වාහනයකට හෝ සභාව විසින් නියම කරනු ලබන ආකාරයෙන් බැහැර කළ යුතු ය.

28. ඉහත 26 වැනි වගන්තියේ සඳහන් මල් හෝ ශාක කොටස් කම්බි, කෘත්‍රිම මල්, පොලිතීන් හෝ වෙනත් ඉවතලන දේ කිසියම් මාර්ගයකට හෝ මාර්ගයක් ඔස්සේ ඇති කාණුවකට හෝ වෙනයම් පොදු ස්ථානයකට දැමීම වරදක් වන්නේ ය.

29. සභාපතිවරයා විසින්, මේ අතුරු ව්‍යවස්ථාවේ ඔහුට පැවරී ඇති බලතල හා කාර්යයන් ප්‍රාදේශීය සභාවේ කිසියම් නිලධාරියකුට ලියවිල්ලකින් පවරා දෙනු ලැබිය හැකි ය.

30. මේ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසි ඒ ආකාරයෙන් ක්‍රියාත්මක වන්නේ ද යන්න පරීක්ෂාකර බැලීම පිණිස, සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියකුට සතියේ ඕනෑම දිනයක, අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය විවෘත කර පවත්වාගෙන යන බවට පළමුවැනි උපලේඛනයෙහි සඳහන් කර ඇති වේලාව තුළ දී, බල ප්‍රදේශය ඇතුළත පිහිටි ඕනෑම අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයකට ඇතුළුවීමට ද පරීක්ෂා කිරීමට ද බලය ඇත්තේ ය.

31. සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියකු විසින් කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, එකී ස්ථානය මේ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන උල්ලංඝනය වන ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන බවට ඒත්තුගෙන ඇත්නම්, එකී උල්ලංඝනය කිරීම් නිශ්චිත කාලයක් ඇතුළත නිවැරදි කරන ලෙසට ඔහු විසින් එකී ස්ථානයේ හිමිකරු වෙත නිවේදනයකින් දන්වා සිටීම නීත්‍යානුකූල වන්නේ ය.

32. 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ හිමිකරු වෙත අතින් භාර දීමෙන් හෝ එකී ස්ථානයේ අලවා තැබීමෙන් ම, එකී නිවේදනය නිවැරදි ආකාරයෙන් භාරදුන් බවට පිළිගනු ලබන්නේ ය.

33. 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය ලැබූ සෑම තැනැත්තෙක් ම එකී නිවේදනයේ නියමකර ඇති කාලය ඇතුළත එහි නියමයන්ට අනුව ක්‍රියා කළ යුතු ය.

34. යම් තැනැත්තකු විසින් 31 වැනි වගන්තියේ සඳහන් නිවේදනය ආකාරයෙන් ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, එකී අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යාමට නිකුත් කළ බලපත්‍රය සභාපතිවරයා විසින් අවලංගු කළ යුතු අතර, එසේ කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

35. මෙම අතුරු ව්‍යවස්ථාව සහ අදාළ සේවා සැපයුම් ස්ථානයෙන් සපයනු ලබන සේවාවන්ගේ විස්තර ඇතුළත් මිල දර්ශනයක් අදාළ සේවා සැපයුම් ස්ථානයේ පැහැදිලිව සහ ප්‍රකටව පෙනෙන අයුරින් ප්‍රදර්ශනය කළ යුතු ය.

36. මේ අතුරු ව්‍යවස්ථාවේ කවර වූ හෝ වගන්තියක දැක්වෙන නියමයන් හෝ විධිවිධානයන් කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් විය යුතු ය. එකී කිසියම් වරදක් සම්බන්ධව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් වරදකට වරදකරු කිරීමෙන් අනතුරුව එකී වරද සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) උපවගන්තියේ සඳහන් දඩයකට යටත් විය යුතු ය. එමෙන්ම එකී කිසියම් වරදක් සම්බන්ධයෙන් ප්‍රදේශයේ මහෙස්ත්‍රාත් අධිකරණයකින් වරදකට වරදකරු වීමෙන් අනතුරුව ඉහත සඳහන් ආකාරයෙන් දඩයකට යටත් කරන ලද යම් තැනැත්තකු විසින් එකී කඩ කිරීම හෝ උල්ලංඝනය කිරීම තවදුරටත් කරගෙන යනු ලබන විටක ඉහත කී උපවගන්තියේ සඳහන් අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

37. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවේ-

''අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය'' යන්නෙන්, කිසියම් මෘත ශරීරයක් කල් තබා ගත හැකිවන පරිදි සැකසීම කරනු ලබන හෝ මෘත ශරීරයක් අවසන් කටයුතු සඳහා සැකසීම කරනු ලබන හෝ අවසන් කටයුතු කිරීමට සුසාන භූමියක් දක්වා ගෙනයනු ලබන තෙක් කිසියම් මුදලක් අයකර මහජන ගෞරවය පිණිස තබා තිබෙන ස්ථානයක් ද,

''සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී'' යන්නෙන්, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන සේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පත්කරනු ලැබ ඇති සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ද,

''බල ප්‍රදේශය'' යන්නෙන්, ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය ද,

''බලයලත් නිලධාරියා'' යන්නෙන්, මෙම අතුරු ව්‍යවස්ථාවේ කිසියම් වූ කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීමට සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති යම් පුද්ගලයකු ද,

''මෘත ශරීර කොටස්'' යන්නෙන්, මියගිය පුද්ගලයකුගේ මෘත දේහයෙන් ඉවත් කරනු ලබන යම් ශරීර අවයවයක් හෝ ඉන් කොටසක් හෝ අභ්‍යන්තර කොටසක් හෝ මෘත ශරීරයෙන් බැහැරවන හෝ බැහැර කරන ලේ හෝ වෙනත් යම් දියරයක් හෝ මියගිය අය ඒ අවස්ථාවේ දී හැඳ සිටි යම් ඇඳුමක් හෝ ඇඳුම් හෝ ඉන් කොටසක් හෝ මියගිය අයගේ ශරීරයේ තිබූ කිසියම් තුවාලයක හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ශරීර අභ්‍යන්තරයේ තිබූ හෝ තිබෙන වෙලුම් පටි, පුළුන් හෝ වෙන යම් ද්‍රව්‍යයක් ද,

''සභාපතිවරයා'' යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

''සභාව'' යන්නෙන්, අදාළ ප්‍රාදේශීය සභාව ද,

''සැකසීම'' යන්නෙන්, මියගිය පුද්ගලයකුගේ මෘත දේහයක් අවසන් ගෞරව පිණිස කල් තබා ගත හැකිවන ආකාරයට පිළියෙල කිරීම, එකී මෘත දේහයට ඇඳුම් ඇන්දවීම, මෘත දේහය යම් පෙට්ටියක තැන්පත් කිරීම හා එකී කාර්යය සඳහා අවශ්‍යවන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම ද,

''හිමිකරු'' යන්නෙන්, කිසියම් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක අයිතිකරු හෝ එකී ස්ථානයේ කළමනාකරු හෝ ඒ අවස්ථාවේ එකී ස්ථානයේ භාරකරු හෝ එකී ස්ථානය පවත්වාගෙන යන යම් තැනැත්තෙක් ද, අදහස් වේ.

''පොදු ස්ථාන'' යන්නෙන් කිසියම් මාර්ගයක්, මංමාවතක්, වීථියක්, පටුමගක් දෙවැටක්, පදික වේදිකාවක්, පොදු ඉඩමක්, කිසියම් රක්ෂිතයක්, ක්‍රීඩා පිට්ටනියක්, පොදු ගොඩනැගිල්ලක්, පොදු සුසාන භූමියක්, බස් නැවතුම් පළක්, දුම්රිය ස්ථානයක්, ගංගාවක්, ඇලක්, දෙලක්, වැවක්, පොකුණක්, කලපුවක්, දිය කඩිත්තක්. දිය පහරක්, වැසි ජල කාණුවක්, මුහුදු වෙරළක්, සභාව සතු යම් ඉඩමක්, මහජනයාගේ පරිහරණය සඳහා වෙන්කර ඇති රජය සතු ඉඩමක් හෝ මහජනයාගේ පොදු පරිහරණයට ලක්වන වෙනත් ඕනෑම ස්ථානයක් අදළ වේ.

38. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

*උපලේඛන අංක 01*

*02 වැනි වගන්තිය ( i ) අනුඡේදය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම**

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම : ——————.
02. ලිපිනය : ——————.
03. ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : ——————.
04. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ ව්‍යාපාරික නාමය සහ එකී ස්ථානයේ ලිපිනය : ——————.
05. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය පවත්වාගෙන යන ස්ථානයේ වරිපනම් අංකය : ——————.
06. එක වරකදී සැකසීම පිණිස තබා ගත හැකි මෘත දේහ සංඛ්‍යාව : ——————.
07. ආයතනය සතු අවමංගල රථ සංඛ්‍යාව සහ ලියාපදිංචි අංක : ——————.

08. මෘත දේහ සැකසීමට පෙර ප්‍රවාහනය පිණිස යොදවා ඇති වාහන සංඛ්‍යාව : —————,
09. ඉවත් කරනු ලබන මෘත ශරීර කොටස් අපහරණය කරනු ලබන ආකාරය : —————,
10. පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන තිබේ ද : —————,
11. අතුරු ව්‍යවස්ථාවෙහි 05 සහ 07 වගන්ති සපුරා තිබේ ද : —————,
12. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය විවෘත කර පවත්වාගෙන යනු ලබන වේලාව : —————,
13. ගෞරව පිණිස මෘත දේහ තැන්පත් කර තැබීම භාර ගනු ලබන්නේ නම් : —————,
(i) එකවර තැන්පත් කර තැබිය හැකි මෘත දේහ සංඛ්‍යාව : —————,
(ii) ගෞරව දැක්වීමට පැමිණෙන අයගේ වාහන කොපමණ ප්‍රමාණයක් එකවර නවතා තැබිය හැකි ද : —————,

14. ස්වභාවික මල් තබා ගැනීම හා විකිණීම කරනු ලබන්නේ ද ? : ඔව් / නැත
15. ඉවතලන ස්වාභාවික මල් හෝ ශාක කොටස් ඉවත් කරනු ලැබීමට අපේක්ෂා කරන ආකාරය : —————,
16. ආයතනයේ සේවය කරන ස්ථිර සේවක සංඛ්‍යාව : —————,
17. කළමනාකරුගේ :
(i) නම : —————,
(ii) ජාතික හැඳුනුම් පත්‍රයේ අංකය : —————,
(iii) ලිපිනය : —————,
(iv) දුරකතන අංකය : —————,

18. ....................ප්‍රාදේශීය සභාවේ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයන්හි කටයුතු පාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ඒ අයුරින්ම පිළිපැදීමටත් හා කලින් කල ප්‍රාදේශීය සභාව විසින් නියම කරනු ලබන වෙනත් සෞඛ්‍යාරක්ෂක නියමයන් පිළිපැදීමටත් එකඟ වන බව මෙහි පහත අත්සන් කිරීමෙන් ම පිළිගනිමි.

..................................... ,
අයදුම්කරුගේ අත්සන.

දිනය : .......................

---

*කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා*

1. මෙම අයදුම්පතෙහි සඳහන් කරුණු සත්‍ය බවත් අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම සඳහා අනුමැතිය ලබාදීම සුදුසු බවත් නිර්දේශ කරමි.

2. පහත දැක්වෙන හේතු මත අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයක් පවත්වාගෙන යාමට කරනු ලබන ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

(i) ....................................................................
(ii) ....................................................................
(iii) ....................................................................
(iv) ....................................................................
(v) ....................................................................

අයදුම්පත පරීක්ෂා කරන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ -

නම : ................................................................
අත්සන : ........................................................
දිනය : ..............................................................

***උපලේඛන අංක 02***

*22 වන වගන්තිය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානය සඳහා භාරදෙනු ලබන මෘතදේහ පිළිබඳ විස්තර ඇතුළත් කිරීමේ ආකෘති පත්‍රය**

01. මියගිය අයගේ නම : —————,
02. ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය : —————,
03. ස්ත්‍රී පුරුෂ භාවය : —————,
04. මියගිය දිනය : —————,

05. මරණ සහතිකය ලියාපදිංචි කළ -
   (i) දිනය : ——————,
   (ii) අංකය : ——————,
06. මෘත දේහය භාරදුන් -
   (i) දිනය : ——————,
   (ii) වේලාව : ——————,
07. මෘත දේහ භාරකරුගේ :-
   (i) නම : ——————,
   (ii) මියගිය අයට ඇති සම්බන්ධය : ——————,
   (iii) ලිපිනය : ——————,
   (iv) ජාතික හැඳුනුම්පත් අංකය : ——————,
   (v) දුරකතන අංකය : ——————,
08. හදිසි මරණ පරීක්ෂක මහෙස්ත්‍රාත් නියෝගයේ -
   (i) යොමු අංකය : ——————,
   (ii) දිනය : ——————,

ඉහත සඳහන් කරුණු සත්‍ය බව සහතික කරමි.

.........................................,
භාරකරුගේ අත්සන.

*උපලේඛන අංක 03*

*44 වන වගන්තිය*

**අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථානයේ සැකසීම කරන මෘත දේහ පිළිබඳ විස්තර ලේඛනය**

අවමංගල්‍ය සේවා සැපයුම් ආයතනයේ නම ..........................................................................................................................................

ලිපිනය ..........................................................................................................................................

| අනු අංකය | අනුක්‍රමික අංකය | මියගිය අයගේ නම | ජා. හැ. ප. අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | මියගිය දිනය | මරණ සහතිකය ලියාපදිංචි කළ | | මෘත දේහය භාරගත් | | භාරකරුගේ | | | | හදිසි මරණ පරීක්ෂක/ මහේස්ත්‍රාත් නියෝගයේ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | අංකය | දිනය | දිනය | වේලාව | නම | මියගිය අයට ඇති සම්බන්ධය | ලිපිනය | ජා. හැ. ප. අංකය | යොමු අංකය | දිනය |
| 1. | | | | | | | | | | | | | | | |
| 2. | | | | | | | | | | | | | | | |
| 3. | | | | | | | | | | | | | | | |
| 4. | | | | | | | | | | | | | | | |
| 5. | | | | | | | | | | | | | | | |

(සැ.යු. : ලේඛනයේ වම් පස හා දකුණු පස පිටු දෙකම ප්‍රයෝජනයට ගෙන තොරතුරු සටහන් කිරීමට තීරුවල ප්‍රමාණවත් ඉඩ කඩක් ඇති කරගත යුතු ය.)

09-967

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව

### මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ ලේකම් ඩබ්. ඩී. ලූෂන් වන මම ප්‍රාදේශීය සභාවේ 2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ප්‍රසිද්ධියට පත් කිරීමට 2016.08.12 දිනැති අංක 6858 දරන තීරණය යටතේ මා විසින් තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

ලේකම් හා බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 12 වැනි දින,
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 216 විධිවිධානවලට අනුකූලවන පරිදි පහත උපලේඛනවල සඳහන් විගණනය කරන ලද නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ 2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, 2015/12/31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ 2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය මහජනතාවගේ දැන ගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට මා තීරණය කරමි.

උපලේඛන I

2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය

උපලේඛන II

2015.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

උපලේඛන III

2015.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

***2015 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය***

| | සටහන් | 31.12.2015 | 31.12.2014 |
|---|---|---|---|
| **මෙහෙයුම් අයභාරය** | | | |
| රජයේ දයකත්වය - පුනරාවර්තන | 01 | 67,581,633.07 | 53,862,863.73 |
| වෙනත් අයභාර | 02 | 145,285,419.19 | 148,578,518.85 |
| **මුළු මෙහෙයුම් අයභාරය** | | **212,867,052.26** | **202,441.382.58** |
| මෙහෙයුම් වියදම | | | |
| පුනරාවර්තන වියදම | 03 | 168,400,907.69 | 145,189,870.68 |
| **මුළු මෙහෙයුම් වියදම** | | **168,400,907.69** | **145,189,870.68** |
| **වර්ෂය සඳහා වන මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය** | | **44,466,144.57** | **57,251,511.90** |
| ප්‍රාග්ධන ලැබීම් | 04 | 47,270,309.82 | 42,730,278.80 |
| ප්‍රාග්ධන වියදම් | 05 | 113,829,968.11 | 91,017,021.85 |
| වර්ෂය සඳහා වන අතිරික්තය/ඌණතාවය | | (22,093,513.72) | 8,964,768.85 |

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

***2015 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය***

| | *සටහන්* | *31.12.2015* | *31.12.2014* |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ පිරියත සහ උපකරණ | 06 | 485,346,683.64 | 396,107,264.30 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 07 | 4,493,190.97 | 4,160,414.76 |
| සේවක ණය | 08 | 11,646,698.23 | 10,779,616.37 |
| ලැබිය යුතු දෑ | 09 | 166,198,743.50 | 220,529,559.08 |
| ආයෝජන | 10 | 10,228,552.73 | 9,618,579.55 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 53,533,373..57 | 15,916,403.29 |
| **මුළු වත්කම්** | | **731,447,242.64** | **657,111,837.35** |
| **වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | 12 | 14,308,608.13 | 7,185,363.17 |
| ජංගම වගකීම් | 13 | 53,521,834.83 | 102,293,345.87 |
| හිමිකම් | 14 | 663,616,799.68 | 547,633,128.31 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **731,447,242.64** | **657,111,837.35** |

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

***2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය***

| *මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය* | *31.12.2015* | *31.12.2014* |
|---|---|---|
| සාමාන්‍ය මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ඌණතාව | 44,466,144.57 | 57,251,511.90 |
| මුදල් නොවූ සිදුවීම් සඳහා ගැලපීම් | - | - |
| ක්ෂය වීම | - | - |
| පාරිතෝෂික වෙන් කිරීම් | - | - |
| පෙර වර්ෂ සඳහා ගැලපුම් | 48,837,765.75 | 3,087,201.03 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් අතිරික්තය/ඌණතාවය** | **93,303,910.32** | **60,338,712.93** |
| තොග/ණයගැතියන්/අනෙකුත් ලැබීම් (වැඩිවීම)/අඩුවීම | 52,520,984.33 | (26,274,805.95) |
| ණයහිමියන්/ගෙවියයුතු දෑ වැඩිවීම/(අඩුවීම) | (48,771,511.04) | 20,541,890.88 |
| **01. මෙහෙයුම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **97,053,383.61** | **54,605,797.86** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| දේපළ අත්පත් කර ගැනීම්/ඉවත් කිරීම් | (89,239,419.34) | (50,272,694.14) |
| ප්‍රාග්ධන වියදම් | (24,590,548.77) | (40,744,327.71) |
| 02. ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | (113,829,968.11) | (91,017,021.85) |

| | | |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ලැබීම් | 47,270.309.82 | 42,730,278.80 |
| ණය ආපසු ගෙවීම්/ණය ලැබීම් | 7,123,244.96 | (2,815,358.02) |
| **03. මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **54,393,554.78** | **39,914,920.78** |
| වර්ෂය තුළ ශුද්ධ චලනයන් (1+2 +3) | 37,616,970.28 | 3,503,696.79 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 15,916,403.29 | 12,412,706.50 |
| වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ "A" | **53,533,373.57** | **15,916,403.29** |

**සටහන A**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - ජංගම ගිණුම | 52,330,982.75 | 14,786,961.29 |
| ලංකා බැංකුව - ඉතිරි කිරීමේ ගිණුම | 695,796.80 | 515,381.93 |
| නිළධාරීන් වෙත අතැති මුදල් | - | 102,929.09 |
| මුද්දර ගිණුම | 4,199.00 | 2,890.00 |
| අගරු චෙක් ගිණුම | 502,395.02 | 508,240.98 |
| | **53,533,373.57** | **15,916,403.29** |

09-791

# විවිධ දැන්වීම්

## කුරුණෑගල මහා නගර සභාව

### 2017 වර්ෂය සඳහා ව්‍යාපාර විෂය බද්ද පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2015 වර්ෂයේ අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස. 5(1) දරන අංක යටතේ සභා සම්මත කරන ලද යෝජනාවම 2017 වර්ෂයට අදළ කරගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2017 වර්ෂය සඳහා පනවන ලද ව්‍යාපාර විෂය බද්ද ඒ වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247ඇ වැනි වගන්තියෙන් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී ආඥාපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම හෝ එකී ආඥාපනතේ 247ආ වැනි වගන්තිය යටතේ බලත්‍රයක් ලබාගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරාදයක වෙළෙඳ ව්‍යාපාරයක් හෝ කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නාවූ ද හා වෘත්තියක් නොවන්නාවූ ද මෙහි පහත I වැනි උපලේඛනයේ සඳහන් කිසියම් ව්‍යාපාරයක් කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත II උපලේඛනයේ 01 වැනි තීරයේ නිරූපිත යම් විෂයාංකයක සීමාවක් ඇතුළත පවත්නා අවස්ථාවක එහි 02 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් ලෙස 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී ව්‍යාපාර බද්දට යටත් සෑම තැනැත්තෙක්ම එකී ව්‍යාපාර බද්ද 2017 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා යෝජනා කරන්නේය."

*01 වැනි උපලේඛනය*

1. උත්සව භාණ්ඩ කුලියට දීම.
2. ලොතරැයි ටිකට් අලෙවිය .
3. දේශීය/විදේශීය රැකියා නියෝජිත ආයතන.
4. තුරඟ සහ සුනඛ තරඟ ඔට්ටු ඇල්ලීමේ ස්ථාන.
5. නියෝජිත තැපැල් කාර්යාලය .
6. ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීම .
7. සංඥ කුළුණු සවිකළ ස්ථානයක් පවත්වාගෙන යාම.
8. පුවත්පත් අලෙවිය.
9. රථ ගාලක් පවත්වාගෙන යාම.
10. යතුරු කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම .
11. වෙන්දේසිකරුවන් .
12. බ්‍රෝකර්වරුන් .
13. මුදල් ආයෝජකයින් .
14. මුදල් ණයට දෙන්නන් .
15. කොන්ත්‍රාත්කරුවන් .
16. කොමිස් ඒජන්තවරු .
17. උකස් බඩු ගන්නා ස්ථානයක් පවත්වාගෙන යාම.
18. පුද්ගලික ගණන් පරීක්ෂකවරුන්.
19. ගණකාධිකාරීවරුන්.
20. වාණිජ සිත්තරුන්.
21. ගෘහ නිර්මාණ ශිල්පීන්
22. පින්තාරුකරුවන්/මෝස්තර සකස්කරන්නන්
23. උපදේශක ආයතන
24. සැලසුම්කරුවන්
25. පුද්ගලික මිනින්දෝරුකරුවන්
26. රක්ෂණ නියෝජිත ආයතන
27. ප්‍රවාහන නියෝජිතයින්
28. පුද්ගලික ප්‍රවාහන අයිතිකරුවන්
29. කුලී වාහන අයිතිකරුවන්
30. පුද්ගලික තක්සේරුකරුවන්
31. රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
32. වාණිජ බැංකු සේවා සපයන මුල්‍ය ආයතන
33. පුද්ගලික දේපළ වෙළඳාම් ආයතන
34. සියලුම මුල්‍ය ආයතන
35. ලොතරැයි නියෝජිතයින්
36. පුද්ගලික ඉංජිනේරුවන්
37. භාෂා පරිවර්තනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

*IIවැනි උපලේඛනය*

| | *I වැනි තීරුව*<br>*බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ දී*<br>*ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය* | *II වැනි තීරුව*<br>*ගෙවිය යුතු බද්ද*<br>*රු. ශත* |
|---|---|---|
| 1. | රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | නැත |
| 2. | රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක | 90 0 |
| 3. | රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක | 180 0 |
| 4. | රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක | 360 0 |
| 5. | රු. 75,000. ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක | 1,200.0 |
| 6. | රු. 1,50,000. ඉක්මවන අවස්ථාවක | 3,000 0 |

09-735/4

## කුරුණෑගල මහා නගර සභාව

### කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන අප්‍රසන්න හෝ අන්තරායදායක වෙළඳ ව්‍යාපාර සඳහා මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ 2017 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර මත ගාස්තු පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් වර්ෂ 2015 අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම.ස. 05(1) දරන අංක යටතේ සභා සම්මත කරන ලද යෝජනාවම 2017 වර්ෂයට අදළ කරගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍රයක් ලබාගත යුතු සෑම අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක්ම පවත්වාගෙන යාමේ ස්ථානය වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නාගරික කොමසාරිස්වරයාගෙන් වලංගු බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ ලබාගත් වලංගු බලපත්‍රයක් නොමැතිව ඒ ඒ යම්කිසි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වරදක් බවත් මෙයින් තවදුරටත් නිවේදනය කරනු ලැබේ. එවැනි යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම බලපත්‍රයක් සඳහාම 2017 වර්ෂය සඳහා පහත සඳහන් යෝජනාවේ ආකාරයට ගාස්තුවක් කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බව ද වැඩිදුරටත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

"කුරුණෑගල මහා නගර සභාව විසින් පිළිගෙන ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලද අංක 541/17 දරන 1989.01.20 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති මහා නගර සභා සම්මත අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන අනුව මෙහි පහත උපලේඛනයේ I වන කොටසේ සඳහන් කිසියම් අප්‍රසන්න හෝ අන්තරාදායක වෙළඳ ව්‍යාපාරයක් 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක, එකී ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්ගෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවත්, එසේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් වෙනුවෙන්ම, එකී ව්‍යාපාරය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම 11 වන උපලේඛනයේ 02 වන කොටසේ I වන තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක, එහි II වන තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 *අ* සහ *ආ* වන වගන්තිවලින් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමටත් කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා යෝජනා කරන්නේ ය."

#### I වැනි උපලේඛනය

*1 වැනි කොටස :*

අන්තරායදායක ව්‍යාපාර :

1. කොන්ඩා කැපීමේ සහ සැකසීමේ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම
2. රූපලාවන්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම
3. ලොන්ඩරියක් පවත්වාගෙන යාම
4. හෝටලයක් පවත්වාගෙන යාම
5. නවාතැන් පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙනයාම
6. බත් කඩයක් හෝ ආපන ශාලාවක් හෝ තේ, කෝපි කඩයක් පවත්වාගෙන යාම
7. කිරි පට්ටි හා කිරි අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
8. බේකරියක් පවත්වාගෙන යාම
9. සුපිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම
10. සිසිල් බීම නිෂ්පාදනය සහ අලෙවි කිරීම

11. අයිස් නිෂ්පාදනය සහ අලෙවි කිරීම
12. මිනිරන් ගබඩා කිරීම, මිනිරන් සකස් කිරීම සහ වර්ග කිරීම
13. කාබනික සහ රසායනික පොහොර නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවිය
14. කලුගල් සහ කබොක් කැඩීම සහ විකිණීම
15. බොරලු හැරීම සහ අලෙවිය
16. තලාතු මිනිරන් සකස් කිරීම
17. පශු ගිලන්හලක් පවත්වාගෙන යාම
18. පොහොර නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය
19. උළු, කොන්ක්‍රීට් පයිප්ප හෝ වෙනත් කොන්ක්‍රීට් ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
20. හුණු ගබඩාකොට තැබීම
21. නරක්වනසුළු ආහාර ද්‍රව්‍ය සිල්ලර සහ තොග අලෙවිය
22. බොම්බයි ලූණු සහ අර්තාපල් ගබඩා කිරීම සහ අලෙවිය
23. කුරුඳු, කරදමුංගු හෝ කෙඳි ගෙන්දගම් දුම්ගසා සකස් කිරීම
24. පරණ ලෝහ ගබඩා කිරීම
25. සිමෙන්ති හොණ්ඩර 25කට වැඩියෙන් ගබඩා කිරීම
26. ගම් වර්ග නිෂ්පාදනය සහ අලෙවිය
27. විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
28. රෙදි පවිත්‍ර කිරීමේ කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිය
29. බැටරි පුරවනු ලබන්නා වූ හෝ බැටරි ගබඩා කර තබන්නා වූ ආයතනයක් පවත්වාගෙන යාම
30. ටයර් හෝ ටියුබ් වොල්කනයිස් කරන ආයතනයක් පවත්වාගෙන යාම
31. හිස් බෝතල් 100කට වැඩියෙන් ගබඩා කර තැබීම
32. කුරුඳු පොතු ගබඩා කිරීම සහ අලෙවිය
33. කොකෝවා ගබඩාව සහ අලෙවිය
34. කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තැබීම
35. යාන්ත්‍රික බලය යොදාගෙන රෙදි වියන කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
36. පිටි හෝ කුළුබඩු ඇඹරීම හා අලෙවිය
37. පුන්නක්කු හෝ වෙනත් සත්ත්ව ආහාර ගබඩාව සහ අලෙවිය
38. රබර් භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය
39. මෝර වරල් සකස් කිරීම, අලෙවිය සහ ගබඩාව
40. පොලිතීන් සෙලියුලොයිඩ් හෝ පර්ස්පෙක්ස් නිෂ්පාදනය, ගබඩාව සහ අලෙවිය
41. ඇසිඩ් ගැලුම් 05කට වැඩියෙන් ගබඩා කර තැබීම
42. කපුරු නිෂ්පාදනය සහ අලෙවිය
43. සපත්තු හෝ පාවහන් නිෂ්පාදනය සහ අලෙවිය
44. වාෂ්ප ජලය හෝ වෙනත් යාන්ත්‍රික බලයක් යොදාගෙන දැව ඉරීම
45. කෙඳි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම
46. ගිණිපෙට්ටි නිෂ්පාදනය සහ අලෙවිය
47. පොල්තෙල් සිඳීම, ගබඩා කිරීම සහ අලෙවිය
48. මැතිලේටඩ් ස්ප්‍රීතු ගබඩාව සහ අලෙවිය
49. ඇසිටලීන නිෂ්පාදනය සහ අලෙවිය
50. සිගරට් නිෂ්පාදනය සහ අලෙවිය
51. ටයර් සහ ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. තීන්ත හෝ වාර්නිස් හොණ්ඩර 05කට වැඩියෙන් ගබඩා කර තැබීම
53. කොහු නිෂ්පාදනය සහ අලෙවිය
54. රස කැවිලි නිෂ්පාදනය සහ අලෙවිය
55. ලී පෙට්ටි සෑදීම
56. ඔක්සිජන් සහ වෙල්ඩින් වැඩ කරනු ලබන්නා වූ ද මෝටර් වාහන අලුත්වැඩියා කරන්නා වූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
57. මෝටර් වාහන අලුත්වැඩියා කරන්නාවූ ද යකඩ සහ ලෝහ වැඩ කරනු ලබන්නා වූ ද ගරාජයක් නොවන්නාවූ ද වෙනත් ආයතනයක් පවත්වාගෙන යාම
58. ඩිජිටල් හෝ අතින් හෝ පා පොලුවලින් හෝ යාන්ත්‍රික බලයෙන් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම
59. පොල්තෙල් හැර වෙනත් කවර හෝ වර්ගයක තෙල් ලීටර 545කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තැබීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් පවත්වාගෙන යාම
60. ගෙන්දගම් සහ ගෙන්දගම් කුඩු කිලෝ ග්‍රෑම් 50ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීම.
61. තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය

62. 100කට අධික ප්‍රමාණයක් පතරොම් ගබඩා කර තැබීම
63. අලුත් ටයර් ටියුබ් ගබඩා කර තැබීම
64. පාවිච්චි කළ කඩදාසි කිලෝ ග්‍රෑම් 250කට වැඩි ප්‍රමානයක් ගබඩා කර තැබීම
65. යාන්ත්‍රික ශීතකරණය සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
66. ඇඟලුම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
67. බතික් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම
68. ඩ්‍රයි ක්ලීනින් කරන ආයතනයක් පවත්වාගෙන යාම
69. යාන්ත්‍රික බලය පාවිච්චි නොකරන ඉලෙක්ට්‍රික් රෝ ප්ලේටිං වැඩ, ක්‍රෝමියම් ආලේප කිරීම, රන් ආලේප කිරීම, රිදී ආලේප කිරීම කරනු ලබන ආයතනයක් පවත්වාගෙන යාම
70. ගල් අඟුරු, ගෑස් නිෂ්පාදනය /ගබඩා කිරීම / අලෙවිය
71. කාබන්ඩයොක්සයිඩ් නිෂ්පාදනය සහ අලෙවිය
72. අශුද්ධ ලෝහ ගබඩා කිරීම
73. ගිණිකෙළි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය
74. කිලෝ ග්‍රෑම් 02කට වැඩි ප්‍රමාණයකින් වෙඩි බෙහෙත් සහ පුපුරන ද්‍රව්‍ය ගබඩා කිරීම
75. බිම ඔප දමන පොලිෂ් නිෂ්පාදනය කිරීම
76. තාර පෙරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
77. ශීතකරණ අලුත්වැඩියා කිරීම, රීකන්ඩිෂන් කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
78. මෝටර් කාර් එකලස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
79. ස්කූටර් සහ මෝටර් සයිකල් එකලස් කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
80. පුපුරන ද්‍රව්‍ය, රසායන ද්‍රව්‍ය සහ පොහොර විකිණීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම
81. වී/හාල්/ කුළුබඩු ඇතුලු අනෙකුත් ධාන්‍ය වර්ග ඇඹරුම්හල් පවත්වාගෙන යාම
82. සුරතල් මසුන් ඇති කිරීම සහ අලෙවිය
83. මත්පැන්හලක් හෝ ස්කාගාරයක් පවත්වාගෙන යාම
84. ව්‍යායාම් කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
85. සිසිල් බීම අලෙවිය
86. සිංහල බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය
87. ඉංග්‍රීසි බෙහෙත් ගබඩා කිරීම සහ අලෙවිය
88. ධාන්‍ය ගබඩා කිරීම සහ අලෙවිය
89. සෝයා අයිස්ක්‍රීම් හෝ වෙනත් අයිස් ක්‍රීම් වර්ග නිෂ්පාදනය සහ අලෙවිය
90. යෝගට් හෝ කිරි ආශ්‍රිත වෙනත් ආහාර හෝ රසකැවිලි නිෂ්පාදනය සහ අලෙවිය
91. එළවලු සහ පලතුරු ගබඩාව සහ අලෙවිය
92. සනීපාරක්ෂක භාණ්ඩ ගබඩාව සහ අලෙවිය
93. පානීය ජල බෝතල් ගබඩා කිරීම සහ අලෙවි කිරීම
94. පෞද්ගලික රෝහලක් හෝ රෝගීන් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
95. කොප්පරා නිෂ්පාදනය, ගබඩා කිරීම සහ අලෙවි කිරීම
96. වෙල්ඩිං වැඩපලක් පවත්වාගෙන යාම
97. මෝටර් වාහන, යතුරු පැදි, පාපැදි, තණකොළ කපන යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම
98. දුම්කොළ ගබඩාව සහ අලෙවිය
99. වයින් ස්ප්‍රීතු ගබඩාව සහ අලෙවිය
100. ඡායාරූප ශාලාවක්, ඡායාරූප මුද්‍රණ කටයුතු කරන රසායනාගාරයක් යන ස්ථාන හෝ ස්ථානයක් පවත්වාගෙන යාම
101. පෞද්ගලික වෛද්‍ය රසායනාගාරයක් පවත්වාගෙන යාම
102. පෞද්ගලික උපකාරක පංති හෝ වෙනත් අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ ආයතනයක් පැවැත්වීම
103. පුද්ගලික පෙර පාසලක් පවත්වාගෙන යාම
104. විශ්වවිද්‍යාල හා අනුබද්ධිත උපාධි, ඩිප්ලෝමා ආදිය පිරිනමන පුද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
106. සංගීත, චිත්‍ර, නැටුම් සහ වෙනත් ලලිත කලා අධ්‍යාපන ආයතනයක් හෝ කලායතනයක් පවත්වාගෙන යාම
107. පුද්ගලික හෙද අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
108. පුද්ගලික දන්ත වෛද්‍ය කටයුතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
109. වෛද්‍ය පරීක්ෂණ වාර්තා (මෙඩිකල්) නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම
110. විදුලි උපකරණ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
111. රෙදි පවිත්‍ර කාරක නිෂ්පාදන සහ අලෙවිය
112. ෆයිබර් වැඩපලක් පවත්වාගෙන යාම
113. ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
114. වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
115. එළවළු/පළතුරු වගා කිරීමේ ගොවිපලක් පවත්වාගෙන යාම

116. කුකුළු, කළුකුන්, තාරා සහ වෙනත් සතුන්ගේ බිත්තර අලෙවි කිරීම
117. පශු වෛද්‍ය කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම හෝ සත්ත්ව රෝග සඳහා වන බෙහෙත් ද්‍රව්‍ය අලෙවිය
118. ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීම
119. ඇලුමිනියම් හෝ බෙලෙක් භාණ්ඩ නිෂ්පාදනය
120. මැණික් කැපීම සහ ඔප දැමීම
121. අශුද්ධ ලෝහ උණු කිරීම
122. ලුණු පැකට් කිරීම සහ අලෙවි කිරීම
123. රටකජු, මුරුක්කු සහ වෙනත් බයිට් වර්ග නිෂ්පාදනය සහ අලෙවි කිරීම
124. වෛද්‍ය උපකරණ අලෙවිය
125. බේකරි නිෂ්පාදන අලෙවි කිරීම
126. තීන්ත වර්ග අලෙවි කිරීම
127. පේස්ට්‍රි අලෙවි කිරීම
128. පීසා නිෂ්පාදනය සහ අලෙවි කිරීම
129. පරිගනක යන්ත්‍ර අළුත්වැඩියා කිරීම
130 .බල මෙවලම් උපකරණ අළුත්වැඩියා කිරීම
131. ලිහිසි තෙල් අලෙවි කිරීම
132. බිම්මල් වගා කිරීම
134. යන්ත්‍ර අනුසාරයෙන් කළුගල් කැඩීම හා අලෙවිය
135. මුද්‍රණ යන්ත්‍රවල ටෝනර් අළුත්වැඩියාව
136. වාහන වායුසමීකරණ කරන ස්ථානයක් පවත්වාගෙන යාම
137. ලෝහ භාණ්ඩ නිෂ්පාදනය
138. වාහන දුණු අළුත්වැඩියාව
139. සකස් කළ ආහාර කල්තබාගත හැකි ලෙස ඇසුරුම් කිරීම හා අළෙවිය

*අප්‍රසන්න ව්‍යාපාර :*

1. සියලුම මොටර් වාහන ඇතුළු අනෙකුත් වාහන සේවා කිරීමේ (සර්විස්) ස්ථානයක් පවත්වාගෙන යාම
2. ටින්කර් සහ පේන්ට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
3. ඌරු, ගව, එළු, කුකුළු, තාරා, කළුකුන් ආදී සත්ත්ව ගොවිපලක් හෝ එවැනි සතුන් අලෙවි කිරීම හෝ එවැනි සතුන්ගේ මස් අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
4. කාබනික පොහොර නිෂ්පාදනය සහ අලෙවි කිරීමේ ආයතනයක් පවත්වාගෙන යාම
5. සත්ව ඝාතකාගාරයක් පවත්වාගෙන යාම
6. ශීතකළ හෝ නොකළ මස් සහ මාළු විකිණීම
7. සත්ත්ව ආහාර නිෂ්පාදනය හෝ අලෙවි කිරීම
8. හම් වර්ග ගබඩාව සහ අලෙවිය
9. අයිස් කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම
10. සතුන්ගේ හම්, බෙටි , ඇට, කුඩු හෝ පොහොර හෝ විෂ සහිත හෝ පීඩාකාරී දුර්ගන්ධයක් මතුවන ද්‍රව්‍ය විකිණීම හෝ ගබඩා කිරීම
11. ලියවන පට්ටල් වැඩපලක් පවත්වාගෙන යාම
12. එළවලු සහ පලතුරු ගබඩා කිරීම
13. ඉවත දමන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ස්ථානයක් පවත්වාගෙන යාම
14. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා අලෙවිය
15. යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන ලී මෝලක්, වඩු වැඩපලක් පවත්වාගෙන යාම
16. මිනී පෙට්ටි සෑදීම සහ ගබඩා කිරීම සහ සියලුම අවමංගල්‍ය සේවා කටයුතු කිරීම
17. වේවැල් හෝ පන් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය සහ ගබඩා කිරීම
18. වලං නිෂ්පාදනය සහ ගබඩාව
19. පොල්කටු අඟුරු නිෂ්පාදනය හා ගබඩාව
20. කොප්පරා සකස් කිරීම සහ ගබඩා කිරීම
21. බීඩි නිෂ්පාදනය සහ ගබඩා කිරීම
22. වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
23. මෘත දේහ එම්බාම් කිරීම ඇතුළු සියළුම මංගල අවමංගල සේවා කටයුතු කිරීම
24. අන්තර්ජාල පහසුකම් සපයන ස්ථානයක් පවත්වාගෙන යාම
25. බුලත්, පුවක්, හුණු, දුම්කොළ අලෙවි කිරීම
26. ස්වාභාවික මල් අලෙවි කිරීම හා සැරසිලි කිරීම
27. ගල් හා ලී කැටයම් කිරීම

28. ඉටිපන්දම් සෑදීම
29. සුවඳ කූරු, කැට, කුඩු නිෂ්පාදනය කිරීම
30. හයිඩ්‍රොලික් හෝස් අළුත්වැඩියාව
31. රථ වාහන දුම් පරීක්ෂා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
32. රථ වාහන පොලිෂ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

## II වැනි උපලේඛනය

*02 වන කොටස*

| | *I වැනි තීරුව වාර්ෂික වටිනාකම* | *II වැනි තීරුව බලපත්‍ර ගාස්තුව රු. ශත* |
|---|---|---|
| 01. | රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 1,000 0 |
| 02. | රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක | 2,000 0 |
| 03. | රු. 2,500 ඉක්මවන විට | 3,000 0 |

"ඉහත I වැනි කොටසේ සඳහන් ව්‍යාපාර අතරින් අංක 04 යටතේ සඳහන් කිසියම් හෝටලයක් හෝ අංක 06 යටතේ සඳහන් කිසියම් ආපනශාලාවක් හෝ අංක 05 යටතේ සඳහන් වන කිසියම් නවාතැන්පොලක් හෝ, ඒ හෝටලය, ආපනශාලාව හෝ නවාතැන්පොළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූ ද වන අවස්ථාවක ඉහත අංක 02 වැනි කොටසේ කුමක් සඳහන්ව තිබුණ ද ඒ හෝටලය හෝ ආපනශාලාව හෝ නවාතැන්පොළ හෝ පවත්වාගෙන යනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපනශාලාවේ හෝ නවාතැන්පළෙහි 2016 වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක් (01%), විය යුතු ය.

09-735/2

---

## කුරුණෑගල මහා නගර සභාව

### 2017 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

කුරුණෑගල මහා නගර සභාව විසින් 2015 අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම. ස. 5 (1) දරන අංක යටතේ සභා සම්මත කරන ලද යෝජනාවම 2017 වර්ෂයට අදාළ කරගත් බව මහ ජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2017 වර්ෂය සඳහා පනවන ලද කර්මාන්ත බද්ද ඒ වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"252 වන අධිකාරය වන මහා නගර සභා ආඥපනතේ 247 අ සහ ආ වන වගන්තිවලින් මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී ආඥපනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබාගැනීම අවශ්‍ය නොවන්නා වූ හෝ ව්‍යාපාර විෂය බද්දට අදළ නොවන්නාවූ වෙනත් ඕනෑම කර්මාන්තයක් කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2017 වර්ෂයේ දී කරගෙන යනු ලබන අවස්ථාවක එකී කර්මාන්තය කරගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරයේ ඇතුළත් ප්‍රමාණයන් අතර පවත්නා අවස්ථාවක එහි II වැනි තීරයේ අනුරූප සටහනෙහි නිරූපිත මුදල් ප්‍රමාණය අනුව වූ කර්මාන්ත බද්දක් 2017 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, එකී කර්මාන්ත බද්දට යටත් සෑම තැනැත්තෙක් ම එකී කර්මාන්ත බද්ද 2017 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහ නගර සභාවට ගෙවිය යුතු බවටත් විධාන කිරීමට කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා යෝජනා කරන්නේ ය.

**උපලේඛනය**

| | *I වැනි තීරුව* *වාර්ෂික වටිනාකම* | *II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත* |
|---|---|---|
| 01. | රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | 1,000 0 |
| 02. | රු. 1,500 ඉක්මවන නමුත් රු. 2,500 නොඉක්මවන අවස්ථාවක | 2,000 0 |
| 03. | රු. 2,500 ඉක්මවන විට | 3,000 0 |

09-735/3

---

## පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව

### නගර ශාලාව පාවිච්චි කිරීම සඳහා ගාස්තු අය කිරීම - 2016

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය හා කර්තව්‍ය ඉටුකරන පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ ලේකම් ජයසිංහ මුදියන්සේලාගේ නිමල් ජයසිංහ වන මම, පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ නගර ශාලාව පාවිච්චි කිරීම සඳහා ගාස්තු නියම කිරීම පහත සඳහන් ආකාරයක විය යුතු බවට 2016.05.31 දිනැති තීරණ අංක 05.01.47 යටතේ පහත තීරණය කර ඇති බව නිවේදනය කරමි.

ජේ. එම්. එන්. ජයසිංහ,
ලේකම්,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 31 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ දී ය.

**නගර ශාලාව පාවිච්චි කිරීමේ ගාස්තු නියම කිරීම**

| | | *ඇප තැන්පත්* *රු. ශත* | *පළමු දින* *රු. ශත* | *දෙවැනි දින* *රු. ශත* | *තෙවැනි දින හෝ ඊට වැඩි දින ගණන සඳහා* *රු. ශත* |
|---|---|---|---|---|---|
| 01. | ව්‍යාපාරික අරමුණක් වශයෙන් දිනකට ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා චිත්‍රපට දර්ශනයක් සඳහා | 5,000.00 | 12,000.00 | 10,000.00 | 5,000.00 |
| 02. | ව්‍යාපාරික අරමුණක් වශයෙන් නොවන යම්කිසි ආගමික, අධ්‍යාපනික, ත්‍යාගශීලී, සංස්කෘතික හෝ පුණ්‍ය අරමුදලක් සඳහා ප්‍රසිද්ධ රඟ දැක්වීමක් පවතින බවට සභාපති/ලේකම් සෑහීමකට පත් වූ කල්හි එවැනි ප්‍රසිද්ධ රඟ දැක්වීමක් සඳහා | 5,000.00 | 11,000.00 | 9,000.00 | 4,000.00 |
| 03. | විවාහ මංගල්‍යයක් හෝ වෙනත් පුද්ගලික උත්සවයක් සඳහා | 5,000.00 | 18,000.00 | 15,000.00 | 10,000.00 |
| 04. | ව්‍යාපාරික අරමුණක් වශයෙන් සැලකෙන සල්පිලක් හෝ සැණකෙළියක් සඳහා | 5,000.00 | 15,000.00 | 14,000.00 | 10,000.00 |
| 05. | ප්‍රසිද්ධ රාත්‍රී භෝජනාගාරයක්, දිවා භෝජනයක් හෝ සහාභාගිවන්නන්ගෙන් ගාස්තු අය කර පවත්වනු ලබන වෙන යම් සංවිධාත්මක උත්සවක් සඳහා | 5,000.00 | 15,000.00 | 14,000.00 | 10,000.00 |

| | | ඇප තැන්පත් | පළමු දින | දෙවැනි දින | තෙවැනි දින හෝ ඊට වැඩි දින ගණන සඳහා |
|---|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 06. | නගර ශාලාව වෙන් කරගෙන පවත්වනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීමක්, පූර්ව දර්ශනයක් සඳහා | 5,000.00 | 15,000.00 | 14,000.00 | 10,000.00 |
| 07. | සාකච්ඡාවක්, රැස්වීමක්, දේශනයක් තෑගි බෙදා දීමේ හෝ ආගමික පුහුණු පන්ති සඳහා | 5,000.00 | 8,500.00 | 4,000.00 | 3,800.00 |
| 08. | ඉහතින් නිශ්චිතව සඳහන් කරනු නොලැබුවහොත් යම් ව්‍යාපාරික කාර්යයක් වශයෙන් පවත්වනු ලබන්නාවූත් කුමන අන්දමේ හෝ අරමුණක් සඳහා | 5,000.00 | 16,000.00 | 15,000.00 | 10,000.00 |

09-879

---

## කුරුණෑගල මහා නගර සභාව

### 2017 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද පැනවීම සඳහා

කුරුණෑගල මහා නගර සභාව විසින් 2015 අගෝස්තු මස 11 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී තීරණ අංක 2015.08.11 ම. ස. 5 (2) දරන අංක යටතේ සභා සම්මත කරන ලද යෝජනාවම 2017 වර්ෂයට අදාළ කරගත් බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ. 2017 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත පනවන ලද බද්ද ඒ වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු බවට වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ආර්. එම්. ඩබ්. එස්. සමරදිවාකර,
නාගරික කොමසාරිස්,
කුරුණෑගල මහා නගර සභාව.

2016 අගෝස්තු මස 29 වැනි දින,
කුරුණෑගල මහා නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

"252 වැනි අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 247 ඇ වැනි වගන්තිය අනුව මහා නගර සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුරුණෑගල මහා නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු වන විටක (කුඹුරු ඉඩම් හැර) හෝ යුක්තිසහගත වියදමකින් ඒ ඉඩම එකී යම් කාර්යයක් සඳහා සංවර්ධනය කළ හැකි විටක එවැනි යම් ඉඩමක.

*(අ)* ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්, හෝ

*(ආ)* ඒ ඉඩම (කුඹුරු ඉඩම් හැර) විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන් ම යට වී ඇති බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය 1:2ට (එකට දෙක) වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමටත් සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2017 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ ප්‍රාග්ධන අගයෙන් 0.5% (සියයට දශම පහක) වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2017 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර කුරුණෑගල මහා නගර සභාවට ගෙවිය යුතු යැයි විධාන කිරීමටත් කුරුණෑගල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්තුමා යෝජනා කරන්නේය."

09-735/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.